# දෙසතිය

පුවත් සඟරාව
2017 මාර්තු



## ලෝකයම එක මිටට

### සුහුරු තාක්ෂණය
### SMART TECHNOLOGY







තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත පෙබරවාරි මස 03 වැනි දා සිට ක්‍රියාත්මක වීම ඇරඹුණේ ශ්‍රී ලංකා පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය නිල වශයෙන් තහවුරු කරමින්. ඒ අනුව එය ක්‍රියාත්මක කිරීමට දිවයින පුරා පත් කරන ලද තොරතුරු නිලධාරීන් නොබෝදා (පෙබ. 17) අරලියගහ මන්දිරයේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා හමුවුණා. එහිදී ජනාධිපතිතුමා විසින් නිල වෙබ් අඩවිය ද විවෘත කළ අතර මේ එම හමුවේ විශේෂ අවස්ථා කිහිපයක්.



නොබෝදා (පෙබ. 14) ඕස්ට්‍රේලියාවේ ඩීකින් විශ්වවිද්‍යාලය මගින් ශ්‍රී ලංකා අගමැති රනිල් වික්‍රමසිංහ මහතා වෙත සම්මාන ආචාර්ය උපාධියක් පිරිනැමුණේ එම විශ්වවිද්‍යාලයේ පැවැති උපාධි ප්‍රදානෝත්සවයේදී. ඒ, එහි කුලපති මහාචාර්ය ජෝන් ස්ටැන්හෝප් මහතා අතින්. මීට පෙර එම සම්මාන ආචාර්ය උපාධිය පිරිනමා ඇත්තේ මැල්කම් ෆ්‍රේසර්, කෙනත් කවුන්ඩා සහ ජූලියා ගිලාඩ් යන විදේශ අග්‍රාමාත්‍යවරුන් වෙත.





# ලෝකයම එක මිටට

සුහුරු තාක්ෂණය

SMART TECHNOLOGY


30 කවරයේ කතාව



04 විශේෂ වාර්තාව

**අරගලවල මතක වත**

දහනව වැනි සියවසේ නිදහස් අරගල



22 දේශ විත්ති

**ස්වශක්ති**



20 ජීවිතයක පිය සටහන්

**දනන් හොබවන - රනිල්**



18 විදේශ විත්ති

**ලෝකෙට ලොක්කා කොයිබට යන්නේ**



52 සිනමාව

**ඩිජිටල්කරණය වන රිදී තිරය**

**දේශ විත්ති**

13 වයඹ ඇලේ කතන්දරේ

17 තුන්කල් දකින්නී සවියෙන් දිනන්නී

**විදේශ විත්ති**

25 සසිකලාට (පරා)ජය

**කෘෂිකර්මය**

40 සහල් මිලේ බාලගිරි අවසන් ද?

**කලා**

25 මේ තරම් සියුමැලිද කළුගල්


**නැණ සයුර**

45 හතුරු - මිතුරු වෙසින් එන අභියෝග

**සංගීතය**

50 තනි ස්වරයක මාධූර්යය

# පාඨක ප්‍රතිචාර




## පාඨක විශ්වාසය වැඩි වුණා

දෙසතිය ජනවාරි මස කලාපයේ පළ වූ "යහපාලනයට දෙවසරයි" දේශපාලන ලිපිය විග්‍රහාත්මක ව ලියැවී තිබීම සතුටට කරුණක්. 'දෙසතිය' රජයේ සඟරාවක් වුවත් සැබෑ දේශපාලන යථාර්ථය එහි කතාබහට ලක්කර තිබීම අගය කළ යුතුයි. උගතුන්, බුද්ධිමතුන් මෙන් ම සිවිල් සංවිධානවල එම අදහස් දැක්වීම් මෙලෙස ඉදිරිපත් කිරීම නිසා දෙසතිය සඟරාව කෙරෙහි පාඨක අපගේ විශ්වාසය තව තවත් ගොඩනැඟුණු බව නම් නොකියාම බැහැ

**නිමල් කුමාර**
කුරුණෑගල

## කාලීන බව ඉතා වැදගත්

පුවත් සඟරාවක් ලෙස "දෙසතිය" සඟරා අතර ඉතා වැදගත් වන්නේ එහි කාලීන මාතෘකා පිළිබඳ සංවාද ගොඩනැඟීම නිසා බවයි මගේ හැඟීම. වර්තමානයේ කතාබහට ලක් වී ඇති ආර්ථික, සමාජීය, දේශපාලන මෙන් ම ආගමික කාරණා පිළිබඳ මෙහිදී අවධානය යොමු වී ඇති නිසා අපගේ දැනුවත් වීමට එය වැදගත්. උදාහරණයක් ලෙස තෛපොංගල් සමරන දිනයක් යෙදී තිබුණ ද එහි වැදගත්කම මෙන් ම එය සමරන ආකාරය පිළිබඳවත් අප මීට පෙර නිසි ලෙස දැනුවත් ව සිටියේ නැහැ. එහෙත් "කෘතගුණ අබිමන් සලකන පොංගල්" යන ලිපියෙන් මේ පිළිබඳ ව මැනවින් විග්‍රහ කර තිබීම නිසා අපගේ දැනුවත්භාවය වැඩි කර ගැනීමට හැකි වුණා.

**තුෂාර සෙනරත්**
කළුතර

## පාසල් දරුවන්ගේ අවධානය යොමු විය යුතු ලිපියක්

"කොලමක් නොවුණු කොලමක්" හොස්ටල් කොලම යන ශීර්ෂය යටතේ ලියැවී ඇති ලිපිය හරවත් මෙන් ම රසවත් බව කිව යුතු යි. වර්තමානයේ පාසල් දරුවන්ගෙන් ගිලිහී යන ඔවුන්ගේ ළමා විය පිළිබඳ සිතා බලන්නට එමඟින් අප පොළඹවනවා. එසේ ම වර්තමාන පාසල් අධ්‍යාපනයේ ගොඩනැගෙමින් පවතින භේදවාදකයට හේතු විග්‍රහ කර බැලීමටත් මේ ලිපිය මඟ පෙන්වනවා. ඒ නිසා පාසල් දරුවන්ගේ අවධානය විශේෂයෙන් යොමු විය යුතු ලිපියක් ලෙසයි මා මෙය දකින්නේ.

**ඒ. ආර්. පී. ගමගේ**
මාතර

## ඉගෙනුමට අත්වැලක්

ආර්ථික, සමාජ, දේශපාලන, සමය, භාෂාව, කලාව යන සියලු ක්ෂේත්‍ර සම්බන්ධ ව දෙසතිය සඟරාවේ ලිපි පළ වන නිසා දැනුම සොයා යන අප වැනි පාසල් සිසුන්ට දැනුම රැස් කිරීමට මෙය වටිනා අත්වැලක් සපයනවා. විභාග මත පදනම් වන තරගකාරී අධ්‍යාපනයට 'දෙසතිය' ළඟ තබා ගත යුතු අතිරේක කියවීම් පොතක් ලෙස නම් කිරීමට මා කැමති යි.

**හිමාශි පෙරේරා**
ගම්පහ

## 'හින්දි' භාෂාව ඉගෙනීමේ ආසාව වැඩි වුණා

ජනවාරි 'දෙසතිය' කලාපයේ පළ වූ "ලොව පුරා ගලා යන භාරතයේ මහා නදිය හින්දි" යන ලිපිය කිය වූ මාහට එම භාෂාව හදාරන්නට සිතුණා. විශ්ව භාෂාවක් ලෙස සැලකෙන එම භාෂාවේ වැදගත්කම මෙන් ම ලංකාවේ හින්දි භාෂාවට හිමි තැන මේ ලිපියෙන් පැහැදිලි කර තිබීම නිසා එය කියවන ඕනෑම පාඨකයකුට එවැනි අදහසක් පහළ වනු ඇතැයි මා විශ්වාස කරනවා.

**කුමාරි තිලකරත්න**
මහනුවර

---

දෙසතිය සඟරා දායකත්වය

දෙසතිය

දෙසතිය සඟරා දායකත්ව වාර්ෂික / අර්ධ වාර්ෂික ලබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු.768.00/ රු.384.00 / රු. 192.00 මුදල ........................ අංක හා ........................ දින දරන චෙක්පත/ මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් " ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් " නමට ලියා, ගෙවන කාර්යාලය පොල්හේන්ගොඩ, උප තැපැල් කාර්යාලය, කොළඹ 05 ලෙස සඳහන් කළ යුතුය. එවිය යුතු ලිපිනය:
දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, පොල්හේන්ගොඩ,
කොළඹ 05.

සඟරා ලැබිය යුතු ලිපිනය :
නම : ........................
ලිපිනය : ........................
........................
........................
........................
ඔබගේ දුරකතන අංකය : ........................

## දෙසතිය

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
**163, කිරුළපන ඇවනිව්,**
**පොල්හේන්ගොඩ, කොළඹ 05**
**සංස්කාරක මණ්ඩලය**
**දු. අ. 011 - 2513757**
**බෙදාහැරීමේ අංශය**
**දු. අ.011 - 2515759/ දිගුව - 232**

**වෙළුම 40, කළාපය 03**
**2017 මාර්තු**

උපදේශක සංස්කාරක
ආචාර්ය රංග කලංසූරිය

සංස්කාරක
සුමිත් මායාදුන්නේ

නියෝජ්‍ය සංස්කාරක
ආනන්ද ජයසිංහ

සහකාර සංස්කාරකවරුන්
ඩොනල්ඩ් සේනාධීර
නිලුපුල් ප්‍රියංකර පෙරේරා

සංස්කරණ සහාය
ධර්මදාස ගමගේ

රූ රටා හා ඡායාරූප සංස්කාරක
කවර නිර්මාණය හා සංකල්පය
සංජීව පෙන්නාවඩු

විශේෂාංග ලේඛකයෝ
චමිමි ජයනෙත්ති
ශ්‍යාමා සන්ධ්‍යානායකගේ
පී. ජී. මාලා මල්කාන්ති
සංජීව පෙන්නාවඩු
චාමලී රාජකරුණා

ප්‍රවෘත්ති නිලධාරී
නිල්මිණි ප්‍රනාන්දු

සෝදුපත් නිරවද්‍යතා විමසුම
ඩොනල්ඩ් සේනාධීර
පී. ජී. මාලා මල්කාන්ති

කළමනාකරණ සහාය
චන්ද්‍රිකා ගුණසේකර

ඡායාරූප උපදේශක
සුදත් සිල්වා

ඡායාරූප ශිල්පීන්
සරත් ධර්මසිරි
පී. ඩී. රංජිත්
එල්. රෝහණ
යමුනි රශ්මිකා
ලක්සිරි සුභාෂණ අල්විස්

බෙදාහැරීමේ කළමනාකරු
ලාල් සූරියආරච්චි

මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

බෙදාහැරීම
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

# සුහුරු ජීවිත

බාහිර ලෝකය සමඟ කර ගත යුතු එදිනෙදා ජීවිතයේ සියලු කටයුතු, රස්තියාදුවලින් සහ ගමන් බිමන්වලින් තොර ව, තමන් සිටින තැන සිට ම, ක්ෂණයකින් කර ගත හැකි මට්ටමට යි, වත්මන් ජන ජීවිත ගොඩනැගී තිබෙන්නේ. ඒ විස්කම අත් කර දෙනු ලබන්නේ පරිගණක, විද්‍යුත් හා ඩිජිටල් සන්නිවේදන තාක්ෂණයේ නව නිර්මාණ භාවිතය විසින්. මේ වන විට එය හැඳින්වෙන්නේ "සුහුරු තාක්ෂණය" නමින්.

වඩාත් පහසුවෙන් පමණක් නො ව වඩාත් නිවැරැදි ව ද යමක් කර ගැනීමට හැකි වීම සුහුරු තාක්ෂණය භාවිතයේ තවත් අතිශය වැදගත් ප්‍රතිලාභයක්.

මේ වන විට මිනිසා වර්ධනය වී ඇත්තේ ජංගම සුහුරු මිනිසකු බවට. සුහුරු ජංගම පරිගණක සහ සුහුරු ජංගම දුරකතන ඒ "ජයග්‍රහණ" අත් කර දුන් නවීන විද්‍යුත් මෙවලම්. මේ මෙවලම්වල මහිමයෙන් එසැණින් තමන් වෙත විවෘත කර ගත හැක්කේ මුළු ලොව ම.

රාජ්‍ය හා පෞද්ගලික දෙ අංශයේ ම ආයතනික කටයුතු කාර්යක්ෂම ව සහ සැණෙකින් මෙන් ම අරපිරිමැසුම් සහිත ව කර ගැනීමෙහි ලා සුහුරු තාක්ෂණය පත් ව ඇත්තේ ඉටු දෙවියකු බවට. සුහුරු තාක්ෂණය වැළඳ නො ගෙන සිටීමට කිසි රටකට නොහැකි වී ඇත්තේ මේ නිසා.

මේ වාතාවරණය අනුව රටක සිදු විය යුතු ප්‍රධාන වෙනස්කමක් වන්නේ අනාගත සුහුරු මිනිසකු තැනීම සඳහා රටේ අධ්‍යාපනය ඒ වෙනුවෙන් සවිබල ගැන්වීම. ශ්‍රී ලංකා ආණ්ඩුව මේ වන විට ඒ වෙනුවෙන් පියවර ගනිමින් සිටීම අගය කළ යුත්තක්.

කුමන යහපත් දෙයක් වුව ද විනාශකාරී ලෙස භාවිත කිරීමට යොමු වීම ද සමාජගත පොදු ලක්ෂණයක්. ඒ නිසා අපේ අනාගත පරපුර වන පාසල් දරු දැරියන් වෙත සුහුරු තාක්ෂණය සමීප කරන අතර ම අධ්‍යාපන බලධාරීන්ගේ අවධානය යොමු විය යුත්තක් වන්නේ එය අවභාවිතයට යොදවා ගැනීමට ඇති ඉඩකඩ ඇහිරීමේ ක්‍රමවේද ද ස්ථාපිත කිරීමට. සුහුරු තාක්ෂණය පිළිබඳ උතුම් අපේක්ෂා සැබැවින් ම මල් පල ගැන්වෙනු ඇත්තේ එවිට.

සංස්කාරක

# අරගලවල මතක වත

## දහනව වැනි සියවසේ නිදහස් අරගල



මහාචාර්ය
**කේ. එන්. ඕ. ධර්මදාස**

**ව්‍යවහාර** වර්ෂ 1815 දී සමස්ත ශ්‍රී ලංකාව ම බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් බවට පත් විය. බ්‍රිතාන්‍යයන්ට පෙර පෘතුගීසීන් හා ලන්දේසීන් ලක්දිව මුහුදුබඩ පළාත් තමන් සතු කරගෙන සිටිමින් ඒ වන විට දිවයින තුළ තිබූ එක ම ස්වාධීන රාජ්‍යය වූ කන්ද උඩරට සිංහලේ රාජ්‍යය තමන් සතු කර ගැනීමට වසර තුන් සියයකට වැඩි කාලයක් වෑයම් කළ මුත් ඔවුන්ගේ එම වෑයම අසාර්ථක විය. විටෙක එම යුරෝපීය හමුදාවෝ උඩරට ආක්‍රමණය කොට එහි අගනුවර වූ සෙංකඩගල පුරවරය සියතට ගත්හ. එහෙත් ඒ දින කිහිපයකට පමණි. හාත්පසින් පැමිණි සිංහල ප්‍රහාර හමුවේ යළි මුහුදුබඩට පසුබැස යාමට ඔවුන්ට සිදු විණි. සිංහල රාජ්‍යයේ මේ ප්‍රතිරෝධ ශක්තිය ලෝකයේ යටත්විජිතවාදී ව්‍යාප්ති අවස්ථා හා සසඳන කල සුවිශේෂ ස්ථානයක් දරන්නේ ය. ලතින් අමෙරිකාවේ, අප්‍රිකාවේ මෙන් ම ආසියාවේත් ස්වදේශික රාජ්‍යයන් වසර කීපයක යුද මෙහෙයුම්වලින් පසු ව යටත් කර ගැනීමට යුරෝපීය ආක්‍රමණිකයන්ට හැකි වූ නමුත් කන්ද උඩරට සිංහල රාජ්‍යය එසේ පහසුවෙන් යටපත් කර ගත හැකි වූයේ නැත. ප්‍රබල ඉංග්‍රීසි හමුදාවක් 1803 දී මහනුවර රාජ්‍යය ආක්‍රමණය කොට මහනුවර නගරය ද තමා සතු කරගත් නමුත් පෙර දවස සිදු වූ අයුරින්ම බොහෝ පාඩු විඳිමින් පසුබැස යාමට ඔවුන්ට සිදු විණි. යුද බලයෙන් අල්ලා ගත නොහැකි වූ සිංහලේ රාජ්‍යය 1815 දී කුමන්ත්‍රණ මඟින් අත්පත් කර ගැනීමට බ්‍රිතාන්‍යයෝ සමත් වූහ.



**ශ්‍රී වික්‍රම රාජසිංහ (1798 - 1815) රජුගේ පෞද්ගලික දුර්වලතා ද තිබුණි. නගර අලංකරණය සඳහා වැවක් තැනවීම, පත්තිරිප්පුව ගොඩනැංවීම වැනි දුෂ්කර කාර්යයන් සඳහා ජනතාවගේ රාජකාරිය දිගින්දිගට ලබාගැනීම, විවිධ හේතු මත රදළ ජනනායකයන්ගේ අප්‍රසාදයටත් ඇතැම්විට වෛරයටත් පාත්‍ර වීම ඇතුළු හේතු අර්බුද තත්ත්වයට පත් කිරීමට බ්‍රිතාන්‍යයන් අතර සිටි සිංහල උගත් ජෝන් ඩොයිලි වැනි ශූර නිලධාරීන් යොදාගත් ඔත්තුකරුවන් ක්‍රියාවේ යොදවමින් රජුට එරෙහි ව ජනමතයක් ගොඩ නැංවීමට ප්‍රචාර සිදු කිරීම ආදිය නිසා රජුට එරෙහි ව්‍යාපාරය සාර්ථක විය.**

ශ්‍රී වික්‍රම රාජසිංහ (1798 - 1815) රජුගේ පෞද්ගලික දුර්වලතා ද තිබුණි. නගර අලංකරණය සඳහා වැවක් තැනවීම, පත්තිරිප්පුව ගොඩනැංවීම වැනි දුෂ්කර කාර්යයන් සඳහා ජනතාවගේ රාජකාරිය දිගින්දිගට ලබාගැනීම, විවිධ හේතු මත රදළ ජනනායකයන්ගේ අප්‍රසාදයටත් ඇතැම්විට වෛරයටත් පාත්‍ර වීම ඇතුළු හේතු අර්බුද තත්ත්වයට පත් කිරීමට බ්‍රිතාන්‍යයන් අතර සිටි සිංහල උගත් ජෝන් ඩොයිලි වැනි ශූර නිලධාරීන් යොදාගත් ඔත්තුකරුවන් ක්‍රියාවේ යොදවමින් රජුට එරෙහි ව ජනමතයක් ගොඩ නැංවීමට ප්‍රචාර සිදු කිරීම ආදිය නිසා රජුට එරෙහි ව්‍යාපාරය සාර්ථක විය. ඇහැලේපොළ, මොල්ලිගොඩ වැනි ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් තමන් වෙත නම්මා ගැනීමට ද බ්‍රිතාන්‍යයෝ සමත් වූහ. අවසානයේ බ්‍රිතාන්‍යයන් කන්ද උඩරට ආක්‍රමණය කරන විට රජු තනි වී සිටි අතර රටේ ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් වූ නිලමේවරු ඔහුට එරෙහි ව බ්‍රිතාන්‍යයන්ගේ පක්ෂය ගෙන සිටියහ.

උඩරට ප්‍රධාන රදළවරුන් එක් පසෙකටත් බ්‍රිතාන්‍ය රජය නියෝජනය කරමින් ආණ්ඩුකාරවරයාත් අතර සිදු වූ සම්මුතිය අනුව 1815 උඩරට ගිවිසුම අත්සන් කැරුණි. එහි වැදගත්ම වගන්තිය වූයේ බුදු සමයත් ශාසනයත් ආරක්ෂා කිරීමට ප්‍රතිඥා දෙන පස්වැනි වගන්තිය යි. වර්ෂ 1815 මාර්තු මසදී ශ්‍රී වික්‍රම රාජසිංහ රජු බ්‍රිතාන්‍යයන්ගේ සිරකරුවකු වී යථෝක්ත උඩරට ගිවිසුම මගින් සිංහලේ රාජ්‍යය පවරා දීමත් හා සමඟ කන්ද උඩරට රාජ්‍යය බ්‍රිතාන්‍යයන් සතු විය.

උඩරට ගිවිසුමට අත්සන් කළ පමණින් තමන් අපේක්ෂා කළ පරිදි ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගෙන් තොරව නිලමේවරුන්ගේ වරප්‍රසාදත් පෙර පරිදි ම ආරක්ෂා වන, පුරාණ චාරිත්‍ර වාරිත්‍ර ද චිරාගත පරිදි සුරැකෙන පාලන තන්ත්‍රයක් බිහි වේ යැයි රදළ ප්‍රධානීන් අපේක්ෂා කළ මුත් බ්‍රිතාන්‍යයෝ තමන් කරන්නට යන දේ මනාව දැන සිටියහ. බ්‍රිතාන්‍ය ජාතික ධජය එදා මගුල් මඩුවේ ඔසවා තමන් යටත් විජිතයක් අත්පත් කරගත් බව ප්‍රකාශ කිරීමට ඔවුන් උත්සුක වූයේ එබැවිනි. වාරියපොල සුමංගල හිමියන් ඊට එරෙහි වූ නමුත් එය හුදෙක් සංකේතමය සිද්ධියක් පමණක් විය. බ්‍රිතාන්‍ය පාලනය උඩරට ප්‍රදේශ ග්‍රහණය කරගන්නාටත් නිලමේවරුන්ට ප්‍රමුඛස්ථානය නාමික ව ලැබුණු නමුත් බ්‍රිතාන්‍යයන්ට අවශ්‍ය පරිදි පරිපාලන කටයුතු මෙහෙය වීමත් සිදු වෙමින් පැවතුණි. තමන් විශාල රැවටිල්ලකට ගොදුරු වූ බව වැඩි කල් නොගොස් රදළ ප්‍රධානීන්ට වැටහී ගියේ ය.

## ඌවේ නිදහස් අරගලය

කන්ද උඩරට ප්‍රදේශයන්හි දේශපාලන දැනුම් තේරුම් ඇතිව සිටි පිරිස වූ රදළ පෙළැන්තියේ උදවිය අතර පැන නැගී තිබුණු අසහනය බ්‍රිතාන්‍ය විරෝධී නැගී සිටීමක් ලෙස පැන නැගුණේ ඌව ප්‍රදේශයේය. මීට හේතුව චිරාගත සම්ප්‍රදාය බිඳ දමමින් සිංහල නොවන අයකු මඩිගේ මුහන්දිරම් තනතුරට එනම්, උඩරටට පහතරටින් ලුණු ආදී භාණ්ඩ ප්‍රවාහනය කරන කරත්ත සමුදාය පරිපාලනය කරන නිලධාරියා ලෙස බ්‍රිතාන්‍යයන් විසින් මුස්ලිම් ජාතිකයකු පත් කරනු ලැබීම ය. මේ සිද්ධියෙන් පසු එතෙක් උඩරට රදළ ප්‍රධානීන් වෙත මුස්ලිම්වරුන් දැක් වූ ගරුසරුකම් හා ගෙවූ බදු ආදිය නැවතුණි.

චිරාගත ව භික්ෂූන් වහන්සේලා කෙරෙහි දක්වන ලද ගෞරවයත් දළදා මාළිගාව වැනි පූජනීය ස්ථානයන්ට හිමිව තිබූ පූද පූජාමය ගෞරවයත් රට පාලනය කළ ඉංග්‍රීසින්ගෙන් ලැබුණේ නැත. මෙය භික්ෂූන් වහන්සේලාගේ මෙන් ම සාමාන්‍ය ජනතාවගේ කළකිරීමට හේතු විය.

ජනතාව අතර කැකෑරෙමින් පැවති ඉංග්‍රීසි විරෝධය සඳහා උත්තේජනයක් සපයමින් 1817 ජූලි මස කතරගම දේවාලයේ වාර්ෂික මංගල්‍යය අවධියේ උඩරට ක්ෂත්‍රිය පෙළපතින්



සිංහලයේ අවසන් රජු
ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (1798 - 1815)

පැවත එන්නකු ලෙස පෙනී සිටි දොරේසාමි නමැත්තා ඉදිරියට පැමිණියේය. ඔහු වටා වැදිජන පිරිසක් මෙන් ම කොහුකුඹුරේ රටේ රාළ, කිවිලෙගෙදර මොහොට්ටාල ආදී වූ ප්‍රාදේශීය ජන ප්‍රධානීහු ද රැස්වූයෙන් ඌවේ නිදහස් අරගලය ආරම්භ විය. විමුක්ති සටන උත්සන්න වීමට ප්‍රබල හේතුවක් වූයේ බ්‍රිතාන්‍යයන් යටතේ ඌව මහදිසාපති පදවිය දැරූ කැප්පෙටිපොළ නිලමේ විමුක්ති අරගලයට එකතු වීම යි. දොරේසාමිගේ අභිෂේක මංගල්‍යය ද පැවැත්වුණු අතර කැප්පෙටිපොළ නිලමේ මහඅදිකාරම් පදවියට පත් කරන ලදී. ඒ අතර ඌවේ රජයේ ඒජන්ත පදවිය දැරූ විල්සන් කැරැල්ල මැඩ පැවැත්වීමට ගිය අවස්ථාවේ විමුක්ති භටයන් අතින් මරණයට පත්විය. තත්ත්වය උත්සන්න වීම නිසා කැප්පෙටිපොළ, මඩුගල්ලේ ඇතුළු ප්‍රධානීන් රාජද්‍රෝහීන් ලෙස නම් කොට ඔවුන් අල්ලා ගැනීමට සහාය දෙන්නන්ට විශාල ත්‍යාග මුදල් ලබාදෙන බව ප්‍රකාශ කැරුණි. මුහුදුබඩ පළාත්වල සිටි භටයන් පමණක් නොව ඉන්දියාවෙන් ද අතිරේක හමුදා ගෙන්වා අරගලය මැඩ පැවැත්වීමට විධිවිධාන යොදන ලදී. 1818 පෙබරවාරි 21 වැනි දින යුද නීතිය ප්‍රකාශ කරන ලද අතර සටන කෙතරම් උත්සන්න විද යත් උඩරට ප්‍රදේශ අතහැර දැමීමට සිදුවෙතැයි යන සැකය ද ආණ්ඩුකාර බ්‍රවුන්රිග් තුළ පැන නැගුණු බව වාර්තා වී තිබේ. සටන අසාර්ථක වීමට හේතුවක් වූයේ සිංහලයන්ගේ අසමගිය යි. මොල්ලිගොඩ නිලමේ ඇතුළු රදළ පිරිසක් ඉංග්‍රීසි ආණ්ඩුවට පක්ෂපාතී ව හිඳිමින්

තුන්කෝරළ, සතර කෝරළය, උඩුනුවර, යටිනුවර හා සබරගමුවේ කොටසක තමා සතු බලපෑම් යොදා ඉංග්‍රීසින් ආණ්ඩුවේ පක්ෂපාතී වැසියන් ලෙස ජනතාව පාලනය කරගෙන සිටියහ. එහෙත් විමුක්ති සටනට පක්ෂපාතී වූ භික්ෂූන් වහන්සේලා විසින් දළදා වහන්සේ සඟවාගෙන ගොස් තම රජුට භාරදෙන ලදී.

මේ අතර බ්‍රිතාන්‍ය යුද භටයන් විසින් නිර්දය ලෙස "බිම් පාලු" ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ඌවේ ගෙවල් දොරවල්, භාරකබාන, අටු කොටු විනාශ කළා පමණක් නොව ඵලදාව දෙන පොල්, කොස් යනාදී ගහකොළ කපා දමා මුළු ජනජීවිතයම අඩාල කරන ලදී. මේ අතරතුර රාජ ප්‍රතිරූපකයා ලෙස සිටි "දොරේසාමි" යනු කුරුණෑගල දිස්ත්‍රික්කයේ විල්බාව ගමේ සිටි සිවුරු හළ පුද්ගලයකු බව හෙළිදරව්වීම නිසා කැප්පෙටිපොළ, මඩුගල්ලේ ඇතුළු සටන් නියමුවෝ දුර්මුඛ වූහ. විමුක්ති අරගලය දුබලවත්ම 1818 නොවැම්බර් මස වන විට දන්ත ධාතූන් වහන්සේ නමන් සතුකර ගැනීමට බ්‍රිතාන්‍ය හමුදා සමත්වීම ඔවුන් ලද විශාල ජයග්‍රහණයක් විය. බ්‍රිතාන්‍ය හමුදාවන් විසින් යටත් වන ලෙස විමුක්ති අරගලයට සම්බන්ධ වූවන්ට කරන ලද ප්‍රකාශනය ප්‍රකාර සටන අතහැර ඔවුන් වෙත භාර වන පිරිස් වැඩි විය. නුවර කලාවියට පලාගොස් සිටි කැප්පෙටිපොළ හා මඩුගල්ලේ සිරභාරයට ගැනීමෙන් පසු සටන අවසන් විය. යුද්ධාධිකරණය නඩු අසා කැප්පෙටිපොළ හා මඩුගල්ලේ දෙදෙනා හිස් ගසා මරණයට පත් කිරීමට ද තවත් 25 දෙනකු රටින් පිටුවහල් කිරීමට ද තීරණය කෙළේය. තවමත් සැඟවී සිටි කිවුලෙගෙදර ද ඔත්තුකරුවන්ගේ උදව්වෙන් අල්ලාගෙන නඩු අසා හිස් ගැසුම්කෑමට ලක් කරන ලදී. දඬුවම් ලැබූ සියලු දෙනාගේ දේපොළ රාජසන්තක කැරුණි. ඉංග්‍රීසින්ට පක්ෂපාතී වූ මොල්ලිගොඩ ඇතුළු පිරිසට විශේෂ වරප්‍රසාද ද හිමි විය.

## බ්‍රිතාන්‍ය පාලනය

1818 විමුක්ති අරගලය ව්‍යර්ථවීම නිසා බ්‍රිතාන්‍යයන් සිංහලේ රාජ්‍යය කෙරේ දැක් වූ ආකල්පය වෙනස් විය. 1815 ගිවිසුම අනුව නොව තමන් විසින් "යටත් කරගත්" ප්‍රදේශයක් ලෙස උඩරට ප්‍රදේශ ඉන් පසු ව සලකන ලදී. ඉංග්‍රීසි රජයේ නිල පත්වීම් හැර වෙන කිසි ම චිරාගත පදවි තානාන්තර මේ ප්‍රදේශවල නැති බව කියන ලද අතර නිලමෙවරුන් ඇතුළු පැරැණි සැලැස්ම තුළ සිටි සාම්ප්‍රදායික ප්‍රධානීන් ඉංග්‍රීසි රජයෙන් වේතන ලබන නිලධාරීන් බවට පත් කරන ලදී. කෙසේ වුවත් පරිපාලන කටයුතු සම්පූර්ණයෙන් ම ඉංග්‍රීසි නිලධාරීන්ගේ අතට පත්විය. බුදු සමය ආරක්ෂා කිරීම සඳහා උඩරට ගිවිසුමේ තිබුණු 5 වැනි වගන්තිය 1818 ප්‍රකාශනය මඟින් නොසලකා හැරිය බ්‍රිතාන්‍යයෝ ඉන් පසු ක්‍රිස්තු ලබ්ධිය උඩරට ප්‍රදේශවලද ව්‍යාප්ත කිරීමට ආධාර හා අනුබල දුන්හ.

ඉංග්‍රීසි පාලනයට එරෙහි ව නැඟී සිටීමේ ප්‍රයත්න 1820, 1823 වර්ෂවල සිදු වූ නමුත් ඉන් සැලෙන බලපෑමක් සිදු



වූයේ නැත. වඩා බරපතළ සිද්ධිය වූයේ 1834 වර්ෂයේදී ඒ වන විට බ්‍රිතාන්‍යයන්ගේ ඉමහත් ප්‍රසාදයට පත්ව සිටි මොල්ලිගොඩ නිලමේගේ කුමන්ත්‍රණය ය. ඔහුගේ සැලැස්ම වූයේ ආණ්ඩුකාරයා ඇතුළු ඉංග්‍රීසි පාලනයේ ප්‍රධානීන් භෝජන සංග්‍රහයකට කැඳවා ඔවුන් වස දී මරා දැමීම ය. මේ ඉංග්‍රීසි විරෝධී කුමන්ත්‍රණයට හේතුව බුදු සමයට සිදු වන හානිය හා ඉංග්‍රීසින් රාජකාරි ක්‍රමය යළි පිහිටුවා ජනතාව පෙළන්නට යන බව දැනගන්නට ලැබීම ය. කුමන්ත්‍රණය හෙළිදරව් වී මොල්ලිගොඩ ඇතුළු 100 දෙනකු නඩු විභාගයකට ඉදිරිපත් කැරුණි. එහෙත් ජූරි සභාවේ සිටි ලාංකිකයන් පිරිස විසින් චූදිතයන් නිවැරදිකරුවන් ලෙස තීරණය කිරීම නිසා ඔවුන්ට දඬුවම් කළ නොහැකි විය. එහෙත් ඔවුන් සතුව තිබූ වරප්‍රසාද ඔවුන්ට හිමිකරන ලදී. යළිත් 1842 - 43 කාලයේ දුම්බර ප්‍රදේශයෙන් ඇරඹුණු කැරැල්ලක් ද මැඩ පැවැත්වීමට ඉංග්‍රීසි ආණ්ඩුව සමත් විය.


## 1848 විමුක්ති අරගලය

උඩරට මහ කැරැල්ල වශයෙන් ඉතිහාසඥයන් හඳුන්වන 1817 - 18 විමුක්ති අරගලය නිර්දය ලෙස මැඩ පැවැත්වීමට බ්‍රිතාන්‍ය පාලකයන් සමත් වුව ද ජනතාව අතර තිබුණු පරිපාලන විරෝධී හැඟීම් මකා දැමීමට ඔවුන්ට හැකි වූයේ නැත. උඩරට පලාත්වල විටින් විට පැන නැඟුණු ආණ්ඩු විරෝධී ක්‍රියා ඊට දෙස් දෙයි. බ්‍රිතාන්‍ය පාලනය සොලවාලීමට සමත් වූ ඊළඟ ජන නැඟිටීම සිදු වූයේ 1848 දී ය. එය ලක්දිව බ්‍රිතාන්‍ය පාලනයට එරෙහි ව පැන නැඟුණු අවසාන සන්නද්ධ අරගලය ලෙස ද නම් කළ හැකි ය.

1848 නැඟී සිටීමට හේතු වූ කාරණා රාශියක් තිබුණි. පළමු ව 1817 - 18 කාලයේ පැන නැඟී තිබුණු විදේශීය පාලනය නොරිස්සීම අලුයම ගිනිපුපුරු මෙන් තවමත් තැන් තැන්වල තිබුණි. විටින් විට බ්‍රිතාන්‍ය විරෝධී ව්‍යාපාර පැන නැඟුණේ එබැවිනි.

මීට අමතර ව 1818 දී බ්‍රිතාන්‍යයන් තමන්ට එරෙහි ව පැනනැඟුණු අරගලය බිහිසුණු ලෙස මැඩපැවැත්වීමෙන් පසුව තමන් යටත් කරගත් ප්‍රදේශයක් ලෙස (එනම්, ගිවිසුම් ප්‍රකාර පවරාගත් ප්‍රදේශයක් නොව) පාලනය කරන්නට උත්සුක වූයෙන් සිංහල ජනයාගේ බ්‍රිතාන්‍ය විරෝධය තව තව නැඟ ඒමට එය හේතුවක් විය. මීට අමතර ව 1818න් පසුව හා විශේෂයෙන් 1832 කෝල්බෲක් කොමිසමේ නිර්දේශ අනුව ස්ථාපිත වූ බ්‍රිතාන්‍යයන්ගේ සෘජු පාලනය යටතේ ප්‍රාදේශීය බලතල දරා සිටි සුදු නිලධාරීන්ට දේශීය හැඟීම් ගැන කිසිදු අවබෝධයක් නොතිබීමත්, ඒවා ගැන තැකීමට වුවමනාවක් වත් නොතිබීමත් නිසා පොදු ජනතාවට කිසිදු සහනයක් මේ ආණ්ඩුව යටතේ ලැබුණේ නැත. වතු සමාගම්වල අවශ්‍යතා සපුරාලීම සඳහා 1840 මුඩුබිම් පනත මඟින් මෙන් ම හේන් ගොවිතැන සඳහා ගම්බද ජනයා භාවිත කළ ඉඩම්වල අයිතිය රජය පවරා ගත්තෙන් ග්‍රාමීය ජනතාවට මහත් අසීරුතා රැසක් ඇති වූ අතර විහාර හා දේවාලවල කටයුතුවලට ද බාධා පැමිණියේ ය. පෞරාණික චාරිත්‍ර අනුව වැව් හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණය නොවීම නිසා ගොවිතැන් කටයුතු ද අඩාල වුණි. ක්‍රිස්තියානි ආගමික අධිකාරීන් බ්‍රිතාන්‍ය රජය මඟින් කළ බලපෑම් නිසා ලක්දිව ආණ්ඩුකාරයා 1815න් පසු බුදු සමයට දැක්වූ ඇතැම් අනුග්‍රහයන් නතර කොට දැමූයෙන් බුදු සමයේ චිර පැවැත්මට හානිකර තත්ත්වයක් උදාවිය. මෙවැනි ප්‍රශ්න තිබෙන අතර රජයේ ආදායම් මාර්ග වැඩිදියුණු කරනු පිණිස නව බදු ක්‍රම හඳුන්වා දීම තත්ත්වය වඩා උග්‍ර බවට පත් කෙළේය. බෝට්ටු, කරත්ත, ගිනි අවි, සාප්පු, බලු, ඇඟ ආදී බදු රාශියක් අගහිඟකමින් පීඩිත ජනතාව මත පැටවුණි.

මේ තත්ත්වයට එරෙහි ව ඇතැම් යුරෝපීයයෝ, විශේෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදී අදහස් දැරූ කලම්බු ඔබ්සර්වර් පුවත්පතේ කතුවරයා වැනි අය, පෙත්සම් ඉදිරිපත් කරමින් ද, සිංහල මාධ්‍යයෙන් ජනතාව දැනුවත් කරමින් ද රජයට විරෝධය පාන්නට වූහ.


මහනුවර මඟුල් මඩුවේදී උඩරට ගිවිසුමට අත්සන් තබමින්

සන්නද්ධ නැගිටීමේ ආරම්භය සාමකාමී උද්ඝෝෂණ ලෙස 1848 ජූලි මහනුවරදී ද ජූලි 27 කුරුණෑගලදී ද 28 වැනි දින කොළඹ බොරැල්ලේ ද සිදු විය. මේ අතරතුර ගෝංගාලේගොඩ බණ්ඩා නමැත්තකු දඹුල්ලේදී සිංහලේ නවරජු වශයෙන් ජූලි 20 වැනි දින ඔටුනු පළඳවන ලදී. මේ ව්‍යාපාරයට කඩහපොළ හිමි, හඟුරන්කෙත ඩිංගිරාළ, පුරන් අප්පු නමින් සිටි මොරටුවේ ෆ්‍රැන්සිස්කු ප්‍රනාන්දු ප්‍රමුඛ පිරිස ප්‍රධානත්වය දුන්හ. ගෝංගාලේගොඩ බණ්ඩා ලෙස පෙනී සිටියේ පැලියගොඩින් පැමිණි ඩේවිඩ් නමැත්තෙකි. 1818 අරගලය හා සසඳන විට මෙහි විශේෂ ලක්ෂණය වන්නේ ලක්දිව පහතරට ප්‍රදේශවලින් පැමිණියවුන් ද උඩරට වැසියන් හා සමඟ අරගලයට එක් වීම ය.

ගෝංගාලේගොඩ බණ්ඩා ප්‍රමුඛ පිරිස දඹුල්ලේ සිට මහනුවරට මාතලේ හරහා පැමිණෙමින් රජයේ කාර්යාල හා දේපළ විනාශ කරමින් රජයට මහත් අභියෝගයක් එල්ල කළහ. කුරුණෑගල ද එබඳු ප්‍රචණ්ඩ ක්‍රියා රජයට එරෙහි ව සිදු කරන ලදී. එහෙත් බ්‍රිතාන්‍යයන් සතුව තිබූ යුද ශක්තිය හමුවේ පසුබැස යාමට විමුක්තිකාමීන්ට සිදුවුණි. ජූලි මස අගවන විට ගෝංගාලේගොඩ බණ්ඩා, පුරන් අප්පු, ඩිංගිරාළ ප්‍රමුඛ සටන් නායකයන් අත්අඩංගුවට ගැනීමට රජයේ හමුදාවෝ සමත් වූහ. යුද අධිකරණයක් පවත්වා පුරන් අප්පු, කඩහපොළ හිමි ඇතුළු 18 දෙනකුට මරණ දඬුවම් නියම කරන ලදී. ගෝංගාලේගොඩ බණ්ඩා ඇතුළු පනස් එක් දෙනෙක් රටින් පිටුවහල් කරනු ලැබූහ. 83 දෙනකුට කසපහර දීම හා බන්ධනාගාරගත කිරීම සිදු විය.


1848 අරගලය අසාර්ථක වීමට ප්‍රධාන හේතුව ලෙස පෙනෙන්නේ එයට ගිහි, පැවිදි දෙපක්ෂයේ ම සහයෝගය තිබුණත් පොදුවේ නායකත්වය දිය හැකි පොදුවේ කාගේත් විශ්වාසය හා ගෞරවය දිනාගත හැකි නායකයකු නොසිටීම ය. ගෝංගාලේගොඩ බණ්ඩා හෝ පුරන් අප්පු සියලු දෙනාගේ ගෞරවය දිනාගත හැකි අය නොවූ බව පැහැදිලි ය. අනෙක් අතට කොළඹ සිටි කලම්බු ඔබ්සර්වර් පුවත්පතේ කතුවරයා හෝ කොළඹ වැසියන් පවා නව බදුවලට එරෙහි වූ නමුත් විකල්ප ආණ්ඩුවක් ගැන අදහසක් ඔවුන් තුළ වූ බව නොපෙනේ.

සන්නද්ධ අරගලය අසාර්ථක වූ නමුත් ඉන් සහනදායී ප්‍රතිඵල රැසක් ලැබුණි. බදු ක්‍රමය සංශෝධනය කොට සාප්පු බද්ද, බලු බද්ද ආදිය ඉවත් කිරීමත් ඇඟ බද්දෙන් භික්ෂූන් වහන්සේලා නිදහස් කිරීමත් සිදු විය. ඇඟ බද්ද අන් අයගෙන් ලබාගන්නා විට ඉන් කොටසක් වැව් හා වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා යෙදවීමට රජය එකඟ විය. ග්‍රාමීය ගොවි ජනයා සඳහා සහන සැපයීම අරමුණු කොට ගෙන වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා 1850න් පසු විවිධ ආණ්ඩුකාරවරු උත්සුක වීම දක්නට ලැබිණ.

නව බදු ක්‍රමයට එරෙහි ව කලම්බු ඔබ්සර්වර් පුවත්පතේ කතුවර දොස්තර ක්‍රිස්ටෝෆර් එලියට් විසින් ගෙන යන ලද විරෝධතා ව්‍යාපාරය සිංහලේ නිදහස් සටනට සම්බන්ධ දෙයක් නොවුණි. එම ක්‍රියාකාරීන් සිංහල විමුක්තිකාමීන් හා සමඟ සබඳතා පවත්වා ඇත. "යුරෝපීයයන්ගේ අදහස් නූතන ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප වන නියෝජනයෙන් තොරව බදු පැනවිය නොහැක" (No taxation without representation) යන්න ලාංකේය චින්තනයට අලුත් දෙයක් විය. එය එදා කෙතෙක්දුරට ජනතාව අතරට ගියේ ද යන්න සැක සහිත ය. ඒ අනුව නව ප්‍රජාතන්ත්‍රවාදී සංකල්ප ජන වදනට ඇතුළු වීමට විසිවැනි සියවස තෙක් බලා සිටින්නට සිදුවිය.

# පළමු විමුක්ති සටන

## 1817 - 1818 ඌව වෙල්ලස්ස මහා සටන කැරැල්ලක් නොවේ





මහාචාර්ය
**මාලනී ඇඳගම**

**1817 - 1818 පළමු නිදහස් අරගලය හෙවත් ඌව වෙල්ලස්ස සටනේදී රට වෙනුවෙන් අසිපත් දරා ජාත්‍යානුරාගයෙන් කටයුතු කළ දේශීය වීරවරුන්, අධිරාජ්‍යවාදීන් විසින් නම්කරනු ලැබුවේ දේශද්‍රෝහීන් ලෙස යි. ඔවුන් සියලු දෙනා දේශප්‍රේමීන් ලෙස නම් කර සිංහල වංශ කතාව නිවැරැදි කරමින් ජනාධිපතිවරයා විසින් ඓතිහාසික මහනුවර මඟුල් මඩුවේදී යළි ලියවෙන උත්තමාභිවන්දනා දෙවැනි දිගහැරුම නිමිත්තෙනි.**

**1817-1818** ඌව-වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භවී මුළු උඩරට රාජ්‍ය පුරා ම ව්‍යාප්ත වූ සටන මෙරට බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධ ව දේශීය ජන ප්‍රධානීන් හා පොදු ජනතාව එකතුවී සිදු කළ ප්‍රබල සටනක් විය. බ්‍රිතාන්‍යයන්ගේ අධිරාජ්‍යවාදයට එල්ල වූ ප්‍රබල ප්‍රහාරයක් වූ බැවින් ඔවුන් විසින් එය කැරැල්ලක් ලෙස හඳුන්වන ලදී. ඒ අනුව යමින් මෙරට විද්වත්හු ද විචාරයකින් තොරව එකී හැඳින්වීම පිළිගෙන මෑතක්වන තෙක් ම එසේ ම භාවිත කළහ. ඒ අනුව යමින් සාමාන්‍ය පොදු ජනතාව ද විශේෂයෙන් බාල පරපුර දැනුවත් කරන පාසල් විෂයමාලාවල ද එය කැරැල්ලක් ලෙස හැඳින්වීමට පුරුදු වී තිබිණි. එහෙත් මෑත කාලයේදී මේ සටන පිළිබඳව යළි සලකා බැලූ උගතුන් විසින් එය බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට විරුද්ධ ව දියත් කළ නිදහස් සටනක් බව සනාථ කිරීමට සමත් ව ඇත. ඒ අනුව වසර 200ක් ගතවීමට ආසන්න කාලය වන තෙක් ම අපේ වීරෝදාර මුතුන්මිත්තන්ගේ ශ්‍රේෂ්ඨ කර්තව්‍යයකට වැරැදි අර්ථකතනයක් දී තිබීම කල් ප්‍රමාද වී හෝ නිවැරැදි කරගෙන ඔවුන්ගේ හා දේශයේ අභිමානය මතුකර ගැනීම අප සැමගේ යුතුකම හා වගකීම වේ. ඒ නිසා සත්‍ය වශයෙන් කැරැල්ලක් නොව නිදහස් සටනක් වන 1817-1818 ඉංග්‍රීසි විරෝධී සටන ප්‍රථම නිදහස් සටන ලෙස හැඳින්වීමට කිසිදු දිව පැටලීමකින් තොරව එඩිතර ව ඉදිරිපත්වූ සියලු විද්වතුන් දේශපාලන නායකකාරකාදීන් මෙන්ම බාල, තරුණ, වැඩිහිටි සියලු ජනකොටස් වගබලා ගැනීම අත්‍යවශ්‍ය වේ. එය අපේ දේශයේ අභිමානය මතුකර ගැනීමට කදිම අවස්ථාවක් ද වේ.

දැනට අප පාසල් පෙළපොත්වල එය නිදහස් සටනක් ලෙස හඳුන්වාදීමට සමත් වී ඇත. එසේ වුව ද එය සහේතුකව සනාථ කළ යුතු වේ. එපරිද්දෙන් 1817-1818 සටන නිදහස් සටනක් බව සනාථ කිරීමේදී සටනට තුඩුදුන් හේතු සහ සටනේ අරමුණු සලකා බැලීම අත්‍යාවශ්‍ය වේ. සටනට තුඩුදුන් හේතු සොයා බැලීමට අප ඉතිහාසයේ තරමක් දුරට ආපසු යා යුතු වේ.

ක්‍රි. ව. 16 වැනි සියවසේ ආරම්භයේ සිට පෘතුගීසි-ලන්දේසි, ඉංග්‍රීසි යන අපරදිග අධිරාජ්‍යවාදීන් එකල දේශයේ නිදහස් නිවහල් රාජ්‍යය වූ උඩරට රාජ්‍යය ඔවුන්ගේ ආධිපත්‍යය යටතට ගැනීමට කරන ලද සියලු ම සටන්වලින් හා උත්සාහයන්ගෙන් ඔවුහු අන්ත පරාජයට පත් වූහ. උඩරට රාජ්‍යයේ රජු, ප්‍රභූන් සහ සාමාන්‍ය ජනතාව අතර පමණක් නොව 1597 සිට අපරදිග ජාතීන් යටතේ පැවැති මුහුදුබඩ ප්‍රදේශවල ජනතාව සහ උඩරට රාජ්‍යය අතර ද පැවැති රාජපාක්‍ෂික, දේශමාමක, ජාතිවාත්සල්‍යය, එකමුතුකම උඩරට රාජ්‍යයේ අනාභිභවනීයත්වයට තුඩු දුන් ප්‍රධාන සාධකය බව හඳුනාගත් ඉංග්‍රීසිහු දේශීය ප්‍රධානීන් කිහිපදෙනකුගේ ද සහාය ඇතිව 1815 දී රජු අත්අඩංගුවට ගැනීමට සමත් වූහ.

අනතුරුව උඩරට ප්‍රදේශ පාලනය කිරීම සඳහා විධිමත් පාලන ව්‍යුහයක් සම්පාදනය කර ගත යුතු විය. ඒ අනුව ඉංග්‍රීසි පාලකයන් සහ උඩරට ප්‍රධානීන් එකතුවී ගිවිසගත් පාලන ව්‍යුහය ලියන ලද ලියවිල්ල 1815 උඩරට ගිවිසුම, උඩරට සම්මුතිය යන නාමවලින් හැඳින්වේ. ජෝන් ඩොයිලි ප්‍රධාන ඉංග්‍රීසි ජාතික නිලධාරීන් විසින් සම්පාදනය කරන ලදුව 1815 මැයි 02 වැනි දින ඉදිරිපත් කළ ගිවිසුම් කෙටුම්පත එදින කියවා ඉදිරිපත් කළ නමුත් දේශීය නිලධාරීහු එපරිද්දෙන් එය අත්සන් කිරීමට කැමති නොවූහ. භික්ෂූන් වහන්සේලාගේ මෙහෙයවීම යටතේ 02 වැනි දින සිට 10 වැනි දින දක්වා සාකච්ඡාවට භාජනය කළ එම ගිවිසුම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වූ රොබට් බ්‍රවුන්රිග් සහ දේශීය නිලධාරීන් වැඩි දෙනකු විසින් මාර්තු 10 වැනි දින අත්සන් කළහ. පිලිමතලව්වේ සහ ගලගම යන අදිකාරම්වරු ගිවිසුම අත්සන් කරනු ලැබුවේ එම මස 18 වැනි දිනයේදී ය. නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ස්වභාවය දැරූ මේ සම්මුතිය එකල ඉහළ ම තලයේ නිලධාරීන් වූ ආණ්ඩුකාරයා සහ විධායක මණ්ඩලය විසින් සම්මත කිරීමෙන් පසු ව එංගලන්තයේ පාර්ලිමේන්තුවේදී ද අනුමතවී අවසාන බලධරයා වශයෙන් කිරීටයේ හෙවත් රජුගේ අනුමැතිය ද ලැබී ය. ඒ අනුව එය මෙරට උඩරට රාජ්‍යය යටතේ පැවැති ප්‍රදේශ පාලනය කළ යුතු ආකාරය විස්තර කළ උත්තරීතර නීතිමය ලියවිල්ලක් හෙවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් බවට පත් විය. එය දේශීය නිලධාරීන් සහ ඉංග්‍රීසි පාලකයන් විසින් හවුලේ ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවකට එළඹී ලියවිල්ලක් විය.

කෙසේ වුව ද එම ලියවිල්ල යටතේ උඩරට පාලනයට සම්බන්ධ වූ ඉංග්‍රීසීන්ට නීත්‍යනුකූල ව එමගින් බලතල ලැබුණ බැවින් එම ආණ්ඩුවට විරුද්ධ ව ජනතාව ආයුධ අතට ගැනීම බැලූ බැල්මට ආණ්ඩුවට විරුද්ධ ව කැරලිගැසීමක් ලෙස හැඳින්විය හැකි ය. මුහුදුබඩ ප්‍රදේශ වෙන ම පාලනය කරමින් සිටි ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන් උඩරට රාජ්‍යය ද අත්පත් කරගැනීමෙන් පසු ව ඔවුන්ට හැඟුණු පරිදි මෙරට ජනතාවට හොඳ ම ආණ්ඩුක්‍රමයක් ලබාදී තිබියදීත් ඔවුන්ට විරුද්ධ ව නැගීසිටීම ආණ්ඩු විරෝධී කැරැල්ලක් ලෙස දැක්වීමට පෙලඹීම පුදුමයක් නො වේ.

එහෙත් මේ සටනේ ආරම්භයට තුඩුදුන් හේතු සුපරීක්‍ෂාවෙන් බලන විට පැහැදිලි වන වැදගත් කරුණක් වනුයේ උඩරට ජනතාව නැගී සිටියේ නීත්‍යානුකූල ව පිහිටු වූ නමුත් ආරම්භයේ සිට ම ව්‍යවස්ථා විරෝධී ව ක්‍රියා කළ ආණ්ඩුවකට විරුද්ධ ව බව පැහැදිලි කරුණකි. මෙහිදී 1815 ගිවිසුමේ 4, 5 සහ 8 වැනි වගන්ති ප්‍රධාන වේ. 1, 2 සහ 3 වගන්තිවලින් උඩරට ප්‍රදේශවල ආධිපත්‍යය බ්‍රිතාන්‍ය රජුට පැවරෙන බව ද ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සිහසුනෙන් පහකරන බව ද නායක්කාර පරපුරට උඩරට සිහසුනට කිසි ම අයිතියක් නැති බව ද විස්තර කොට ඇත. එහෙත් 4 වැනි වගන්තිය අනුව උඩරට

**සත්‍ය වශයෙන් කැරැල්ලක් නොව නිදහස් සටනක් වන 1817-1818 ඉංග්‍රීසි විරෝධී සටන ප්‍රථම නිදහස් සටන ලෙස හැඳින්වීමට කිසිලු දිව පැටලීමකින් තොරව එඩිතර ව ඉදිරිපත් වූ සියලු විද්වතුන් දේශපාලන නායකකාරකාදීන් මෙන් ම බාල, තරුණ, වැඩිහිටි සියලු ජනකොටස් වගබලා ගැනීම අත්‍යවශ්‍ය වේ. එය අපේ දේශයේ අභිමානය මතුකර ගැනීමට කදිම අවස්ථාවක් ද වේ.**

රාජ්‍යයේ සියලු පරිපාලන කටයුතු පෙර සිරිත අනුව දේශීය ප්‍රධානීන් යටතේ ක්‍රියාත්මක කෙරෙන බව ද ඔවුන්ගේ නිලතල, බලතල සහ වරප්‍රසාද පෙර පැවති පරිදි ම සුරක්‍ෂිත කරන බවට ද ඉංග්‍රීසීන් ප්‍රතිඥා දී ඇත. සිංහල රජවරුන් යටතේ සිදු කෙරුණ පරිදි ම බ්‍රිතාන්‍ය පාලකයන් ද දේශීය ජන ප්‍රධානීන් සහ ජනතාව ඇදහූ බුදු දහම ආරක්‍ෂා කරන බවට ද භික්‍ෂූන් වහන්සේට ගරුබුහුමන් දක්වන බවට ද විහාර දේවාලගම් ආරක්‍ෂා කර දෙන බවට ද 5 වැනි වගන්තියෙන් ඔව්හු පොරොන්දු වූහ. 8 වැනි වගන්තියෙන් විස්තර කළ පරිදි දේශීය අධිකරණ ක්‍රමය ද දේශීය නිලධාරීන් ලවා දේශීය සිරිත් විරිත්වලින් යුක්ත නීති යටතේ ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වී ඇත. මේ කරුණු අනුව අප විසින් අවධාරණයෙන් මතක තබා ගත යුතු කරුණු දෙකක් ඇත. අද දක්වා ම සාමාන්‍යයෙන් ප්‍රචලිත ව පවතින පරිදි මෙරට ප්‍රධානීන් 1815 දී උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පාවාදීමක් හෝ ඉංග්‍රීසීන් විසින් උඩරට රාජ්‍යය යටත් කරගැනීමක් හෝ සිදු වූයේ නැති බව එම කරුණු දෙක ය.

ඉංග්‍රීසීන්ට මුල සිට ම අවශ්‍ය වූයේ කෙසේ හෝ උඩරට රාජ්‍යය සෘජුව ම ඔවුන්ගේ ආධිපත්‍ය යටතට පත්කර ගැනීම යි. 1802-1803 දී උඩරට වෙත ආක්‍රමණයක් එල්ල කළ නමුත් අවස්ථා කිහිපයකදී පෘතුගීසීන්ට අත්වූ ආකාරයේ අන්ත පරාජයකට මුහුණදුන් ඉංග්‍රීසීන්ට අවි බලයෙන් උඩරට රාජ්‍ය යටත්කරගත නොහැකි බව ප්‍රත්‍යක්‍ෂ විය. ඒ අනුව උපක්‍රමශීලී ව උඩරට රාජ්‍ය යටත්කර ගැනීමට යොදන ලද විධි විධාන අනුව ප්‍රධාන වශයෙන් උඩරට රජු සහ රදළ ප්‍රධානීන් භේද කරවා ඒ අනුව උඩරට රාජ්‍යයේ ආරක්‍ෂාවට බැඳි වැටක් සේ විරාත් කාලයක් තිස්සේ පැවති රාජපාක්‍ෂිකභාවය බිඳ දමා 1815 රදළ ප්‍රධානීන් සමග අත්සන් කළ ගිවිසුමක් මගින් එම රාජ්‍ය අත්පත් කරගත් බ්‍රිතාන්‍යයන්ට එම ගිවිසුම් ආරක්‍ෂා කිරීමට කිසි ම උනන්දුවක් නො තිබිණි. ඔවුන්ට වුවමනා වූයේ කෙසේ හෝ උඩරට රාජ්‍ය සිය අණසක යටතට පත්කර ගැනීමට යි. ඒ සඳහා ඔවුන් අනුගමනය කළ ක්‍රියාමාර්ගවලදී සිතාමතා ම ඉතා ඕනෑකමින් 1815 ගිවිසුමේ 4, 5 සහ 6 යන වැදගත් මෙන් ම ප්‍රධානතම වගන්ති ඔවුහු කඩ කළහ.

පළමුවෙන් ම කඩවූයේ බුදු දහම ආරක්‍ෂා කරන බවට පොරොන්දු වූ 5 වැනි වගන්තිය යි.



උඩරට ගිවිසුමට අත්සන් තැබීමෙන් අනතුරුව



සිංහල රාජ වංශයේ අවසානය
ඉංග්‍රීසි ජාතිකයන් විසින් රාජසිංහ රජු අත්අඩංගුවට ගැනීම

ක්‍රිස්තු භක්තිකයන් වූ ඔවුන්ට පෙර බෞද්ධ රජවරුන් කළ පරිදි බුදු දහම සුරක්ෂිත කිරීම හෝ භික්ෂූන්වහන්සේට ගරුසත්කාර කිරීම සහ වැඳුම්පිදුම් කිරීම කළ නොහැකි විය. එසේ වුවත් ඔවුන් විසින් එපරිද්දෙන් කටයුතු කරන බවට පොරොන්දුවීම සිතාමතා ම කරන ලද රාජ්‍ය මට්ටමේ වංචාවක් බව පැහැදිලිය. ඒ නිසා නොදැනුවත්කම නිසා මෙන් ම සිතාමතාම ක්‍රිස්තු ධර්මය ව්‍යාප්ත කිරීමට හා බුද්දහම නොසලකා හැරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග නිසා 5 වැනි වගන්තිය කඩ කෙරිණි.

පරිපාලන ක්ෂේත්‍රයේදී පෙර සිරිත ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වූ නමුත් කොතනකවත් ලියා නො තිබුණ සම්ප්‍රදායානුකූල ව පවත්වාගත් එම සංකීර්ණ නීතිරීති සොයා බැලීමටවත් ඒවා අවබෝධකොට ගැනීමටවත් ඔවුන්ට නො හැකි වූවා පමණක් නොව ඒවා පිළිබඳ උනන්දුවක් හෝ නොවී ය. ඒ නිසා පරිපාලන ක්ෂේත්‍රයට අදාළ 4 වැනි වගන්තිය ක්‍රියාත්මක කිරීමට ඔවුහු අසමත් වූ අතර සිතාමතා ම එය කඩකිරීමේ ක්‍රියාමාර්ග දියත් කළහ. ඒ අනුව ද ඔවුන්ගේ පාලනයේ නීත්‍යානුකූලභාවය ප්‍රශ්නාර්ථයක් විය. අවසාන වශයෙන් 1817 වනවිට පැහැදිලිව ම 4 වැනි වගන්තිය ද කඩකරමින් දේශීය නිලධාරීන් පත්කිරීමේදී අනුගමනය කිරීමට පොරොන්දු වූ පරිදි ක්‍රියා නො කොට පෙර සිරිත කඩකරමින් හජ්ජි මරික්කාර් නමැත්තා මඩිගෙ මුහන්දිරම් තනතුරට පත්කිරීම සටනට තුඩුදුන් ආසන්න ම හේතුව විය.

එපරිද්දෙන් ගිවිසුම කඩකරමින් නීති විරෝධී ලෙස පාලන කටයුතු කිරීම නිසා අසතුටට පත්වී සිටි භික්ෂූන් වහන්සේ, රදළ ප්‍රධානීන් සහ සාමාන්‍ය ජනතාව යන සියලු කොටස් ටිකින් ටික සටනට එකතු කරවීමට බරපතළ හේතු විජාතික අධිරාජ්‍යවාදීන් විසින් සැලසුවා මිස කිසි ම කුමන්ත්‍රණයක් හෝ අධුනමින් සිංහල නායකයන් අතර සටනට සූදානමක් හෝ නො තිබිණි. තමන් රවටන විජාතික පාලකයන් කෙරෙහි ජනතාව අප්‍රසාදයට පත් වී සිටියදී පෙරමුණට පැමිණි පුද්ගලයකු වටා ජනතාව එකතු වූයේ ඔවුන් අතර විජාතික සතුරාගෙන් නිදහස්වීමේ පොදු අරමුණෙන් ගොඩ නැඟෙමින් තිබූ බැවිණි. එම අරමුණ වූයේ 1815 ගිවිසගත් උඩරට සම්මුතිය කඩකරමින් නීති විරෝධී පාලනයක් ක්‍රියාත්මක කළ ඉංග්‍රීසින් මෙරටින් පළවා හැරීම ය. 1818 ඌව-වෙල්ලස්ස විමුක්ති සටන නියම ලෙස හඳුනා ගැනීමේදී මේ අරමුණ කේන්ද්‍රීය සාධකයක් වන බව අවධාරණය කළ යුතු ය.

ඕනෑම සිද්ධියක ස්වභාවය හඳුනාගැනීමේදී අප සැලකිලිමත් විය යුතු ප්‍රධාන කරුණ වනුයේ එකී සිද්ධියට පාදක වූ අරමුණු බව පුන පුනා ඉස්මතු කළ යුත්තේ එබැවිණි. 1817-1818 සටනේ අරමුණු සෙවීමට පසුගිය වසර 200ක පමණ කාලයක් තිස්සේ මෙරට උගතුන් විසින් උත්සාහ නොදරා ඉංග්‍රීසි පාලකයන් විසින් මේ සටන හැඳින් වූ ආකාරයට ම එය කැරැල්ලක් ලෙස හඳුන්වමින් සිටි නමුත් 1817-1818 සටන් බිමේ ඉංග්‍රීසි හමුදාවේ වෛද්‍යවරයකු ලෙස එදා සේවය කළ හෙන්රි මාෂල් 'ලංකාව' ගැන ලියා ඇති කෘතියේ මේ සටනේ අරමුණ පැහැදිලි කොට ඒවා අනුව 'එය නිදහස් සටනක් නොවේ නම් වෙන කුමක්දැයි' ප්‍රශ්න කරමින් ප්‍රථමවරට එය නිදහස් සටනක් ලෙස හඳුන්වා ඇත. සටන් බිමේ සිට විදේශිකයා දුටු මේ සත්‍යය කෙරෙහි අධිරාජ්‍යවාදී ගැති බව නිසාදෝ දේශීය උගතුන් මෑතක් වන තෙක් ම විමසිලිමත් නොවීම අභාග්‍යයකි.

එපරිද්දෙන් සටනට තුඩුදුන් හේතු සහ ඒ හා බැඳුණු අරමුණු ගැන පමණක් නොව නිදහස් සටන මෙල්ල කළ ආකාරය ගැන ද ඉංග්‍රීසි ලේඛකයන් ම ලියා ඇති පොත්පත් සහ රාජ්‍ය ලේඛනාගාරයේ සුරක්ෂිත ව තැන්පත්කොට ඇති රාජ්‍ය ලියැවිලි ද අනුව 1817-1818 සටන බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට එරෙහි ව මෙරට ජනතාව නැඟී සිටි ප්‍රථම විමුක්ති සටන ලෙස හැඳින්වීමට අපමණවත් සාක්ෂි ඇත. එහෙත් එය තවමත් කැරැල්ලක් ලෙස හඳුන්වනු ලබන්නා වූද එය ප්‍රථම නිදහස් අරගලය ලෙස හැඳින්වීමට මැලිවන්නා වූ ද අය අප අතර ඇත. කෙසේ හෝ වසර කිහිපයක් තිස්සේ සිට පාසල් පෙළ පොත්වලට 1817 සිදු වූයේ මෙරට අධිරාජ්‍ය විරෝධී ප්‍රථම විමුක්ති අරගලය බව පැහැදිලි කිරීමට අපට හැකිවීම එදා අපේ වීරෝදාර මුතුන් මිත්තන් ජීවිත පරිත්‍යාගයෙන් දියත් කරන ලද නිදහස් විමුක්ති සටන වසර 200කට පසු ව ජයග්‍රහණය කරවීමක් ලෙස සතුටු විය හැකි ය.

1817-1818 බ්‍රිතාන්‍ය විරෝධී ප්‍රථම නිදහස් සටනේදී නායකත්වය දුන් 19 දෙනකු දේශද්‍රෝහීන් ලෙස ප්‍රකාශයට පත්කොට තිබූ බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ ප්‍රකාශනය වර්තමාන ජනාධිපතිවරයා විසින් අවලංගු කරන ලදී. එම පියවර 2018 දී වසර 200ක් සපිරෙන මේ වීරෝදාර ප්‍රථම නිදහස් සටනට සහ එහි විරුවන්ටත් එම සටනේදී 'බිම් පාළු' ප්‍රතිපත්තියක් මඟින් ඌව - වෙල්ලස්ස ප්‍රදේශවල ගේ දොර, ඉඩකඩම්, වතුපිටි, හරකාබාන, ගොවිතැන් කටයුතු ආදී සමස්ත ජනජීවිතය ද ජනතාවගේ ජීවිත ද විනාශ කළ තත්ත්වය යටතේ තවමත් පසුගාමී ව සිටින එම ප්‍රදේශවල ජනතාවටත් රජයෙන් ඉටු විය යුතු යුතුකම් සහ වගකීම් ඉටු කිරීමට තබන ලද ප්‍රථම පියවරක් ලෙස අගය කළ හැකි ය. ජනාධිපතිවරයාගේ එම ක්‍රියා පිළිවෙළ අදාළ සියලු අමාත්‍යංශ සහ දෙපාර්තමේන්තුවල ද සහභාගීත්වයෙන් මේ වසර දෙක ඇතුළත ඉදිරියට ගෙන ගොස් 2018 වසරේ අවසානය වන විට ඌව - වෙල්ලස්ස පුනර්ජීවනයට පත්කිරීමට හැකි වුවහොත් එම අධිරාජ්‍යවාදයේ බිහිසුණු ප්‍රතිඵල වසර 200කට පසු ව හෝ ජයගැනීමට හැකිවීමක් වන අතර සටන වෙනුවෙන් දිවි පිදූ මිනිසුන් පමණක් නොව සතා සිව්පාවා පවා විශිෂ්ටත්වයට ඔසවා තැබීමක් වනු ඇත. 1817-1818 දී මෙරට සිදු වූයේ බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් තීන්දු කළ පරිදි නීත්‍යනුකූල ව පිහිටු වූ ආණ්ඩුවට විරුද්ධ ව කැරලි ගැසීමක් නොව නීත්‍යනුකූල ව පිහිට වූ නමුත් පොරොන්දු කඩකරමින් ව්‍යවස්ථා විරෝධී ව කටයුතු කළ අධිරාජ්‍යවාදී ආණ්ඩුවට විරුද්ධ ව වීරෝදාර නිදහස් සටනක් දියත් කිරීම බව පැහැදිලි ය. එබැවින් මේ සටන සහ එමඟින් සිදු වූ විනාශය පිළිබඳ යථා තත්ත්වය බාල පරපුරට අවබෝධකර දීමත් එමඟින් අධිරාජ්‍යවාදයේ බිහිසුණුකම සහ දැයේ විරුවන්ගේ ශ්‍රේෂ්ඨත්වය හෙළිපෙහෙළි කිරීමත් නිසි පර්යේෂණාත්මක අධ්‍යයනයක් මඟින් බොහෝදුරට සපුරාලිය හැකිවනු ඇත.

# තොරතුරු ගත හැකි නිවැරැදි ක්‍රම


## තොරතුරු දැනගැනීමේ පනත ක්‍රියාත්මක කිරීම

ජී. ජී. මාලා මල්කාන්ති

ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ තොරතුරු දැනගැනීමේ අයිතිය **(Right To Information)** බලාත්මක වූයේ පසුගිය පෙබරවාරි මස 03 වැනි දා. ඒ, 2016 අගෝස්තු 04 වැනි දින පාර්ලිමේන්තුවේදී සම්මත වූ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීමට පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් අංක 2004/66 දරන 2017 පෙබරවාරි 03 වැනි දින නිකුත් කළ ගැසට් පත්‍රය මඟින් රීති හා රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමත් සමඟ.

එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ තොරතුරු දැනගැනීමේ නීති ශ්‍රේණිගත කරන කැනඩාවේ "නීතිය සහ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මධ්‍යස්ථානය" නොබෝදා ප්‍රකාශයට පත් කරන ලද නවතම ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාව ලෝකයේ හොඳ ම තෙවැනි තොරතුරු දැනගැනීමේ නීතිය අයත් රට බවට පත් ව තිබෙනවා. මීට පෙර එය පිළිවෙළින් හත්වැනි හා නවවැනි ස්ථානවලට පත් වුව ද දකුණු ආසියාවේ හොඳ ම තොරතුරු දැනගැනීමේ පනත ලෙස සැලකෙන ඉන්දියාවේ තොරතුරු දැනගැනීමේ පනත පස්වැනි ස්ථානයට පත් වෙද්දීය අප මේ සුවිශේෂී ජයග්‍රහණය ලබා ඇත්තේ. මෙහිදී පිළිවෙළින් පළමු වැනි හා දෙවැනි තැනට පත්ව ඇත්තේ මෙක්සිකෝව හා සර්බියාව යන රටවල්.

මෙවැනි පසුබිමක වඩා වැදගත් වන්නේ මේ පනත මඟින් රීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය ශක්තිමත් වීම. එමඟින් රාජ්‍ය, පෞද්ගලික මෙන් ම රාජ්‍ය නොවන සංවිධාන ද ඇතුළත් සෑම පොදු අධිකාරියක ම විනිවිදභාවය, වගවීමේ භාවය රටේ ජනතාව ඉදිරියේ ප්‍රදර්ශනය වන අතර ම රට ඉදිරියට මෙහෙයවීමේ සක්‍රීය




කොටස්කරුවකු වීමට ජනතාවට අවස්ථාව උදා වීමත් මෙහි ලා වැදගත්.

ඒ අනුව මේ සෑම පොදු අධිකාරියක් ම තම ආයතනගත තොරතුරු ලබා දීමට වගකීමෙන් බැඳෙන අතර ජාතික ආරක්ෂාව, ජාත්‍යන්තර ගිවිසුම්, බැංකු කටයුතු, විභාග, පුද්ගලික වැනි තොරතුරු මෙන් ම අධිකරණයට අපහාස විය හැකි හා පාර්ලිමේන්තු වරප්‍රසාද ආදියට අදාළ තොරතුරු අනාවරණය නොකර සිටීමේ අවශ්‍යතාව පනත මඟින් පෙන්වා දී තිබෙනවා. මේ නිසා ජනතාවට තොරතුරු ඉල්ලා සිටීමේදී ඉහත ව්‍යතිරේක හැර පොදුවේ ජනතා අරමුදලින් පාලනය වන ආයතනවල තොරතුරු ඉල්ලා සිටීමේ හැකියාව තිබෙනවා.

එසේ තොරතුරු ලබාගැනීමේදී තොරතුරු ලබා දීම සඳහා සෑම පොදු අධිකාරියකම තොරතුරු නිලධාරියකු පත්

කර තිබීම අත්‍යවශ්‍ය කරුණක්. එසේ ම ඒ සඳහා නම් කළ නිලධාරියකු (අභියාචනා නිලධාරියකු) පත් කර තිබෙන්නේ තොරතුරු නිලධාරියාගෙන් තම අවශ්‍යතාව ඉටු කර ගත නොහැකි අවස්ථාවක අභියාචනයක් ඔහු වෙත ඉදිරිපත් කිරීමෙන් එම තොරතුරු ලබා ගැනීමට. ඒ අනුව මේ වන විට පත් කළ එවැනි නිලධාරීන්ගේ සංඛ්‍යාව දෙදහස ඉක්මවන අතර එසේ පත් කර නොමැති අවස්ථාවක එම නිලධාරීන් පත් වන තුරු ආයතන ප්‍රධානියා අභියාචනා නිලධාරියා ලෙස ද ආයතනයේ දෙවැනි ප්‍රධානියා තොරතුරු නිලධාරියා වශයෙන් ද කටයුතු කිරීමට වගකීමෙන් බැඳෙනවා.

මෙහිදී මහජනතාවගේ ඉල්ලීමකින් තොරව ද තම ආයතනයේ තොරතුරු එළිදරව් කිරීමට හා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සැකසීම අත්‍යවශ්‍ය වන බව යි ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා පවසන්නේ. පනතේ 15 (ඇ) වගන්තිය අනුව එසේ හෙළි කළ යුතු තොරතුරු ප්‍රගාමී තොරතුරු ලෙස හැඳින්වෙනවා. යම්කිසි ආකාරයකට මේ ප්‍රගාමී තොරතුරු සාවද්‍ය හෝ ව්‍යාජ හෝ යාවත්කාලීන නොවන අවස්ථාවක හෝ ඒ බව පොදු අධිකාරියේ විධායක නිලධාරී වෙත වාර්තා කළ පසුව එය නිවැරැදි කිරීමට ඔහු කටයුතු නොකළ හොත් මාස 03ක් තුළ තොරතුරු කොමිෂන් සභාවට ඒ පිළිබඳ පැමිණිලි කිරීමට හැකි වීමත් මෙහි විශේෂිත කරුණක්.

තොරතුරු ලබා ගැනීමේදී **RTI** 01 ආකෘති පත්‍රය පිරවීමෙන් හෝ විස්තර සහිත ලිපියක් මඟින් හෝ විද්‍යුත් පණිවුඩයක් මඟින් හෝ තම ඉල්ලීම කළ හැකි අතර එම තොරතුරු දින 14ක් තුළ ඉල්ලුම්කරුට ලබා දීමට තොරතුරු නිලධාරියා කටයුතු කළ යුතු වෙනවා. එම කාලය දීර්ඝ කළ හැක්කේ දින 21ක් දක්වා පමණයි. මෙසේ තොරතුරු ඉල්ලීමේදී අයදුම්පත්‍රය සඳහා කිසිදු ගාස්තුවක් අය කරන්නේ නැහැ. එහෙත් එම කාලසීමාව තුළ තොරතුරු නොලැබෙන්නේ නම් **RTI** 10 ආකෘති පත්‍රය අනුව දින 14ක් තුළ තම අභියාචනය, අභියාචනා නිලධාරියා වෙත ඉදිරිපත් කළ හැකි බව යි පනතේ සඳහන් වන්නේ. එවිට ද තම තොරතුරු නොලැබෙන්නේ නම් තොරතුරු කොමිසමට ද අභියාචනා කළ හැකි අතර එය ගාස්තු අය කිරීමෙන් නිදහස්. එවිට ද කොමිෂන් සභාවේ තීරණය සමඟ සෑහීමට පත් විය නොහැකි නම් පනතේ 34 වැනි වගන්තියට අනුව අභියාචනාධිකරණය දක්වා යාමට තොරතුරු ඉල්ලුම්කරුට හැකි වන බවත් ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා පෙන්වා දෙන කරුණක්.

තොරතුරු ලබා දීමේදී අය කළ යුතු ගාස්තු හා ගාස්තුවලින් තොරව තොරතුරු ලබා දීම පිළිබඳ රීතිවල සඳහන් වෙනවා. ඒ අනුව ඡායාපිටපත් ලබා ගැනීමේදී **A** 4 (සෙ.මී.21 සෙ.මී.29.7) කඩදාසියක හෝ ඊට වඩා කුඩා ප්‍රමාණයේ කඩදාසියක සපයන තොරතුරු සඳහා තනි පැත්තක් රු.2/= ක් සහ එක ම කොළයේ දෙපැත්ත සඳහා රු.4/= ක් ගෙවිය යුතු වෙනවා. එම ප්‍රමාණයේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමට නම් තනි පැත්තක් රු.4/= ක් සහ එක ම කොළයේ දෙපැත්ත රු.8/= ක් ලෙස ගෙවිය යුතු බව යි රීතිවල සඳහන් වන්නේ. ලීගල් ප්‍රමාණයේ (සෙ.මී.21.59 සෙ.මී.35.56) සහ **A3** ප්‍රමාණයේ (සෙ.මී.29.7 සෙ.මී.42) කඩදාසියක ඡායාපිටපත් මෙන් ම මුද්‍රිත පිටපත් සඳහා ද තනි පැත්තක් රු.4/= ක් හා එකම කොළයේ දෙපැත්ත සඳහා රු.8/-ක් වශයෙන් ගාස්තු ගෙවිය යුතු බව සඳහන්. මේ ප්‍රමාණවලට වඩා විශාල කඩදාසිවල තොරතුරු සපයන්නේ නම් එහි සැබෑ වියදමයි අය කරනු ලබන්නේ.

මේ තොරතුරු ඉල්ලීම සිදු කරන්නේ ඩිස්කට්ටුවක (**Diskette**), සංයුක්ත තැටියක (**Compact Disc**), යූඑස්බී දත්ත පරිවාහකයක (**USB Mass Drive**) හෝ වෙනත් එබඳු ඉලෙක්ට්‍රොනික් උපාංගයක් වෙත තොරතුරු පිටපත් කර දීමෙන් නම් ඒ එක් එක් අයිතමයක් සඳහා රු.20/= ක් ගෙවිය යුතු බව යි රීතිවල සඳහන. එහෙත් අදාළ පොදු අධිකාරිය විසින් ම එම ඉලෙක්ට්‍රොනික් උපාංග වෙත තොරතුරු පිටපත් කර දෙන්නේ නම් එහි සැබෑ වියදම ගෙවිය යුතු වෙනවා.

එසේ ම යම් ලියවිල්ලක්, විෂයයන් පරීක්ෂා කිරීමට හෝ අධ්‍යයනය කිරීමට හෝ ඉදිකිරීම් ක්ෂේත්‍රයක් පරීක්ෂා කිරීමට පැයකට ගෙවිය යුතු ගාස්තුව රු.50/=ක්. නියැදි (සාම්පල) හෝ ආකෘති (මොඩලම්) හෝ සඳහා අය කරන්නේ සත්‍ය වියදමයි. මෙහිදී විද්‍යුත් තැපැල මඟින් තොරතුරු සපයන්නේ නම් ඒ සඳහා ගාස්තු අය කිරීමක් නැහැ. එසේ ම තොරතුරු නිලධාරියාට අත්පිට මුදල් වශයෙන් මෙන් ම පොදු අධිකාරියේ ගිණුම් නිලධාරියා වෙත යොමු කළ බැංකු අණකරයක් මඟින් මේ ගාස්තු ගෙවිය හැකි බවත් රීතිවල සඳහන්.

මෙසේ හෙළිදරව් කරන තොරතුරු ගාස්තු රහිත ව කාල නියමයකින් තොර ව එමෙන් ම අවසර ලබා ගැනීමකින් ද තොරව භාවිතයට ගැනීමට හැකි වීමත් විශේෂත්වයක්. කෙසේ වෙතත් තවමත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වීම ඇරඹුණා පමණයි. එහෙත් පනත ක්‍රියාත්මක වූ පළමු දිනයේදී ම ලැබී ඇති ඉල්ලීම් සංඛ්‍යාව 300 ඉක්මවා තිබීම පෙන්නුම් කරන්නේ මේ සම්බන්ධයෙන් වූ සාධනීය තත්ත්වයක්. පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය කරුණාරත්න පරණවිතාන පෙන්වා දෙන පරිදි ස්කොට්ලන්තයේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක වීමට වසර 7ක් ගත වී තිබෙනවා. එයට අනුව නම් පනත ක්‍රියාත්මකවීම සම්බන්ධයෙන් අප සිටින්නේ වඩාත් ඉදිරියෙන්.

තොරතුරු දැනගැනීමේ අයිතිය ශ්‍රී ලාංකික පුරවැසියාට ලබාදීමේ ඓතිහාසික මොහොත සනිටුහන් කරමින් පෙබරවාරි මස 17 වැනි දින අරලියගහ මන්දිරයේ පැවැති තොරතුරු නිලධාරීන්ගේ හමුවේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රකාශ කළේ ද මේ පනත ක්‍රියාත්මක වීමෙන් එය විනිවිදභාවය සුරක්ෂිත වන රාජ්‍ය යාන්ත්‍රණයකට මඟ පාදන බව. දේශපාලනඥයා සහ රාජ්‍ය නිලධාරියා අතර පවතින සංස්කෘතික දේශපාලන ගැටුම, එනම් යම්කිසි කාර්යයකදී එකඟතාවකට එළඹීමේ නොහැකියාව මේ විවෘතභාවය නිසාම මඟ හරවා ගත හැකි වනු ඇති බවත් ජනාධිපතිවරයා මෙහිදී අවධාරණය කළා. මේ අවස්ථාවේදී www.rti.gov.lk අඩවිය ද පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යංශය මඟින් එළි දැක්වූයේ තොරතුරු නිලධාරීන්ට පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු ලබාදෙමින් තොරතුරු ලබා දීමේ අයිතිය විධිමත් කිරීමට.

මේ අනුව ගවේෂණාත්මක මාධ්‍ය කලාවක නිරතවන්නන්ට මෙලෙස තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අනුමත වීම සුවිශේෂී අවස්ථාවක් වන අතර ම මෙරට ප්‍රජාතන්ත්‍රවාදී පාලන ව්‍යුහයක් ස්ථාපිත කරන්නට දරන වෑයමත්, එමඟින් එහි සෘජු කොටස්කරුවන් ලෙස ජනතාවට දායකවීමට මේ ඔස්සේ හැකි වීමත් රටේ ඉදිරි ගමන නව හැරවුම් ලක්ෂයකට යොමු වී ඇති බවට කදිම සාධකයක් ලෙස හැඳින්විය හැකි යි.

# වයඹ ඇළේ කතන්දරේ

## වයඹ ඇළ ව්‍යාපෘතිය

කාංචනා ඉන්දුනී කුමාරසිරි

වයඹ පළාතේ උතුරු කොටසෙහි පවතින්නේ වියළි කලාපයට සමාන දේශගුණික තත්ත්වයක්. එම නිසා ඒ ප්‍රදේශ සඳහා ජල අවශ්‍යතාව දැඩි ව පවතිනවා. මී ඔය ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශයට හා හක්වටුණා ඔය ජලාශයට මහවැලි ජලය හරවා කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශයේ පිහිටි වැව් පෝෂණය කිරීම, කෘෂිකර්මාන්තය නගා සිටුවීම, ජල හිඟය හේතුවෙන් ඇති වන පීඩා අවම කිරීම, මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියේ අරමුණ යි. මේ ජල ව්‍යාපෘතිය නිමාවීමෙන් පසුව මහවැලි ජලය අක්කර අඩි 105,000ක් පමණ වාර්ෂික ව කුරුණෑගල දිස්ත්‍රික්කයේ උතුරු ප්‍රදේශයට ලබා දීමට හැකියාව ලැබෙනවා.

මේ ඇළ ව්‍යාපෘතිය අදියර දෙකකින් නිම කිරීමට අපේක්ෂිත බව පවසන වයඹ පළාත් ඇළ ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු පී. එම්. ආර්. අසෝක පෙරේරා: "පළමු අදියරේ දී වැමැඩිල්ල ජලාශය ආශ්‍රිත ව ඉදිකිරීම් සිදු කිරීමට යි අපේක්ෂාව. එනම්, මාතලේ දිස්ත්‍රික්කයේ නාලන්දා ජලාශයේ ජලය වැමැඩිල්ල හරහා මහකිතුල වැව දක්වා රැගෙන ඒමට අවශ්‍ය ඇළ මාර්ග ඉදිකිරීම් මේ යටතේ නිම කිරීමට යි අපේක්ෂාව. එහි දිග කි. මී. 23.5ක්. එමෙන් ම කහල්ල - පල්ලෙකැලේ රක්ෂිතය තුළ අලුතින් ඉදිකරන මහකිතුල හා මහකිරිඋල වැව් දෙක සංවර්ධනය වන්නේ ද මේ අදියරේදී ම යි. ව්‍යාපෘතිය අවසන් වන්නේ 2024 දී. දෙවැනි අදියර 2019 - 2024 දක්වා කාලසීමාව තුළ නිම කිරීමට අපේක්ෂිත යි.

මහකිතුල හා මහකිරිඋල වැව්වලට හැර වූ මහවැලි ජලය අලුතින් ඉදිකරනු ලබන ඇළ මාර්ග ඔස්සේ ඉහළ මී ඔය ජලාධාර පද්ධතියේ කුඩා වැව්වලටත්, පොකුවිල වැව, මැඩියාව වැව සහ මැඩියාව ද්‍රෝණියේ කුඩා වැව් පද්ධතියටත් අඹකොළ වැව, අතරගල්ල සහ පාලුකඩවල ජලාශ සඳහාත් හක්වටුණා ඔය ද්‍රෝණි ප්‍රදේශටත් හරවා කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැව් ගණනාවක් පෝෂණය කිරීමට අපේක්ෂා කෙරෙනවා.

දැනට දඹුළු ඔය වෙත ලැබෙන මහවැලි ජලය වැමැඩිල්ල දක්වා හැරවීමට අවශ්‍ය ඇළ මාර්ගය හා ජල හැරවුම් නිර්මිත ඉදිකිරීම ද මේ යටතේ නියමිත යි.

වයඹ ඇළ ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය වන මුළු ඇළ මාර්ගවල දිග කි. මී. 96ක්. මෙහි ඇත්තේ සමෝච්ඡ රේඛා ඇළ ක්‍රමයක් එනම්, ඇළ මාර්ගයේ එක් පැත්තකට ඇති වැව් සඳහා පමණක් ජලය ලබා දීමට ඇති හැකියාව මෙහි විශේෂත්වයක්. මේ ව්‍යාපෘතියෙන් ප්‍රදේශයේ පිහිටි කුඩා වැව් 300ක් පමණ හා ප්‍රධාන වැව් 08ක් මහවැලි ජලයෙන් පෝෂණය කෙරෙනවා. ඒ අනුව ගලේවෙල ප්‍රදේශයේ වැමැඩිල්ල, දේවහුව වැව් දෙක මෙන් ම ගල්ගමුව ප්‍රදේශයේ පාලුකඩවල, අතරගල්ල, අඹකොළ වැව හා මැඩියාව යන වැව් සඳහා මහවැලි ජලය ලබා දීමේ හැකියාව ලැබෙනවා. මේ අනුව මුළු තෙත් බිම් හෙක්ටයාර 12500කට අධික ප්‍රමාණයක් සඳහා යල මහ දෙකන්නයේ ම වගා කටයුතු වෙනුවෙන් වාරි ජලය සැපයීමට හැකියාව ලැබෙනවා. ඒ මඟින් අක්කර අඩි 105,000ක ධාරිතාවක මහවැලි දියවර වයඹ පළාතට ගෙන ඒමට හැකි වෙනවා.

විදේශ ආධාර සහිත ව මෙතෙක් ක්‍රියාත්මක විශාලතම ව්‍යාපෘතිය වන්නේ ද වයඹ ඇළ ව්‍යාපෘතිය යි. මේ සඳහා ඇස්තමේන්තුගත වියදම් අනුව ආසියානු සංවර්ධන බැංකුවේ සහන පොලී පදනම් මත රුපියල් මිලියන 16000/= ක වියදමින් ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත යි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇතැම් ප්‍රදේශවල දැනට පවතින වකුගඩු රෝගය සඳහා හේතුවන උග්‍ර පානීය ජල ගැටලුවට පිළියම් ලෙස පානීය ජල අවශ්‍යතාවට විසඳුම් ලබා දීමට මේ මඟින් ලැබෙන්නේ තවත් ප්‍රතිලාභයක්. ඒ අනුව නුදුරේ දී කුඩා වැව් 300ක් මඟින් පානීය ජලය බෙදා හැරීම සිදු කිරීමට අපේක්ෂිත යි. කුඩාවැව් සංවර්ධනය යටතේ මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමටත් ප්‍රදේශවාසීන්ට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා දහස් ගණනක් උත්පාදනය කිරීමේ හැකියාවත් වයඹ ඇළ ව්‍යාපෘතියේ තවත් ආර්ථික ප්‍රතිලාභයක්. ඒ අනුව දේශීය ආර්ථිකයට වාර්ෂික ව එකතු කරන ආදායම ඉහළ  නංවාලමින් 13000කට ආසන්න ගොවි පවුල් ප්‍රමාණයකට ප්‍රතිලාභ භුක්ති විඳීමට අවස්ථාව ලැබෙනවා. එමෙන් ම අනියම් ලෙස වයඹ පළාතේ පවුල් 40,000කට අධික ව සෙත සැලසෙන බව ව්‍යාපෘති අධ්‍යක්ෂ අසෝක පෙරේරා සඳහන් කරනවා.



කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව, පොල්පිතිගම, අඹන්පොල, මහව, ඇහැටුවැව හා ගල්ගමුව සහ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, නාඋල, ගලේවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට මේ ඇළ ව්‍යාපෘතියෙන් සෙත සැලසෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල කැලය මැදින් මේ ඇළ මාර්ගය ගමන් කිරීම නිසා කුරුණෑගල, මාතලේ, අනුරාධපුරය යා කරමින් වයඹ ඇළ ඉදිවීම විශේෂත්වයක්. මෙහි ඉදිකිරීම් වැඩි වශයෙන් සිදු වන්නේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ආශ්‍රිත ව. මහවැලි ජලය මහකිතුල හා මහකිරිඋල වැව් තුළ පුරවාගෙන ඉඩෝර කාලවලදී බෙදා හැරීමට අපේක්ෂා කරනවා. ඒ අනුව සුරක්ෂිත ජලසැපයුමක් ලබාදීමේ හැකියාව ව්‍යාපෘතිය අවසානයේදී ලැබෙන ප්‍රතිලාභයක්. පරිසර ගැටලු අවම කිරීමට විධිමත් පාරිසරික කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක යි. එය ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට විශාල පිටුබලයක් වන බව කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහදිසාපති ගාමිණී ඉලංගරත්න පෙන්වා දෙනවා.

ඉදිකිරීම් හේතුවෙන් පැන නැඟිය හැකි පාරිසරික ගැටලු පූර්ව අධ්‍යයන කර පරිසර හානි මඟහරවා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, වයඹ පළාත් පරිසර අධිකාරිය හා ආසියානු සංවර්ධන බැංකුවේ සමාජ සුරක්ෂිතතා ප්‍රතිපත්ති අනුකූල ව මෙහි "පාරිසරික කළමනාකරණ සැලැස්මක්" ක්‍රියාත්මක වෙනවා.

ඒ අනුව කහල්ල - පල්ලෙකැලේ අභය භූමියට හෙක්ටයාර් 300ක් පමණ අලුතින් එකතු කිරීම සහ දඹුලු ඔය, මී ඔය හා කලා ඔය ජල පෝෂක ප්‍රදේශ රක්ෂිතයන්හි වන වගා කටයුතු සිදු කිරීම මඟින් වන ආවරණය තුලනය කිරීම සිදු කෙරෙනවා. එසේ ම අභය භූමි ආශ්‍රිත ව ජීවත්වන වනසතුන්ට සංචරණය සඳහා වූ විශේෂ ප්‍රදේශ ඇති කිරීමටත් වනජීවි කලාප ආවරණය වන පරිදි නාට මායිම් යා කිරීම, පවතින විදුලි වැට ශක්තිමත් කිරීම ආදිය සඳහා ඊට අදාළ ආයතනවලට පහසුකම් සලසා දීම ද මේ ව්‍යාපෘතිය මඟින් සිදු කිරීමට නියමිත බව පෙන්වා දෙන්නේ කුරුණෑගල මහදිසාපති ගාමිණී ඉලංගරත්න.

ව්‍යාපෘතියේ බලපෑමට ලක්වන ප්‍රදේශ තුළ වනජීවී කළමනාකරණ සහ අලි මිනිස් ගැටුම් අවම කිරීමේ විශේෂ අධ්‍යයනයක් ආරම්භ කර තිබෙනවා. ඒ අනුව ව්‍යාපෘතිය නිසා උද්ගතවිය හැකි පාරිසරික ගැටලු විධිමත් ව අධ්‍යයනය කර ප්‍රශස්ත විසඳුම් ලබා දීම ව්‍යාපෘතියෙහි "ගැටලු විසඳීමේ ක්‍රමවේදය" මඟින් සිදු කෙරෙනවා. මේ මඟින් ව්‍යාපෘතියේ තිරසර බව වඩාත් තහවුරු කිරීමට හැකි බව යි වනජීවී සැලැස්ම නිර්මාණය කිරීමේ කමිටුවේ සභාපති මහාචාර්ය දේවක වීරකෝන් පෙන්වා දෙන්නේ.

මේ අනුව වයඹ ඇළ මාර්ග ව්‍යාපෘතිය මඟින් සමාජ ප්‍රතිලාභ රැසක් තුදුරේදී භුක්තිවිඳීමේ අවස්ථාව වයඹ ජනතාවට උදාවෙනවා. මේ මඟින් ග්‍රාමීය සංවර්ධනය හා එමඟින් ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීම අපේක්ෂා කළ හැකි යි. කෙසේ වෙතත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී භූමිය අත්පත් කර ගැනීම නිසා ඇතැම් නිවාස හා දේපළවලට බලපෑම් සිදුවීම වළක්වන්නට බැහැ. මොවුන්ට සිදුවන සමාජ බලපෑම් පිළිබඳ ව ව්‍යාපෘතිය "සමාජ ආරක්ෂණ වැඩසටහන" මඟින් අවධානය යොමු කර, සිදුවිය හැකි බලපෑම අධ්‍යයනය කර, නිසි පරිදි වන්දි ලබා දීම හා වෙනත් අමතර සේවා සැපයීමට කටයුතු සැලසුම් කර ඇති බව ව්‍යාපෘති අධ්‍යක්ෂ අසෝක පෙරේරා දෙසතියට පවසනවා.






**කුරුණෑගල දිස්ත්‍රික්කයේ යාපහුව, පොල්පිතිගම, අඹන්පොල, මහව, ඇහැටුවැව හා ගල්ගමුව සහ මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල, නාඋල, ගලේවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවට මේ ඇළ ව්‍යාපෘතියෙන් සෙත සැලසෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ පලාගල කැලය මැදින් මේ ඇළ මාර්ගය ගමන් කිරීම නිසා කුරුණෑගල, මාතලේ, අනුරාධපුරය යා කරමින් වයඹ ඇළ ඉදිවීම විශේෂත්වයක්.**

# ස්වශක්ති


## අදහස් විසිපන්දහසක් බිස්නස් විසිපන්දහසක්

ශ්‍යාමා සන්ධ්‍යානායකගේ

**ආර්ථික ඉදිරි දැක්ම යටතේ 2020 වසර වන විට රැකියා දස ලක්ෂයක් ලබා දීමේ වැඩසටහනේ එක් පියවරක් වශයෙනුයි 'ස්වශක්ති' අදහස් විසිපන්දහසක් බිස්නස් විසිපන් දහසක් නමින් සුවිශේෂී ව්‍යාපෘතියක් හඳුන්වා දී තිබෙන්නේ. මේ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාවට නංවනුයේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යංශය සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව ද එක් වී පෞද්ගලික අංශයේ බැංකු 17ක් ද සහභාගි කර ගනිමින්**

ශ්‍රී ලංකාව සතු මානව සම්පත මනාව කළමනාකරණය කර ආර්ථික සංවර්ධනය සඳහා දායක කර නොගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 4.6%ක සේවා වියුක්තියක් තවමත් (2016 මහ බැංකු වාර්තාව) වාර්තා වෙනවා. එසේ ම රටේ ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍යශක්තිය තිබෙන ශ්‍රම බලකාය අතරින් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ලැබූ අවු. 18ත් - 35ත් අතර පිරිසෙන් බහුතරයක් එනම්, තරුණ විරැකියාව 8.1%ක් වැනි ඉහළ අගයක් වාර්තා කිරීම (2015 ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රමබල සමීක්ෂණ වාර්තාව) සංවර්ධනය වන රටක් වශයෙන් අප ඉදිරියේ තිබෙන විශාල අභියෝගයක්.

මේ නිසා පසුගිය 2012 වසරේ ඔක්තෝබර් මාසයේ සිය ආර්ථික වැඩපිළිවෙළ (ආර්ථික ඉදිරි දැක්ම) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරමින් අග්‍රාමාත්‍යවරයා පෙන්වා දෙන්නේ 2020 වන විට රැකියා දස ලක්ෂයක් ලබා දීමට කටයුතු කරන බව යි. එහි එක් පියවරක් වශයෙනුයි 'ස්වශක්ති' අදහස් විසිපන්දහසක් බිස්නස් විසිපන් දහසක් නමින් සුවිශේෂී ව්‍යාපෘතියක් හඳුන්වා දී තිබෙන්නේ. මේ ජාතික වැඩපිළිවෙළ ක්‍රියාවට නංවනුයේ



ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සමග ශ්‍රී ලංකා මහ බැංකුව ද එක් වී පෞද්ගලික අංශයේ බැංකු 17ක් ද සහභාගී කර ගනිමින්. ඒ යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා එම රැකියා උත්පාදනය සඳහා අවශ්‍ය ණය පහසුකම් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු විසින් සපයනු ලබනවා.

වර්තමාන රජයේ ආර්ථික ප්‍රතිපත්තියට අනුව ආර්ථික සංවර්ධනය පිළිබඳ වගකීම, ආර්ථිකය හැසිරවීමේ බලය හිමි වන්නේ පෞද්ගලික අංශයට හා විදේශ ආයෝජන සඳහා යි. එසේ වුවත් මහා පරිමාණ ආයෝජන සිදු කිරීමට තරම් ශක්තිමත් පෞද්ගලික ව්‍යවසායකයන් පිරිසක් ශ්‍රී ලංකාව සතුව නැහැ. අනෙක් අතට මැදි ආදායම් ලබන රටක් වශයෙන් ආර්ථික වශයෙන් සංවර්ධනය සඳහා නිෂ්පාදන ක්ෂේත්‍රයෙන් වර්ධනයක් ළඟාකර ගැනීම අත්‍යවශ්‍ය කාරණාවක් බව යි ආර්ථික විද්වතුන්ගේ මතය. ඒ සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරි ගන්වමින් ඔවුන්ගේ නිෂ්පාදන වැඩි දියුණු කර ගැනීමට අවශ්‍ය පහසුකම් සලසමින් ඔවුන් ආර්ථික සංවර්ධනයට දායක කර ගත යුතුයි. ඒ සඳහා ස්වශක්ති වැඩසටහන සැබැවින් ම කාලීන අවශ්‍යතාවක් වෙනවා.

තාක්ෂණය, වෙළෙඳපොළ හා මූල්‍ය සම්පත් ලබා දීම මගින් තරුණ තරුණියන්ගේ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීමෙන් කුඩා ව්‍යාපාර ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමත් ඉන් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය හා රැකියා ජනනය කිරීම මඟින් දේශීය ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා දායකවීමක් ස්වශක්ති වැඩසටහනේ මූලික අරමුණ වූ බව යි ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ සුධීර ජයරත්න පවසන්නේ.

ස්වශක්ති වැඩසටහන සඳහා රජය ආයෝජනය කරන මුදල රුපියල් කෝටි 400ක් පමණ. ඊට අමතරව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු විසින් ආයෝජනය කිරීමට අපේක්ෂිත මුදල රුපියල් කෝටි 1200ක්. ඒ අනුව ග්‍රාමීය මට්ටමේ රජයේ රැකියාවක නිරත නොවූ අවුරුදු 18 - 45 අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන්ට, දැනට පවතින එවැනි ව්‍යාපාරයක් තවදුරටත් පුළුල්








කිරීමට අපේක්ෂා කරන අයට, ග්‍රාමීය ව පවතින විශේෂ වූ සම්පත් උපයෝගී කර ගත් ව්‍යාපාර, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය, පරිසර හිතකාමී නිෂ්පාදන වැනි ආර්ථික කටයුත්තක් ආරම්භ කිරීමට නව අදහස් ඇති අයට, කාන්තාවන්ට, තරුණයන්ට උපාධිධාරීන්ට සහ විවිධ හැකියා හා විශේෂ අවශ්‍යතා ඇති අයට මේ සඳහා ඉල්ලුම් කළ හැකි යි. එහිදී ඔවුන් කෘෂිකර්ම, කර්මාන්ත හා සේවා අංශයේ ව්‍යාපෘතියක් තෝරා ගත යුතු වෙනවා.

ඉල්ලුම්කරුවන් තමන් ආරම්භ කිරීමට අදාළ ව්‍යාපෘතියේ වාර්තාව සමග ඉල්ලුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට හෝ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයට ඉදිරිපත් කළ විට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් එම ව්‍යාපෘතිය ඇගැයුමට ලක් කිරීමෙන් පසු ව ණය මුදල ලබා දීමට සුදුසු ව්‍යවසායකයන් තෝරා ගන්නවා. එහිදී නව ව්‍යාපාරික අදහස්වලට, දේශීය අමුද්‍රව්‍ය භාවිතයට, යෝග්‍ය තාක්ෂණය භාවිතයට, පරිසර හිතකාමී බවට ප්‍රමුඛතාව හිමි වන බව යි අධ්‍යක්ෂවරයා පවසන්නේ.

ඒ අනුව තෝරා ගන්නා ලද නව ව්‍යවසායකයකුට මූලික වියදම් සඳහා නැවත අයකර නොගැනීමේ පදනම මත රුපියල් 50,000/=ක මුදලක් මුලින් ලබා දෙනවා. ඉන් අනතුරුව 5.5%ක වාර්ෂික පොලිය අය කර ගැනීමේ පදනම මත උපරිමය රුපියල් 20000/= ක් දක්වා වූ ආරම්භක ණය මුදල ලබා ගත හැකි යි. එමෙන් ම දැනට පවතින ව්‍යාපාර සඳහා හෝ ඒවා වැඩි දියුණු කර ගැනීම සඳහා උපරිමය 250,000/= ක් දක්වා වූ ණය මුදලක් අදාළ බැංකුව වෙතින් ලබාගත හැකි යි. සාමාන්‍ය පොලී අනුපාත යටතේ අවශ්‍ය නම් අතිරේක ණය මුදලක් ලබා ගැනීමට ද හැකියාව පවතිනවා. එසේ ම ව්‍යාපාරයේ ස්වභාවය අනුව ණය අයකර ගැනීමේ සහන කාලයක් ද ඉල්ලුම් කළ හැකි යි. එය ද ඇතුළත් ව ණය මුදල ගෙවා නිම කිරීමට ලැබෙන කාලය වසර 05ක්.

තෝරා ගත් ව්‍යවසායකයන්ට මූලික දැනුම හා කුසලතා සංවර්ධනය උදෙසා දීපව්‍යාප්ත ව වැඩසටහන් මාලාවක් නොමිලේ පැවැත්වීමටත් ව්‍යාපාර සැලසුම් සකස් කිරීමේ වැඩමුළුවක් සංවිධානය කිරීමටත් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය අවශ්‍ය කටයුතු සකස් කර තිබෙනවා.

කෙසේ වෙතත් ස්වශක්ති ආරම්භක අවස්ථාවට සහභාගී වෙමින් ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි පැවසුවේ ස්වශක්ති වැඩසටහනේ මූලික අරමුණ දුප්පත්කම තුරන්කිරීම හා රටේ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම බව යි. ඒ අරමුණින් පසුගිය වසර 05ක කාලය ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත් වීම මත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ඇ.ඩො.මිලියන 79.5ක ව්‍යාපෘති ලබා දී තිබෙන බවත් ඔහු පෙන්වා දෙනවා. ආර්ථික සංවර්ධනයේදී නිෂ්පාදන ආර්ථිකයක් බිහිකර ගැනීමට නම් එහි ආරම්භය ලබා ගත යුතු වන්නේ ග්‍රාමීය මට්ටමින්. මේ කාරණය වත්මන් රජය මැනැවින් හඳුනා ගෙන ඇති බව යි 'ස්වශක්ති අදහස් විසිපන්දහසක් බිස්නස් විසිපන්දහසක්' වැඩසටහන ආරම්භ කිරීමෙන් ම පෙනී යන්නේ.



# තුන්කල් දකින්නී සවියෙන් දිනන්නී

ශ්‍යාමා සන්ධ්‍යානායකගේ

සෑම වසරක ම මාර්තු මස 08 වැනිදාට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනයේ මෙවර තේමාව 'Empower a Woman, Empower a Nation' (කාන්තාව බලගැන්වීම, ජාතිය බලගැන්වීම) යන්න යි. එම තේමාව වඩාත් අර්ථ ගන්වමින් "තුන්කල් දකින්නී සවියෙන් දිනන්නී" 'Consider all Aspect - Her Strength is her Victory'නමින් ශ්‍රී ලංකාව මෙවර කාන්තා දිනය සමරන අතර ජාතික උත්සවය පැවැත්වෙන්නේ මාතර දිස්ත්‍රික්කය ආශ්‍රිතව යි. ඒ සනත් ජයසූරිය ක්‍රීඩාංගනයේ දී ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන්. මීට සමගාමී ව දිස්ත්‍රික්කය ආශ්‍රිත ව, කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් රැසක් ම ක්‍රියාවට නැංවීමට සැලසුම් කළ බව යි ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයේ අධ්‍යක්ෂ චම්පා උපසේන පවසන්නේ.

සෑම වසරකදී ම මෙන් ම මෙවරත් ජාත්‍යන්තර කාන්තා දිනය සැරසිලි සංදර්ශන සහිත ව අති උත්කර්ෂවත් ආකාරයට සංවිධානය කර තිබුණත් සැබැවින් ම ශ්‍රී ලංකික කාන්තාවන්ට නිසි තැන ලැබී තිබෙනවා ද ? ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වී තිබෙනවා ද ? කාන්තාවන්ට එරෙහි හිංසනය, ප්‍රචණ්ඩත්වය මෙන් ම අවම ආරක්ෂාව තහවුරු වී තිබෙනවා ද ? යන කාරණා ඉදිරියේ අප හමුවේ තිබෙන්නේ ප්‍රශ්නාර්ථයක්. මෙරට සංස්කෘතිය බුදුදහමින් පෝෂණය වීමත් ශ්‍රී ලාංකික බෞද්ධයන්ට අතිශය වැදගත් වූ දන්ත ධාතූන් වහන්සේ හා ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම වූයේ කාන්තාවක් විසින් වීමත් නිසා කලාපයේ සෙසු කාන්තාවන්ට සාපේක්ෂ ව මෙරට කාන්තාවට කිසියම් වූ නිදහසක් අයිතිවාසිකමක් හිමිවී තිබුණා ය යන්න පිළිගත යුතු වෙනවා. විශේෂයෙන් ම 1931 දී ඩොනමෝර් ප්‍රතිසංස්කරණයත් සමග අවුරුදු 21ට වැඩි සියලු කාන්තාවන්ටද සර්වජන ඡන්ද බලය හිමි වීමෙන් ම එය මැනවින් පැහැදිලි වෙනවා. ''ලෝකයේ ප්‍රථම අගමැතිනිය ශ්‍රී ලංකාවෙන් පත්කර ගනිමින් ලෝකයට ම ආදර්ශයක් ලබා දීමට හැකි වුවත් වර්තමානයේ බලයට පත්වන දේශපාලන පක්ෂ විසින් සිය පක්ෂයෙන් කාන්තාවන්ට අවස්ථාවන් ලබා දීමේදී පෙන්නුම් කරන්නේ පසුබෑමක්. අතීතයේ සිට වර්තමානය දක්වා ශ්‍රී ලංකික කාන්තාවට දේශපාලනයේ අවස්ථාව ලැබී තිබෙන්නේ පටුල් පසුබිම මතයි. එහෙත් සිදුවිය යුත්තේ පරමාර්ථය හා උගත්කම අනුව එම අවස්ථාවන් ලැබීම යි." මහාචාර්ය හපුආරච්චි පවසනවා. වර්තමාන ශ්‍රී ලංකික ජනගහනයෙන් අඩක් (52%) නියෝජනය කරන්නේ කාන්තාවන්. ලියාපදිංචි ඡන්ද දායකයන්ගෙන් කාන්තාවන්ගේ ප්‍රතිශතය 56%ක් පමණ. එහෙත් පාලන බලය මෙහෙය වීමේදී පොදුවේ මෙරට කාන්තාවන්ට හිමි වී තිබෙන්නේ 4%ක් තරම් අල්ප වූ අවස්ථාවක්. වර්තමානය වන විට පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියන් සංඛ්‍යාව 13ක්. එය ප්‍රතිශතයක් වශයෙන් 5.7%ක්. මේ නිසා දේශපාලන ක්ෂේත්‍රයේදී සිය ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් දිනා ගැනීමට අරගල කළ යුතු මට්ටමට, නීති රීති මඟින් තහවුරු කළ යුතු මට්ටමට පත්වීම සතුටුදායක තත්ත්වයක් නොවෙයි. ඒ අනුව සියලු පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය 25%ක් වන ආකාරයටයි 2016 අංක 01 දරන පළාත් පාලන සංශෝධන පනත මඟින් නීති සම්මත කර තිබෙන්නේ.

සමාජය විශේෂයෙන් ම නිවස තුළ කාන්තාවට නිසි තැන ලබා නොදී දේශපාලනයේදී පමණක් කාන්තා නියෝජනය ඉහළ නැංවීම මඟින් කාන්තාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත වෙන්නේ නැහැ. පුරාණ සාම්ප්‍රදායික



**ඕනෑම සමාජයක යහපැවැත්ම හා ප්‍රගමනය සඳහා කාන්තාව වෙත පැවැරෙන කාර්යභාරය හා වගකීම සුළුපටු නැහැ. ලොව හොඳ ම දේ බිහිවෙන්නේ හිරු එළියෙන් හා අම්මාගේ ලේවලින් යැයි කියන්නේ මේ නිසා.**

සමාජයේ මවක, බිරිඳක, දියණියක ලෙස ඉටු කළ යුතු කටයුතුවලට වඩා පුළුල් වගකීමක් හා කාර්යභාරයක් නිදහස් අධ්‍යාපන ජයග්‍රහණයත් සමග නූතන කාන්තාවට හිමි වී තිබෙනවා. මේ නිසා වර්තමාන ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් 2 958 880ක් එනම්, 36%ක් නියෝජනය කරන්නේ කාන්තාවන්. (2015 මහ බැංකු වාර්තාව) ඉන් රාජ්‍ය සේවයේ 40%ක් ද සෞඛ්‍ය සේවයේ 90%ක් ද ගුරු සේවයේ 73%ක් ද නියෝජනය කරන්නේ කාන්තාවන්. 2014 වසරේ අමාත්‍යංශ ලේකම්වරුන්ගෙන් 20%ක් ද ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් 59%ක් ද කාන්තාවන්. ශ්‍රී ලංකාවට විදේශ විනිමය උපයා දෙන විදේශ රැකියා, ඇඟලුම් හා වැවිලි ක්ෂේත්‍රය යන ප්‍රධාන අංශ 3වම ප්‍රමුඛ දායකත්වය ලැබෙන්නේ කාන්තා ශ්‍රමයෙන්. මැදපෙරදිග සිටින ලක්ෂ 15 කට ආසන්න ශ්‍රම බලකායෙන් අධිකව වඩා සිටින්නේ කාන්තාවන්. මේ ආකාරයට කම්කරු සේවයේ සිට ඉහළ ම වැටුප් ලබන (ගුවන් යානා යාන්ත්‍රික ඉංජිනේරු වැනි) වෘත්තීන්හි නිරත වෙමින් ආර්ථික සංවර්ධනය සඳහා ඇය ලබා දෙන දායකත්වය සුළුපටු නැහැ.

එසේ වුවත් ආරක්ෂක සේවාවල විශේෂයෙන් ම පොලිස් සේවාවේ ඉහළ තනතුරු සඳහා කාන්තාවන්ට ඇති අවස්ථා සීමිත යි. මේ පිළිබඳ අදහස් දක්වන නීතිය හා සාමය දක්ෂිණ සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් ජගත් පී. විජේවීර පවසන්නේ, දැනට ශ්‍රී ලංකා පොලිස් සේවාවේ ඉහළ රැකියා අවස්ථා සඳහා ඉල්ලුම් කිරීමට කාන්තාවන්ට ලැබී ඇති ප්‍රතිපාදන සීමිත යි. මේ පිළිබඳ ජාතික පොලිස් කොමිසමේ අවධානය යොමු කර තිබෙන බවත්, ඔහු පවසනවා. ඉදිරියේදී කාන්තාවන්ට නියෝජ්‍ය පොලිස්පති (DIG) තනතුර දක්වා උසස් වීම් අවස්ථා ලබා දීමට ජාතික පොලිස් කොමිසම කටයුතු කරනු ඇති බවත් ලේකම්වරයා පෙන්වා දෙනවා. 2020 දී ශ්‍රම බලකායේ කාන්තා දායකත්වය 40% දක්වා ඉහළ නැංවීම රජයේ අපේක්ෂාව වුවත් ඊට පෙර මෙවැනි සීමා හා බාධා ඉවත් කිරීම අවශ්‍ය ම කාරණාවක්.

ශ්‍රී ලාංකික සමාජයේ අතීතයේ පටන් ම කාන්තාවට හිමි වූ ගෞරවය හා පිළිගැනීම බැඳී පැවතුණේ මාතෘත්වය සමග යි. මේ නිසා ම එදා සාරධර්ම හා සම්ප්‍රදායන් ඔස්සේ ආරක්ෂා වූ කාන්තාවගේ නිදහස හා සුරක්ෂිතාව අද වනවිට නීතිරීතිවලින් පවා ආරක්ෂා කර ගැනීමට නොහැකි තත්ත්වයට පත් වී තිබෙනවා. වෙළෙඳපොළ අර්ථ ක්‍රමයත් දීර්ඝකාලීන යුද්ධයකට මුහුණදීමත් මාධ්‍ය හා අන්තර්ජාලයේ බලපෑමත් එයට සෘජුව ම හේතු වී තිබෙනවා. ඒ ඔස්සේ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා හිංසනය සැලකිය යුතු මට්ටමින් ඉහළ යාම වර්තමානයේදී සමාජය මුහුණ දෙන බරපතළ ම කාරණාවක්.

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්ය මයුර සමරකෝන් පෙන්වා දෙන්නේ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළදී පවා කාන්තා හිංසනයක් සිදුවන බවට මාධ්‍ය මගින් ප්‍රචාරය වනවා නම් පරිබාහිර තත්ත්වයක් පිළිබඳව සාකච්ඡා කිරීම ද නිෂ්ඵල කාරණයක් බව යි. පොදුවේ ගත්විට කාන්තාවන්ට එරෙහි ව සිදුවන ප්‍රචණ්ඩත්වයට හිංසනය වළක්වා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක වීමේදී දැනට පවතින පසුගාමී ක්‍රමවේදය ක්ෂණිකව ම ක්‍රියාත්මක කළ හැකි මට්ටමට පත් කිරීමත්, කාන්තාවන් දැනුවත් කිරීමත්, ඔවුන් බලාත්මක කිරීමත් අත්‍යවශ්‍ය කාරණයක් බව යි මහාචාර්ය සමරකෝන්ගේ අදහස. නීතියේ සාක්ෂරතාව ඉහළ නැංවීම සියලුදේට වඩා වැදගත් බව යි ඔහු පවසන්නේ.

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ චම්පා උපසේන පෙන්වා දෙන්නේ 2005 අංක 34 දරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත මෙන් ම 1938 කාන්තා උපකාරක දුරකතන සේවාව ද දැනටමත් ක්‍රියාත්මක බව. එසේ ම කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය තුරන් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ යෝජනාවලට ශ්‍රී ලංකාව අනුමැතිය පළකර තිබීමත්. 2015 දී ස්ථාපනය කළ කාන්තා කාර්යසාධන බලකායේ වාර්තාව වර්තමාන රජය විසින් 2016 දී එළි දක්වා තිබීමත් බෙහෙවින් අගය කළ යුතු බව. එම වාර්තාව මගින් ගැහැනු දරුවන් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර තිබෙන බව ද ඇය සඳහන් කළ කාරණයක්. මීට අමතරව ගෘහස්ථ හිංසනයෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් කාන්තාවන් ආරක්ෂා කර ගැනීම සඳහා ග්‍රාමීය මට්ටමින් ආගමික සිද්ධස්ථාන මූල්කරගත් වැඩසටහන් සංවිධානය කිරීම, කාන්තාවන් සඳහා දැනුවත් කිරීමේ හා උපදේශන වැඩසටහන්, ආදායම් උත්පාදන මාර්ග සඳහා පෙලඹවීම මගින් සවිබල ගැන්වීමේ වැඩසටහන් (ණය හා ආධාර), නව යෞවනියන් උදෙසා ජීවන කුසලතා හා ප්‍රජනක සෞඛ්‍ය වැඩසටහන්, විශේෂයෙන් ම අඩුවයස් විවාහ වළක්වා ගැනීම පිළිබඳ උපදේශන සේවා රැසක් මේ වනවිටත් ක්‍රියාත්මක කරන බව අධ්‍යක්ෂ වරිය පවසනවා.

කෙසේ වෙතත් ඕනෑම සමාජයක යහපැවැත්ම හා ප්‍රගමනය සඳහා කාන්තාව වෙත පැවැරෙන කාර්යභාරය හා වගකීම සුළුපටු නැහැ. ලොව හොඳ ම දේ බිහිවෙන්නේ හිරු එළියෙන් හා අම්මාගේ ලේවලින් යැයි කියන්නේ මේ නිසා. එසේ ම සමාජ විරෝධී සමාජ අවගමනයට හේතුවන කාරණාවලදී චෝදනාව සෘජුව ම එල්ල වෙන්නේ ද කාන්තාව දෙසට. අහසට හා කාන්තාවට නිදහසක් නැතැයි කියන්නේ මේ නිසා විය හැකි යි. එහෙත් සිය සීමා, දුර්වලතා මෙන් ම දක්ෂතා හා හැකියා නිවැරැදි ව හඳුනා ගන්නවා නම් පරමාර්ථ උසස් නම් නීති රීති මගින් තහවුරු කරනවාට වඩා වැඩි අවස්ථා වර්තමාන කාන්තා පරපුරට තිබෙන බව යි මහාචාර්ය හපුආරච්චිගේ අදහස.

# පලතුරු හා එළවළුවලටත් තහංචියක්

නිලුපුල් ප්‍රියංකර පෙරේරා

කලක් තිස්සේ ශ්‍රී ලංකාවෙන් මත්ස්‍ය ආනයනයට යුරෝපා සංගමය පනවා තුබුණු තහංචිය ඉවත් කිරීමෙන් ශ්‍රී ලාංකික ධීවර කර්මාන්තයටත්, පොදුවේ රටටත් අත් වුණේ යහපතක්. ඒ අතර ගිය 2014 වර්ෂයේ ලැබුණු නරක ආරංචියක් නම් ශ්‍රී ලංකාවෙන් පලතුරු සහ එළවළු ආනයනයටත් යුරෝපා සංගමයෙන් තහංචි වැටෙන්නට යන බව.

යුරෝපා සංගමය අනතුරු අඟවා තුබුණේ ශ්‍රී ලංකාවෙන් යැවෙන පලතුරු සහ එළවළු පලතුරු මැස්සාගෙන් විශාල ලෙස හානි වී ප්‍රමිතියෙන් පහළ මට්ටමක ඒවා වීම එවන් තීන්දුවක් ගැනීමට හේතු වනු ඇති බව.

2015 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව ඒ වසරේදී රු. මිලියන 4142ක වටිනාකමින් යුත් එළවළු කිලෝ ග්‍රෑම් මිලියන 26ක් යුරෝපා සංගමයේ රටවලට අපනයනය කරලා. එමෙන් ම ඒ වසරේ ම අපනයනය කර ඇති පලතුරු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් මිලියන 33ක්. එහි වටිනාකම රු. මිලියන 5173ක්. විදේශ විනිමය මෙරටට අත්‍යවශ්‍ය ව තිබියදී මේවා අපනයනය නතර කිරීමට සිදු වූයේ නම් එයින් අත් වන්නේ සැලකිය යුතු අයහපතක්.

කෙසේ වුව ද මේ අනතුරු ඇඟවීම දැඩි සැලකිල්ලට ගත් බලධාරීන් ඒ අවදානම වළක්වා ගැනීම සඳහා පියවර ගණනාවක් ම ගෙන තිබීම සතුටට කරුණක්.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය රොහාන් විජේකෝන් ඒ ගැන පැහැදිලි කළේ මෙසේ : "කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන වශයෙන් වැඩසටහන් ආරම්භ කළා. මුලින් ම සොයා බැලුවේ කවුරුන් විසින් අපනයනය කරන ලද එළවළු සහ පලතුරු ද ප්‍රමිතිය පහළ නිසා ප්‍රතික්ෂේප වී ආපසු හරවා එවන ලද්දේ ද කියලා. ඔවුන්ගේ අපනයන බලපත් තහනම් කළා. "

පිටරටට මේවා යවන විට ඒවා ගුවන්ගත කිරීමට පෙර නිරෝධායන අංශයේ පරීක්ෂාවට ලක් කිරීම යි සාමාන්‍ය ක්‍රමවේදය. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා පැවසුවේ ඒ කාර්යය ද පුළුල් හා කාර්යක්ෂම කළ බව. වඩා ඉඩකඩ ඇති ගුවන්තොටුපල අසල ගොනැගිල්ලකට ඒ අංශය ගෙන ගොස් වඩාත් විධිමත් ලෙස ඒ කාර්යයන් ආරම්භ කිරීමෙන් අඩු ප්‍රමිතියෙන් යුත් පලතුරු හා එළවළු අපනයනය කිරීම වැළැක්වීමට හැකි වෙලා.



මැස්සාගෙන් හානි වූ පලතුරු හා එළවළු තෝරා ඉවත් කිරීම වැදගත් වන අතර ම තවත් වටිනා කාර්යයක් වන්නේ මැස්සාගෙන් වන හානි අවම කිරීමට ද පියවර ගැනීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ඒ සඳහා ද පියවර ගත් බව යි අධ්‍යක්ෂ ජනරාල්වරයා පෙන්වා දෙන්නේ.

ඒ අතර වගාවේදී ද සෞඛ්‍යාරක්ෂිත ව සහ හානි සහ උවදුරු අවම වන ආකාරයට කටයුතු කිරීමට ගොවියන්ට උපදෙස් හා පුහුණුව ලබා දීමට ද කෘෂිකර්ම අමාත්‍යංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ප්‍රමිති කාර්යාංශය ද කටයුතු කරන්නේ සම්බන්ධීකරණයෙන් යුතු ව. ආචාර්ය විජේකෝන් ඒ වැඩසටහන ගැන පවසන්නේ: "මෙහිදී සිදු කැරුණේ අන්තර්ජාතික තත්ත්වකරණයට අයත්, යහපත් කෘෂි පිළිවෙත් හෙවත් Good Agricultural Practises (GAP) නම් මිනුම් දර්ශකය හඳුන්වා දීම. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිලධාරීන් 70 දෙනකු මේ වැඩපිළිවෙළ පිළිබඳ ව ගොවියන් දැනුවත් කිරීමට සහ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමට යොදවනු ලැබුවා"

මේ වැඩපිළිවෙළ යටතේ කෘෂි රසායනික සහ අනෙකුත් යෙදවුම් අවම කිරීම සහ වඩාත් පරිසර හිතකාමී තිරසර ගොවිපළක් මාර්ගයෙන් සෞඛ්‍යාරක්ෂිත අස්වැන්නක් ලබා ගැනීම යි අරමුණ.

මේ තත්ත්වය යටතේ අපනයනය කැරෙන එළවළු සහ පලතුරුවල ප්‍රමිතිය හා ගුණාත්මක බව ඉහළ නංවන්නට හැකි වෙලා. අධ්‍යක්ෂ ජනරාල්වරයා අනාවරණය කළේ කලකට පෙර වර්ෂයකට වාර 200ක් හෝ 300ක් හෝ පමණ ශ්‍රී ලංකාවෙන් යැවෙන එළවළු හා පලතුරු යුරෝපා සංගමයෙන් ප්‍රතික්ෂේප වුවත් දැන් එය වසරකට වාර 12ක පමණ අවම මට්ටමකට පැමිණ ඇති බව. ඒවා සිදු වන්නේ ද අවසරයකින් තොර ව ඇතැම් ව්‍යාපාරිකයන් විසින් අපනයනය කැරෙන තොග බව යි පෙනී ගොස් ඇත්තේ.

සැබවින් ම ප්‍රමිතිය හැම විට ම හැම දෙයකදී ම රැකිය යුත්තක් වන අතර විශේෂයෙන් ම විදේශයන් සමඟ කරන ගනුදෙනුවලදී ඒ ගැන වඩාත් පරිස්සම් වීම රටේ අපනයනය වෙළෙඳපොළ රැක ගැනීමට ද අත්‍යවශ්‍ය කරුණක්. ඒ නිසා අපනයනකරුවන් ද දැනුවත් කළ යුත්තේ එය රට වෙනුවෙන් ද ඔවුන්ට පැවරෙන විශාල වගකීමක් බවට.



ජීවිතයක පිය සටහන්

# දනන් හොබවන රනිල්

ගාමිණී පරණයාපා

**දේශපාලනය** යනු කිසිවකුටවත් තවත් කෙනකුට ඉගැන්විය හැකි විෂයක් නොවේ. දේශපාලන විෂය උගන්වන විශ්වවිද්‍යාල, ලෝකයේ කොතෙකුත් ඇතත් ප්‍රායෝගික දේශපාලනයට එය අත්‍යවශ්‍ය වන්නේ නැත. දේශපාලන ක්ෂේත්‍රයේ දේශපාලනඥයන් සේ ම දේශපාලකයෝ ද සිටිති. එහෙත් වැඩි පුර සිටින්නේ දේශපාලකයන් මිස දේශපාලනඥයන් නොවේ. දැනට ජීවත්ව සිටින අතළොස්සක් පමණ වූ ප්‍රවීණ දේශපාලනඥයන් අතර රනිල් වික්‍රමසිංහ යනු ප්‍රමුඛයෙකි. ඒ බව සනාථ කර ඇත්තේ ජනතාව විසින් ම ය. බහු පාක්ෂික දේශපාලන සම්ප්‍රදායකට අයත් ලංකාව වැනි රටක සිව් වරක් ම එක ම පුද්ගලයකු අගමැති ධුරයට පත්වීම ලෙහෙසි පහසු කාර්යයක් නොවේ. රනිල් වික්‍රමසිංහ මහතා ද සිව් වරක් ම ලංකාවේ අගමැති තනතුරට පත්වූයේ ජනතාව ඔහු කෙරෙහි තබා තිබූ විශ්වාසය නිසාම ය. ඒ අතින් ඔහු සම කළ හැකි වන්නේ සිව් වරක් ම ලංකාවේ අගමැතිකම කළ ඩඩ්ලි සේනානායක මහතාට පමණකි.

රනිල් වික්‍රමසිංහ නම් වූ ප්‍රවීණ දේශපාලනඥයාට දේශපාලනයත් පුවත්පත් කලාවත් අලුත් දෙයක් නොවන්නේ එම කරුණු දෙක ම ඔහු මව්පිය දෙපාර්ශ්වයෙන් ම උරුම කරගත් ජන්ම දායාදයක් වන බැවිනි. ඒ නිසා ම දේශපාලනයෙන් සහ මාධ්‍යයෙන් එල්ලවන සියලු ම අසත්‍ය චෝදනාවලට මුහුණ දීමේ ශක්තිය ඔහු සතුව ඇත. ලංකාවට දේශීය පුවත්පත් කලාව හඳුන්වා දුන් නිදහස් සටනේ පුරෝගාමියකු වූ ඩී. ආර්. විජේවර්ධන මහතාගේ දියණිය වූ නාලිනී වික්‍රමසිංහ මැතිනිය සහ ලංකා දේශපාලනයේ මහ මොළකරුවා ලෙස පිළිගැනෙන ජාත්‍යන්තර කීර්තියට පත් පුවත්පත් කලාවේදියකු වූ එස්මන්ඩ් වික්‍රමසිංහ මහතා රනිල්ගේ දෙමව්පියෝ වූහ. 1949 මාර්තු මාසයේ 24 වැනිදා උපත ලැබූ රනිල් තම අධ්‍යාපන කටයුතු නිමාවට පත් කළේ අධිනීතිඥයකු ලෙසිනි. කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහල මාධ්‍යයෙන් උපාධිය ලබා ගත් පිරිස අතරින් ජාතික දේශපාලනයට පිවිස අගමැතිවරයකු බවට පත් වූ පළමු වැන්නා වීමේ වාසනාව හිමි වන්නේ ද ඔහුට ය.

රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලන පැවැත්මෙහි ඇති මූලික ගුණාංග කිහිපයකි. කිසි දිනෙක ප්‍රජාතන්ත්‍රවාදයෙන් බැහැර නොවීම, ජනතාව රැවටීමට බොරු පොරොන්දු නොදීම, දේශපාලන වේදිකාවේ ව්‍යාජ වීර චරිත රඟ නොදැක්වීම, රජයේ දේපළ වංචා නොකිරීම වැනි කරුණු ඒ අතර ප්‍රධාන වෙති. ජනතාවට අවශ්‍ය සැබෑ දේශපාලනය කුමක්දැයි යන්න දැන ගැනීමට නම් රනිල් වික්‍රමසිංහ මහතාගේ දේශපාලනය පිළිබඳ ව විමසා බැලිය යුතු වේ.

අවුරුදු 28ක තරුණයකු ලෙසින් 1977 දී බියගම ආසනයෙන් දේශපාලනයට පැමිණි රනිල් වික්‍රමසිංහ එක්සත් ජාතික පක්ෂ නායකත්වය දක්වා පැමිණි ගමන් මඟ වර්තමාන තරුණ දේශපාලනඥයන්ට ද ආදර්ශයකි. උගත්කම අතින් ද දේශපාලන පළපුරුද්ද අතින් ද පරිපූර්ණ ව සිටි ඔහු තමන්ගේ වාරය පැමිණෙන තෙක් කලබලයකින් තොරව බලා සිටියේ ය. 1994 දී එක්සත් ජාතික පක්ෂයේ නායකත්වයට පත්වන විට ඔහුගේ පක්ෂ ක්‍රියාකාරීත්වයට අවුරුදු 17ක කාලයක් සම්පූර්ණ වී තිබූ අතර එම කාලයෙහි ඔහු දේශපාලනික වශයෙන් ලද අත්දැකීම් රාශියකින් ම පන්නරය ලබා තිබුණි. ජනාධිපති ප්‍රේමදාස මහතා 1993 මැයි 01 වැනිදා කොටි ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරනු ලැබූ අවස්ථාවේදී එවකට සභානායකවරයා වූ රනිල් වික්‍රමසිංහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරමින් ක්ෂණික ව ගත් ක්‍රියාමාර්ගය නිසා ලංකාවේ දේශපාලනය අරාජික නොවන තත්ත්වයකට පත්විය.

ඉන් පසුව 1994 පැවති ජනාධිපතිවරණයේදී පක්ෂ නායක සහ ජනාධිපති අපේක්ෂකයා වූ ගාමිණී දිසානායක මහතා ඇතුළු පක්ෂ නායකයන් කිහිපදෙනකු ම කොටි සංවිධානය විසින් ඝාතනය කිරීමත්, එම මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ ජයග්‍රහණය මහියංගනය ආසනයට පමණක් සීමා වීමත් නිසාත් පක්ෂය රුවල් කැඩීගිය අබලන් වූ නෞකාවක තත්ත්වයකට පත්ව තිබුණි. රනිල් වික්‍රමසිංහ පක්ෂයේ නායකත්වයත් විපක්ෂ නායකත්වයත් භාරගනු ලැබුවේ පක්ෂය මහපොළවට ඇද වැටුණු එවන් අවස්ථාවකදී ය. එතැන් සිට එක්සත් ජාතික පක්ෂය නැවත ගොඩනැඟීමේ භාරදූර කාර්යයට ඔහු පූර්ණ කාලය කැප කළේය. එක්සත් ජාතික පක්ෂය අසරණ වූ අවස්ථාවේදී පක්ෂ නායකත්වය භාර ගැනීමට ඉදිරිපත් වීම ම රනිල් වික්‍රමසිංහ කළ ශ්‍රේෂ්ඨ කැප කිරීමකි. එහි අගය දැනෙන්නේ දැන් ය.

1994 දී ඇද වැටුණු එක්සත් ජාතික පක්ෂයට 1999 ජනාධිපතිවරණයේදී ශක්තිමත් ඡන්ද පදනමක් සකස්කර ගත හැකි වූයේ ද 2001 මහ මැතිවරණයේදී රටේ බලය ලබා ගැනීමට හැකි වූයේ ද රනිල්ගේ තීක්ෂණ බුද්ධියත් දක්ෂ නායකත්වයත් නිසා ය.

1999 රනිල් සහ චන්ද්‍රිකා අතර පැවති ජනාධිපතිවරණ සටනේ ජයග්‍රහණයේ වැඩි වාසිය අත්වී තිබුණේ රනිල් වික්‍රමසිංහ මහතාට ය. එහෙත් කොටි සංවිධානය විසින් චන්ද්‍රිකා බණ්ඩාරනායක වෙත එල්ල කළ බෝම්බ ප්‍රහාරයෙන් ඇයට එක් ඇසක් අහිමිවීම නිසා එවර හමා ගිය දේශපාලන අනුකම්පාවේ සුළං රැල්ල හේතුවෙන් රනිල්ට පරාජයට මුහුණ දීමට සිදු විය. එය රනිල් පරාජය කිරීම සඳහා කොටි සංවිධානයේ නායකත්වය දියත් කළ සියුම් උපක්‍රමයකි.

2001 මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය මැතිවරණය මෙහෙයවූයේ රනිල්ගේ නායකත්වයෙනි. එම මැතිවරණයේදී ඔහු

**අවුරුදු 28ක තරුණයකු ලෙසින් 1977 දී බියගම ආසනයෙන් දේශපාලනයට පැමිණි රනිල් වික්‍රමසිංහ එක්සත් ජාතික පක්ෂ නායකත්වය දක්වා පැමිණි ගමන් මඟ වර්තමාන තරුණ දේශපාලනඥයන්ට ද ආදර්ශයකි. උගත්කම අතින් ද දේශපාලන පළපුරුද්ද අතින් ද පරිපූර්ණ ව සිටි ඔහු තමන්ගේ වාරය පැමිණෙන තෙක් කලබලයකින් තොරව බලා සිටියේ ය.**



සටන් කළේ විධායක බලය අතැති ව සිටි ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ නායකත්වයෙන් යුත් කණ්ඩායමට එරෙහිව ය. ජනතාව එම මැතිවරණයේදී රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් යුත් එක්සත් ජාතික පක්ෂයට පාර්ලිමේන්තුවේ බහුතර බලය ලබා දුන්නේ විධායකය ද පරාජයට පත්කරවමින් ය.

රනිල් වික්‍රමසිංහ මහතාට 2005 ජනාධිපතිවරණයේදී ඉතාමත් සුළු ඡන්ද සංඛ්‍යාවකින් පරාජයට පත්වීමට සිදු වුයේ ඔහු බෙදුම්වාදයට එරෙහි වූ නිසා ය. එම මැතිවරණයේදී රනිල්ගේ ප්‍රතිවාදී අපේක්ෂකයා උතුරේ සහ නැගෙනහිර ද්‍රවිඩ ඡන්ද වැළැක්වීම සඳහා එල්.ටී.ටී. නායකත්වයට රුපියල් දශලක්ෂ 800ක කප්පම් මුදලක් ලබා දීම නිසා උතුරේ සහ නැගෙනහිර ජනතාවට ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව මගහැරී ගියේ ය.

එම මැතිවරණයේදී එල්.ටී.ටී. සංවිධානය රනිල්ට ද කොන්දේසි දෙකක් ඉදිරිපත් කරමින් රහස් පණිවුඩයක් මඟින් දන්වා සිටියේ උතුරේ සහ නැගෙනහිර ඡන්දය ලබා ගැනීමට අවශ්‍ය නම් ඒ වෙනුවෙන් විශාල මුදලක් කප්පම් වශයෙන් ලබා දිය යුතු බවත් ප්‍රභාකරන්ගේ පාලනයට යටත් වන පරිදි උතුරු සහ නැගෙනහිරට වෙන ම පාලන තන්ත්‍රයක් ලබාදෙන බවට පොරොන්දුවක් ලබාදිය යුතු බවත් ය. එම කොන්දේසි දෙක ම ප්‍රතික්ෂේප කිරීම නිසා එම මැතිවරණයේදී රනිල් වික්‍රමසිංහට ඡන්ද ලක්ෂ 1 1/2ක් වැනි සුළු ඡන්ද ප්‍රමාණයකින් පරාජයට පත්වීමට සිදුවිය. බලය වෙනුවෙන් රට පාවා නොදීම රනිල් සතු විශිෂ්ට ගුණාංගයකි. එහෙත් එදා කොටින්ට අතිවිශාල මුදල් කන්දරාවක් කප්පම් ලෙස ලබා දී උතුරු නැගෙනහිර ද්‍රවිඩ ජනතාවට ඡන්දය පාවිච්චි කිරීමේ අවස්ථාව අහිමි කළ පුද්ගලයන් ම එම මැතිවරණයේදී ජනතාවට කියා සිටියේ රනිල් කොටින්ට රට පාවා දීමට කටයුතු කරන බව ය. එය ම ඔවුන්ගේ ප්‍රධාන මැතිවරණ තුරුම්පුව බවට ද පත්ව තිබුණි. ප්‍රභාකරන්ට ද ඕනෑ වී තිබුණේ රනිල් පරාජය කිරීමට ය. 2005 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂට ඡන්දය දීමට ජනතාව පොලඹවන ලෙස ප්‍රභාකරන් තම කණ්ඩායමට ප්‍රකාශ කළ බව තමිළිනී ජෙයකුමාරන් විසින් ලියන ලද "තියුණු අසිපතක සෙවණ යට" නම් වූ පොතෙහි 164 වැනි පිටුවේ සඳහන් කර තිබේ.

රනිල් තරම් කැපකිරීම් කළ දේශපාලනඥයකු වර්තමාන දේශපාලනයේදී සොයා ගැනීමට නොහැකි ය. ඔහු නායකත්වය දෙන්නේ ලංකාවේ තනි ප්‍රබල ම දේශපාලන පක්ෂයට ය. එවැනි පසුබිමක් තිබියදීත් 2010 ජනාධිපතිවරණයේදී ඔහු පොදු අපේක්ෂකයකු වෙනුවෙන් තම අවස්ථාව පූජා කෙළේය. 2015 ජනාධිපතිවරණය යනු රනිල් සතු ජයග්‍රහණය දැස් ඉදිරිපිටදී ම පෙනෙන්නට තිබූ අවස්ථාවකි. එම කාලය වන විට මුළු රට ම ඒකාධිපති වියරුවකින් වැසී ගොස් තිබුණු අතර ජනතාව සතු නිදහස ආඥාදායක පාලකයකුගේ විධායකයට යටවී තිබුණි. රාජ්‍ය පාලනය භීෂණයෙන් හා වංචා දූෂණයෙන් දූෂිත වී ප්‍රජාතන්ත්‍රවාදය මිය යන්නට ආසන්න ව පැවතිණි. එවැනි අවස්ථාවකදී දේශපාලනඥයකු වශයෙන් ද ලංකාවේ ප්‍රබල ම දේශපාලන පක්ෂයේ නායකයා වශයෙන් ද රනිල් වික්‍රමසිංහ මහතා පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාට සහයෝගය දැක්වීමට ඉදිරිපත්වී ඔහුගේ ජයග්‍රහණය වෙනුවෙන් කළ මෙහෙවර තරම් කැප කිරීමක් කළ තවත් දේශපාලනඥයකු පිළිබඳ ව මෙතෙක් දේශපාලන ඉතිහාසයේ කිසි ම තැනක සඳහන් වන්නේ නැත. රනිල් වික්‍රමසිංහ යනු බලලෝභියකු නොවන බව පෙන්නුම් කිරීමට එය ම ප්‍රමාණවත් වන අතර ඒ සඳහා තවත් කාරණා අවශ්‍ය නොවේ. ඔහුගේ එක ම අරමුණ වී තිබුණේ බලය නොව රටත් ජනතාවත් ඒකාධිපති වියරුවෙන් බේරා ගැනීම ය.

එහෙත් රනිල් වික්‍රමසිංහ තරම් බැට කෑ පක්ෂ නායකයකු එක්සත් ජාතික පක්ෂයේ හෝ වෙනත් පක්ෂයක සිටියේ නැත. ඇතැම් පෞද්ගලික රූපවාහිනී නාලිකා ඔහුට දිනපතා ම පහර දුන්නේ වැඩ බැරි නායකයා, ලජ්ජා නැති නායකයා යන විශේෂ මාතෘකා යටතේ ය. එම නාලිකා තම ප්‍රවෘත්ති විකාශයේ වැඩිපුර කාලයක් වෙන් කළේ ද රනිල්ට අපහාස උපහාස කිරීම සඳහා ය. ඒකාධිපති වියරුවේ හස්තයට යටවී තිබූ රජයේ මාධ්‍ය ආයතන ද ඔහුට නිරතුරු ව ම නින්දා අපහාස කෙළේ ය. එහෙත් මේ කිසිවකින් රනිල් වික්‍රමසිංහ සැලුණේ නැත. ඔහු නිහඬ ව ම තම ගමන් මඟෙහි නිරත විය. ඔහුට පක්ෂයෙන් ද පිටතින් ද එල්ල කළ චෝදනා අපහාස ඔහුගේ දෙපා මුල පතිත වූයේ ආශිර්වාද ලෙසින් ය. 2015 පැවති මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරා මෙහෙයවමින් ඔහු තමන්ට වැඩ බැරි නායකයා යැයි කියූ මාධ්‍ය මුදලාලිලාට වැඩ පෙන්නුවේ ය. එහෙත් ඔවුන්ගෙන් පළිගන්නට ගියේ නැත. ඒ අතින් බලන විට රනිල් මහත්මා දේශපාලනයේ ප්‍රතිමූර්තියකි.

ඉන්ද්‍රඛීලයක් සේ නොසැලෙන එවැනි චරිතයකට හිමිකම් කියන රනිල් වික්‍රමසිංහ නම් වූ මේ අසහාය දේශපාලනඥයා 2017 මාර්තු 24 වැනිදා 68 වැනි වසරට පා තබන විට ලංකා දේශපාලනය ද ඔහුගේ කැපවීම ද සමඟ අලුත් ගමන් මඟකට එක්වී ඇත. අද සියලු ජාතීන් අතර ඇති සුහදතාවත්, එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක් ව පිහිටුවා ඇති සංහිඳියාවේ පාලනයත් ඒ කැපවීමේ ප්‍රතිඵල ය. එහි අගය දැනෙන්නේ මිනිසත්කමින් පිරී ගිය හදවත් ඇති ජනතාවට පමණකි.

රනිල් වික්‍රමසිංහ අගමැතිතුමනි. රටටත් ජනතාවටත් සේවය කිරීම සඳහා ඔබට දීර්ඝායුෂ වේවා.

# ලෝකෙට ලොක්කා කොයිබට යන්නේ




ධර්මදාස ගමගේ

**එක්** දහස් නමසිය හතළිස් පහේ සිට පැවත ආ අමෙරිකන් අන්තර්ජාතික නායකත්වය 2017 ජනවාරි 20 වැනි දා ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපති පදවියේ දිවුරුම් දීමත් සමග අවසන් වනු ඇති. එසේ වන්නේ ඔහුට පෙර සිටි නායකයන් සාර්ථක වූ කාරණාවල ඔහු අසාර්ථක වනු ඇති නිසා ම නො වෙයි. අමෙරිකන් බලපෑම නොසලකා හැරීමට තරම් අනෙක් රටවල් බලවත් වීම මෙන් ම කුඩා බලවතුන් සයිබර් අවකාශයේ තමන්ගේ තරමටත් වඩා ඉහළින් බලය පෙන්වීමට සමත් වීමත් යන කාරණා නිසා මෙය නියත වනු ඇති.

පෙනෙන්නට ඇති අනාගතයේ ද සුපිරි බලවතා වනු ඇත්තේ අමෙරිකාව ය. මිලිටරි බලය, ආර්ථික ශක්තිය සහ සංස්කෘතික බලපෑම ලෝකයේ හැම කලාපයකට ම ප්‍රක්ෂේපණය කිරීමට හැකි වන්නේ ද අමෙරිකාවට ය. එහෙත් ට්‍රම්ප්ගේ ජයග්‍රහණය සටහන් කරන්නේ ගෝලීය වෙනස්කම් ද ඇති කරවන, යළි හරිගැස්සිය නොහැකි ආකාරයට අතීතය කඩා බිඳ දැමීමක්.

අඩුතරමින් ලබන අවුරුදු 4 තුළ අමෙරිකාව සහ අනෙක් රටවල් අතර අන්තර්ක්‍රියාකාරකම් නියාමනය වනු ඇත්තේ, "අමෙරිකානු නායකත්වය අමෙරිකාවට සහ ලෝකයට යහපත් ය" යන වැටහීම මත නො ව ට්‍රම්ප්ගේ ගනුදෙනුකාර එළඹුම අනුව ය. අමෙරිකාව මේ මේ දේවල් කරනු ඇති බවට සහ මේ මේ දේවල් නො කරනු ඇති බවට උපකල්පනය කර ඇති දේවල් ගැන අලුතින් ප්‍රශ්න කිරීමට සතුරන්ට හා මිතුරන්ට ද එක ලෙස ම බල කැරෙනු ඇත. ට්‍රම්ප් හුදකලාවාදියකු නො ව ඒකපාර්ශ්විකවාදියෙක්. එ මෙන් ම ඔහු ආඩම්බරකාර ආත්මාර්ථකාමියෙක්. තමන්ට අවශ්‍ය දේ කර ගැනීම සඳහා ජී.7 හෝ ජී.8 හෝ ජී.20 හෝ යොදා ගැනීමට ඔහුට අවශ්‍ය වුවත් ඔහු එසේ කරන්නේ නැත. නායකත්වයක් නැති ලෝකයක් වෙත මාරු වීම **සම්පූර්ණ** වූ බව වැළැක්විය නොහැකි ලෙස ප්‍රත්‍යක්ෂ වන්නක්. මා අවුරුදු 6කට පෙර පුරෝකථනය කළ ජී.0 යුගය දැන් **සම්පූර්ණයෙන්** ම අපට උදා වී ඇත. ට්‍රම්ප් ධවල මන්දිරයේ රැඳී සිටින කාලය කොපමණ වුවත් දැන් තීරණාත්මක රේඛාව පසු කර අවසන්. මේ සිද්ධිය ඔහුගේ ජනාධිපති ධුරය ඉක්මවා ද පවතිනු ඇත්තේ අමෙරිකානුවන් මිලියන දස දහස් ගණනක් මේ අදහසට කැමැති බව ට්‍රම්ප් විසින් ඔප්පු කර ඇති හෙයින්.

ට්‍රම්ප්ගේ "පළමුව අමෙරිකාව" යන එළඹුම මූලික වශයෙන් ම, ලෝකයේ අමෙරිකන් භූමිකාව වෙනස් කරයි. අමෙරිකාව සුවිශේෂී ජාතියක් බවට ට්‍රම්ප් අනෙකුත් පක්ෂ දෙකේ ම නායකයන් සමග එකඟ වන නමුත්, ස්ථිර ලෙස කියා සිටින්නේ දෙ වැනි ලෝක යුද්ධය අවසානයේ සිට ම රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් ජනාධිපතිවරුන් අනුගමනය කරන මාවතේ ම වැටී වැටී යොස් සුවිශේෂී ජාතියක් විය නොහැකි බව. ඔහුගේ තර්කය වන්නේ අත්හැරිය නොහැකි බලවතකුගේ භූමිකාව රඟපෑමේ අමෙරිකන් අභිප්‍රාය සතුරු මිතුරු දෙපාර්ශ්වයට ම ඉඩ සලසන්නේ අමෙරිකන් බදු ගෙවන්නන් මොට්ටයන් ලෙස සැලකීමට බව. "අප වෙනුවෙන් එහි ඇත්තේ මොනවාද?" යන එළඹුම සෙසු ලෝකය සමග ගොඩනගා ගැනීම යි වඩාත් වැදගත් වන්නේ. මෙය ට්‍රම්ප් විසින් පිටු දැකීමට මහත් වෙහෙසක් ගත් විදේශ පිළිවෙතින් දරුණු ලෙස බැහැර වීමක් වන අතර ඔහු ඒ වෙනුවෙන් දිගට ම කටයුතු කරන්නේ ජනාධිපතිවරණයට රුසියාවෙන් බලපෑම් එල්ල වූ බවට නැඟෙන චෝදනා නොසලකා හැරීමෙන් මෙන් ම කලින් ජනාධිපතිවරුන් හැමදෙනා වෙත ම ඉදිරිපත් කැරුණු දිනපතා බුද්ධි අංශ වාර්තා ප්‍රතික්ෂේප කිරීමෙන්. කලින් තුරුම්පු කොළයක් වූ අමෙරිකන් බලය දැන් වල් කොළයක්. කලහකාරී සහ වටිනාකම් රහිත ගෝලීය රටාවකට ස්ථාවරත්වය සහ අගැයීම් ආරෝපණය කිරීමට අවශ්‍ය සුපිරි බලවතකු වෙනුවට අමෙරිකාව පත් ව ඇත්තේ අන්තර්ජාතික අස්ථාවරත්වය පිළිබඳ විශාල ම තනි මූලාශ්‍රය බවට යි.

සාම්ප්‍රදායික බල තුලනයන් මන්ත්‍රීවරුන් විසින් සපයනු ඇතැ යි අපේක්ෂා කිරීම ද උගහට ය. විදේශ ප්‍රතිපත්තිය හසුරුවාලීමට මහා බලයක් ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාට ලැබෙනවා පමණක් නො වේ. සිය පක්ෂ සංවිධානය දිගින් දිගට ම අසාර්ථක වෙද්දී ට්‍රම්ප් දේශපාලන වශයෙන් සාර්ථකත්වයට පත් වී ද ඇති. එ මෙන් ම ඔහු පාක්ෂික ඡන්දදායකයන් අතර ජනප්‍රියත්වය රඳවා ගෙන තිබෙන තාක් කල් බොහෝ රිපබ්ලිකන් කනිෂ්ඨ මන්ත්‍රීවරුන් වගකියනු ඇත්තේ කැපිටල් හිල්හි තම නායකයන්ට නො ව ජනාධිපතිවරයාට යි. ට්‍රම්ප්, පළිගැනීමේ චේතනාවෙන් ද, නව නීති පැනවීමට ද, සිය විශ්වාසවන්තයන් තම නායකත්වය පසුපස කැඳවා ගැනීමට ද ධවල මන්දිරය යොදා ගනු ඇති බව අපේක්ෂා කරයි. විශේෂ ලැදිකම් සලකන විට ට්‍රම්ප් වෝල් ස්ට්‍රීට්, සිලිකොන් වැලි හෝ මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට හෝ වැඩි ණයක් නැත. ඒ, ඔවුන් බහුතරයේ සහාය ට්‍රම්ප් වෙත නො ලැබුණු බැවින්. එක්සත් ජනපදයේ ඉහළ ව්‍යාපාරික ප්‍රජාවේ වඩාත් ම ලිබරල් පිරිස වන්නේ විශේෂයෙන් ම කාර්මික පන්තියේ අය යි. කැලිෆෝනියාවේ, සැන් බර්නාඩිනෝ ප්‍රහාරකයන්ගේ ජංගම දුරකතනවලට බලහත්කාරයෙන් ඇතුළු වී දත්ත ලබා ගැනීමට එෆ්.බී.අයි. ආයතනය දැරූ උත්සාහය අවහිර කිරීම ගැන ඇපල් සමාගම ලක් වුණේ ට්‍රම්ප්ගේ දැඩි විවේචනයට. ඒ අනුව සිතා ගත හැක්කේ ඉදිරියේදී සිලිකොන් වැලි සහ ට්‍රම්ප්ගේ ධවල මන්දිරය අතර රණ්ඩු සරුවල් බොහෝමයක් හට ගත හැකි බව. මහා පරිමාණ ව්‍යාපාරිකයන් ද්‍රෝහීන් හැටියට ට්‍රම්ප්ගේ චෝදනාවට ලක් වන අතර විශේෂයෙන් සිය ව්‍යාපාර හා කර්මාන්ත විදේශයන්හි ස්ථාපිත කිරීම මගින් අමෙරිකානුවන්ට ලැබිය යුතු රැකියා අහිමි කිරීම ගැන එක් එක් අයට වෙන වෙන ම දඬුවම් කරන බවට යි තර්ජනය කළේ.

**පෙනෙන්නට ඇති අනාගතයේ ද සුපිරි බලවතා වනු ඇත්තේ අමෙරිකාව ය. මිලිටරි බලය, ආර්ථික ශක්තිය සහ සංස්කෘතික බලපෑම ලෝකයේ හැම කලාපයකට ම ප්‍රක්ෂේපණය කිරීමට හැකි වන්නේ ද අමෙරිකාවට ය. එහෙත් ට්‍රම්ප්ගේ ජයග්‍රහණය සටහන් කරන්නේ ගෝලීය වෙනස්කම් ද ඇති කරවන, යළි හරිගැස්සිය නොහැකි ආකාරයට අතීතය කඩා බිඳ දැමීමක්.**

බ්‍රෙක්සිට් හෙවත් බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීම ට්‍රම්ප් ජනාධිපතිවරයා විසින් කදින් ම වැළඳ ගනු ලැබීමෙන් යුරෝපා ආණ්ඩු පත් වුණේ වික්ෂිප්තභාවයට. ඒ අතර රුසියාව කෙරෙහි මිත්‍රශීලී පිළිවෙතක් දැරීම නිසා, නේටෝ රටවලට විකල්ප ආරක්ෂාවක් සොයා ගැනීම සඳහා යුරෝපා රටවල් පත් ව ඇත්තේ හතර ගාතෙන් ඇද වැටුණු තත්ත්වයකට. අන්තර්අත්ලාන්තික් සබඳතා 1930 සිට බලන විට දැන් පත් ව ඇත්තේ අන්තිම පහළ තලයකට. ආසියාව ගැන සලකන විට චීනය කෙරෙහි ට්‍රම්ප් අනුගමනය කරන ගැටුම්කාරී ක්‍රියාකලාපය චීනයේ නැගීමට එරෙහි වීමට දීර්ඝකාලීන හේතු ඇති ජපානය හා ඉන්දියාව වැනි මිතුරන් සමග අමෙරිකන් සබඳතා ඉහළ යාමට හේතු වනු ඇති. එහෙත් ගෝලීය ආර්ථිකයේ අනාගතය පිළිබඳ වඩාත් ම වැදගත් සබඳතාව වන චීනය සමග සබඳතා පවත්වා ගැනීමට චොම්ංටනයට දැනටමත් අසීරු බව යි පෙනී යන්නේ. අවදානම පිළිබඳ රතු සංකේතය මට්ටමට උතුරු කොරියාව පැමිණි විට එසේ වනු ඇති බව සහතිකය. අමෙරිකාව හා චීනය එක් ව කටයුතු කිරීමට දැරෙන උත්සාහයන් ද සංකීර්ණ වනු ඇත.

එහෙත් ඩොනල්ඩ් ට්‍රම්ප් පත් වීම වනාහි ආරාවුල සහ (ජී.0 මට්ටමට වැටුණු) අස්ථාවරත්වය පිළිබඳ අලුත් ම මූලය යි. යමක් ඉෂ්ට කර ගැනීමට අවශ්‍ය තරම් ජනප්‍රියත්වයක් ඇති ලෝක නායකයන්, විශේෂයෙන් යුරෝපයේ නායකයන්, අද සිටින්නේ ස්වල්ප දෙනෙකි. ඒ අතර බොහෝ යුරෝපා සංගම් රටවල් සිසාරා යන ජනප්‍රිය රැල්ල විසින් ප්‍රශ්න කරනු ලබන්නේ ලෝකයේ උසස් ම කාර්මික ප්‍රජාතන්ත්‍රවාදී රටවල පාලන ප්‍රතිපත්ති හා ආයතනවල සුජාතකත්වය යි. ප්‍රංශ මැතිවරණය 2017 පැවැත්වෙන අතර ඊට මුහුණ දෙන්නේ ඉතා දුර්වල ජනාධිපතිවරයෙකි. එයට ඉදිරිපත් වන ප්‍රධාන පෙළේ තරගකරුවකුගේ ස්ථාවරය නම් යුරෝපා සංගමයෙන් ඉවත් විය යුතු බව. යුරෝපා සංගමයේ සාකච්ඡාකරුවන් සහ බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ නියෝජිතයන් යන දෙපාර්ශ්වය ම දැඩි ලෙස ම තම තමන්ට වැඩි වාසි අපේක්ෂා කරන අතර බ්‍රෙක්සිට් සාකච්ඡා සිදු කැරෙන වසර දෙකවත් බ්‍රිතාන්‍ය අගමැතිනි තෙරේසා මේට සිය බෙදුණු රට ඉදිරියට ගෙන යා හැකි ද යන්න සැක සහිත යි.

ජර්මනියේ වෙනත් සිත් ඇද ගන්නා විකල්පයක් නොමැතිකම නිසා ඇන්ජෙලා මර්කල් තනතුරේ රැඳී සිටිනු ඇති මුත්, මැදපෙරදිගින් එන සංක්‍රමණිකයන් පිළිබඳ විවෘත පිළිවෙතට රට තුළ ඇති විරෝධය ඇය දුර්වලත්වයට යි පත් කරනු ඇත්තේ. ඉතාලියේ මතියෝ රෙන්සිගේ දේශපාලන ප්‍රතිසංස්කරණ ජනමත විචාරණය දේශපාලනය කෙලින් කළ අතර ප්‍රතිඵලය වුණේ වසර 70ක් තුළ 64 වැනි ආණ්ඩුව ද අභාවයට පත් වීම. ග්‍රීසියේ මූල්‍ය අර්බුදය ද එසේ ම ය. යුරෝපා සංගම් දේශපාලනය කැළැත්තූ, බලාපොරොත්තු සුන් වූ ජනතා ප්‍රවාහය නැවත ඇති නො වනු පිණිස, සිරියානු සරණාගතයන්ගේ පැමිණීම සීමා කිරීමට තුර්කිය සමග ඇති කර ගත් ගනුදෙනුව නො වෙනස් ව තිබෙන නමුත් 2017 වර්ෂයේ යුරෝපා සංගමයට ඇත්තේ දුෂ්කර මාවතක්.

අවදානම වැඩියෙන් පුම්බනු ලැබූ තැන් තිබුණත්, සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ පෙනුම නම් එතරම් දීප්තිමත් නැත. ඉන්දියාව හා පාකිස්ථානය කාශ්මීර දේශ සීමාවේ මෑත ඇති කර ගත් ගැටුම් ප්‍රධාන ප්‍රවෘත්ති බවට පත් වුව ද, දෙ රටට ම අවශ්‍ය වී ඇත්තේ තම රටවල් ඇතුළත වේදනාකාරී පීඩාවන් ඇති වන ඒ ගැටුම් උත්සන්න වීම වළක්වා ගැනීමට ය. ලෝකයේ විශාලතම මුස්ලිම් රාජ්‍යය වන ඉන්දුනීසියාවේ අගනුවර ක්‍රිස්තියානි ආණ්ඩුකාරයා මුස්ලිම් වියරුව කුද්දනු ලැබූ නමුත් ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමටත්, තදබල අවශ්‍යතාවක් වන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමටත් ජෝකෝ විඩෝඩෝ දිගට ම පියවර ගනිමින් සිටී.

අභ්‍යන්තර දේශපාලන ඒකාධිකාරිය පවත්වා ගැනීමටත්, කැමැති කොටස්කරුවන්



සමග ශක්තිමත් අන්තර්ජාතික සබඳතා වර්ධනය කර ගැනීමටත් තමන්ගේ ඇති හැකියාව ගැන චීනයේ ඉහළ පෙළේ නායකයන් වඩ වඩාත් විශ්වාසයට පත් ව ඇත. මීළඟ සරත් සෘතුවේදී නායකත්ව වෙනසක් කිරීමට නියමිත වන අතර ඉන්පසු බීජිංහි වඩාත් ඉහළ මට්ටමේ ආතතියක් නිර්මාණය වීමට ඉඩ තිබේ. එමෙන් ම චීනයේ ආර්ථිකය අනපේක්ෂිත අනතුරුදායක තත්ත්වයක් පෙන්නුම් කළහොත් චීන නායකයන් වෙතින් වඩාත් යුදකාමී ක්‍රියාකලාපයක් පෙන්නුම් කිරීමට ඉඩ තිබේ. මේ පසුතලය සමග තායිවානය පිළිබඳ ට්‍රම්ප්ගේ විදෙස් පිළිවෙත සහ එදිරිවාදී එළඹුම කුතුහලයක් උත්පාදනය කරනු ඇත.

ව්ලැඩිමියර් පුටින් මොස්කව්හි සිය නායකත්වය ඉතා ශක්තිමත් ව දරා ගෙන සිටින අතර ට්‍රම්ප්ගේ ජයග්‍රහණය ධවල මන්දිරය සමග වඩා හොඳ සබඳතා සඳහා සපයනු ලැබුවේ අනපේක්ෂිත පාරිතෝෂිකයක්. බටහිර සම්බාධක 2017 වර්ෂයේ දී ඉවත් කිරීම හෝ ලිහිල් කිරීම හෝ දැකිය හැකි වනු ඇත. එහෙත් දසකයකට පෙර රුසියන් ආර්ථිකය අභිවෘද්ධියට පත් කළ ඉහළ මට්ටමට තෙල් මිල පත් නො වනු ඇති අතර එය ඇති කරන්නේ පුටින්ට ද සාධනීය උත්තරයක් නැති දිගුකාලීන අවදානමක්. 2017 දී දරුණු අර්බුද වැළැක්වීම සඳහා පුටින්ට ඕනෑවටත් වඩා දේශපාලන හා මූල්‍ය ප්‍රාග්ධනය තිබේ. එහෙත් රුසියාවේ බලශක්ති සහ මූල්‍ය සංචිතවල දිගුකාලීන බාදනයන් අන්තර්ජාතික වික්ෂේපයන් ඇති කිරීම සඳහා පුටින්ට අවසානයේදී හොඳ හේතු සපයා දෙනු ඇත. ට්‍රම්ප් සහ මෙක්සිකෝව අතර එදිරිවාදිකම් දැනටමත් පටන්ගෙන ඇත්තේ අරියාදු ඇවිලවීමට. වෙනිසියුලාවේ ආර්ථික අර්බුදය සහ දේශපාලන කට්ටන ගමන් කරමින් සිටින්නේ ප්‍රබල ප්‍රචණ්ඩකාරී වාතාවරණයකට ය.

පුටින් මෙන් සිය අධිකාරී බලය ව්‍යාප්ත කරමින් සිටින තුර්කියේ ටයියුප් එර්ඩොගන්, ආගමනිකයන් සීමා කිරීම සඳහා ඔහුගේ හොඳ හිත අපේක්ෂා කරන යුරෝපා සංගම් නායකයන් කෙරෙහි වර්ධනය කර ගනිමින් සිටින්නේ එදිරිවාදිකම් ය. අපකීර්තියට පත් ව සිටින දකුණු අප්‍රිකානු නායකයා තවදුරටත් පක්ෂග්‍රාහී හැඟීම් කුළුගන්වමින් සිටී. රටේ දේශපාලන සංස්කෘතිය බවට පත් ව ඇති විරෝධතා මේ වන විට පත් ව ඇත්තේ ප්‍රචණ්ඩකාරී බවට.

ජී.0 පීඩනය, මැද පෙරදිගට තරම් අන් කිසි ම කලාපයකට තදින් දැනෙන්නේ නැත. සවුදි අරාබිය සලකන කල, තෙල් මිල පහළ යාම, ඉරානයට එරෙහි සම්බාධක ඉවත් කිරීම, විශ්වාසවන්ත මිතුරන්ගේ හිගය සහ රාජකීයයන් අතර ම විරසකතා යන කාරණා නිර්මාණය කරමින් සිටින්නේ අන් කවරදාටත් වඩා ඉහළ මට්ටමේ ආතතියක්. යේමනයේ සහ සිරියාවේ මිනිස් ඝාතන දිගට ම සිදු වෙනවා. අවසානයේ අයි.එස්. අයි.එස්. හමුදාමය පරාජයට පත් වූ පසු දිවි බේරා ගත් සටන්කාමීන් මැද පෙරදිග, උතුරු අප්‍රිකාව, නැගෙනහිර අප්‍රිකාව, ගිනිකොනදිග ආසියාව, යුරෝපය, රුසියාව සහ වෙනත් රටවලට විසිර යන්නේ ජිහාඩ් සටන් දියත් කිරීම සඳහා නව අවස්ථා සහ සටන්බිම් සොයමින්.

අමෙරිකාව ලෝකයට නායකත්වය දීමෙන් ඉවත් වන අතරතුර ඒ අඩුව පිරවීමට කිසිවකු ඉදිරිපත් වන්නේ නැත. ආසියාවේ, අප්‍රිකාවේ සහ ලතින් අමෙරිකාවේ චීන ආයෝජන දුසිම් ගණනක් රටවල චීන බලපෑම ඉහළ නංවන අතර දැවැන්ත වෙළෙඳ ගනුදෙනුවක් වන "අන්තර් පැසිෆික් හවුලෙන්" ඉවත් වීමට ට්‍රම්ප් තීරණය කිරීම චීනයට ලබා දෙන්නේ කලාපීය වෙළෙඳ සබඳතා ජාලය ව්‍යාප්ත කිරීමට කදිම අවස්ථාවක්. එසේ වුව ද අමෙරිකාවේ මිලිටරි ව්‍යාප්තිය හෝ සංස්කෘතික ආකර්ෂණය හෝ සමග සමවීමට චීනයට නොහැකි ය. චීනය බලශක්තිය, ආහාර හෝ නවීනතම ඉහළ තාක්ෂණය නිපදවන්නෙක් නො වේ. චීන නායකයන්ට සිය රටේ අභ්‍යන්තර කටයුතු ගැන පූර්ණකාලීන ව කැපවීමට යි සිදු ව තිබෙන්නේ. ඔවුන්ගේ අභ්‍යන්තර දේශපාලන ඒකාධිකාරිය පවත්වා ගෙන යාම සඳහා රටේ ආර්ථිකය නො කඩවා සංවර්ධනය වන බව හා නවීකරණය වන බව සහතික කිරීමට සිදු ව තිබේ. අමෙරිකාව තවදුරටත් රඟපාන්නේ නැති නායකත්ව භූමිකාව භාර ගැනීමට හැකි හා කැමැති, මතු වී එන නායකත්වයක් සූදානම් ව නැති බව යි යථාර්ථය.

මුළු ලොව පුරා ම අන්තර්ජාතික සහයෝගීතාව විනාශ කරමින්, ජනප්‍රියත්වවාදය මධ්‍යම රාජ්‍ය භූමිකා වෙතින් ප්‍රාදේශීය නිලධාරීන් වෙත බලය නිකේන්ද්‍රණය කරනු ඇත. මේ කේන්ද්‍රිය යුරෝපා සංගමය, නේටෝව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි ජාතික සීමාවන් ඉක්මවා යන ආයතනවල අධිකාරිත්වය පීඩාවට පත් කරනු ඇත. තාක්ෂණික වෙනස්වීමේ වේගය ආණ්ඩුවලට ආණ්ඩු කිරීමේ හැකියාවට තර්ජනයක්. දිගින් දිගට ම ඉහළ යන ප්‍රධාන තීරණ ගණනාවක් ම ගනු ලබන්නේ රාජ්‍ය නොවන දත්ත පිපාසිත සමාගම්, හැකරුන්, දේශපාලන උනන්දුවෙන් යුත් කණ්ඩායම් සහ ත්‍රස්තවාදීන් විසින්.

අන්තර්ජාතික අනුපිළිවෙළ ගිලිහී යන්නට යි පටන් ගෙන තිබෙන්නේ. පසුගිය වසර 8 ඇතුළත ලෝකය අත්දුටුවේ, දසක ගණනාවක දරුණු ම ආර්ථික අර්බුදය, ගෝලීය ආර්ථික අවපාතය, යුරෝ කලාපයේ ඓතිහාසික ණය අර්බුදය, උතුරු අප්‍රිකාවේ සහ මැදපෙරදිග හරහා හමා ගිය නොසන්සුන්කාරී රැල්ල, සිරියාවේ සිවිල් යුද්ධය, යුරෝපයේ විවෘත දේශසීමාවල අනාගතය ප්‍රශ්න කැරෙන ආගමනික අර්බුදය, රුසියාව හා යුක්රේනය අතර යුද්ධය, බ්‍රෙක්සිට්, සයිබර් ආක්‍රමණයේ පුපුරා යාම සහ ඩොනල්ඩ් ට්‍රම්ප් නාමැත්තකු

අමෙරිකාවේ ජනාධිපති ලෙස තේරී පත් වීම යි.

කෙටිකාලීන ව, ඊට අයත් කොටසට වඩා බෙහෙවින් වැඩි තීරණාත්මක දේශපාලන නිමේෂයන් 2017 වර්ෂය විසින් අත්දකිනු ඇත. බෙහෙවින් පූර්වාපේක්ෂිත ව සිටි ප්‍රංශ ජනාධිපතිවරණය එළඹෙන වසන්තයේ පැවැත්වෙන්නේ යුරෝපයේ බල කණුවක් ලෙස රටේ අනාගතය පරදුවට තබමින්. අන්ත දක්ෂිණාංශික ජාතික පෙරමුණේ මෙරීන් ලේ පෙන් යුරෝපා ජනප්‍රිය රැල්ල මතින් ජයග්‍රහණය කරන්නට බලාපොරොත්තු තබා ඇත්තේ, සමස්ත යුරෝපා සංගම් ව්‍යාපෘතින්ට ම මළ බෙර නාදවමින්. එළඹෙන සරත් සෘතුවේදී ජර්මන් ජනාධිපතිවරණය පැවත්වෙන අතර බටහිර ලිබරල් වටිනාකම් පිළිබඳ අවසන් ජයග්‍රාහිකාව ලෙස සැලකෙන චාන්සලර් මර්කල් අපේක්ෂා කරන්නේ නැවත ජයග්‍රහණය කිරීමට. අමෙරිකන් ජනාධිපතිවරණයේදී සිදු කරන ලදැ යි සැක කැරෙන ආකාරයට මේ රටවල් දෙකේ ම ජනාධිපතිවරණවලදී රුසියන් හැකරුන් විසින් ඒවා කඩාකප්පල් කරනු ඇද්ද යන බිය මේ රටවල් දෙකට ම ඇති ව තිබේ.

ඉරානයේ ද ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත අතර ඒ රටේ ප්‍රතිසංස්කරණවාදීන් හා දැඩි මතධාරීන් අතර මතභේද උග්‍ර විය හැකි බව ද සැලකෙන්නක්. රුසියාව, සවුදි අරාබිය, වෙනිසියුලාව සහ තෙල් නිපදවන අනෙකුත් රටවල තෙල් මිල පහළ මට්ටමක පැවතීම නිසා ආර්ථිකයට ඇති වී තිබෙන තර්ජනවලට විසැඳුම් සෙවීමට යි, ඒ රටවලට සිදු ව තිබෙන්නේ. තුර්කිය හා යුරෝපය අතර සරොස් බස් නිසා යුරෝපා දේශ සීමා හරහා ආගමනිකයන් සංක්‍රමණය වීම ඉහළ යාමේ නව තර්ජනයක් ජනිත වනු ඇත. චීන නායකත්වය මාරු වීම බීජිං පත් කරනු ඇත්තේ කලාපීය මෙන් ම අන්තර්ජාතික දේශපාලනයේ ද පුරෝකථනය කළ නො හැකි අයකු බවට.

ජනාධිපති ට්‍රම්ප් අමෙරිකා එක්සත් ජනපදය දියත් කරනු ඇත්තේ මාර්ග සිතියම් නැති මුහුදකට ය.

(2017 ජනවාරි 02 වැනි දා "ටයිම්" සඟරාවට ඉයන් බ්‍රෙමර් ලේඛකයා ලියූ ලිපියකිනි)

# සසිකලාට (පරා)ජය



ධර්මදාස ගමගේ

**තමිල්නාඩු** ආණ්ඩුව ද අර්බුදයට යා හැකි ලකුණු පෙන්වමින් පාලක ඒ.අයි.ඒ.ඩී.එම්.කේ. පක්ෂය තුළ පැවැති ගෝරනාඩුව සුබදායී ලෙස අවසන් වුණේ 2017 පෙබරවාරි 14 වැනි දා චෙන්නායි ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුවක් නිසා. පක්ෂයේ මහ ලේකම් පදවියට පමණක් නො ව මහ ඇමති පදවියට ද පොර ඇල්ලූ ජයලලිතාගේ ගජ මිතුරිය වන සසිකලාට මේ නඩු තීන්දුව අනුව හිමි වන්නේ මහ ලේකම් පදවිය සහ මහ ඇමැති පුටුව නො ව හිර ගෙදර පැදුරු කැබැල්ලක්. සිර දඬුවම වසර 4ක් වන අතර වසර 10ක් යන තුරු ප්‍රජා අයිතිය අහිමි වන නිසා දේශපාලනය ද තහනම්.

ඒ නඩු තීන්දුව පසුගිය දිනවල පැවැති ආරාවුල පිළිබඳ ව නො ව 1996 වසර තරම් ඈතට දිවෙන, ජයලලිතා, සසිකලා හා ඔවුන්ගේ ඥාතීන් දෙ දෙනකුට එරෙහි ව පැවැති දූෂණ චෝදනාවක් පිළිබඳ ව. එය මූලික නඩු විභාගයක් නො ව යථෝක්ත චෝදනාවලින් ඒ පිරිස නිදහස් කරමින් කර්ණාටක මහාධිකරණය දුන් නඩු තීන්දුවට එරෙහි ව කර්ණාටක ආණ්ඩුව ඉදිරිපත් කළ අභියාචනය විභාග කොට ලබා දුන් තීන්දුව යි. අභියාචනය ප්‍රතික්ෂේප වී කලින් නඩු තීන්දුව යළි බලගැන්වීම යි මෙහි දී සිදු වුණේ.

කලින් නඩු තීන්දුව 2014 සැප්තැම්බර් 27 වැනි දා ලබා දුන්නේ කර්ණාටක විශේෂ අධිකරණය විසින්. ඒ අනුව නියම කැරුණේ වසර 4ක සිර දඬුවම්. එමෙන් ම ජයලලිතාට නියම කැරුණේ රු.කෝටි 100ක දඩයක් ද ගෙවන ලෙස.

ඒ නඩුව පැවරුණේ 1996 වර්ෂයේදී, එවක ජනතා පක්ෂයේ නායකයා වූ සුබ්‍රමනියම් ස්වාමි. එයින් ඔහු චෝදනා කළේ ජයලලිතා මහ ඇමැතිනි ව සිටි 1991 - 1996 කාලය තුළ රු.කෝටි 66.65ක දේපළක් අයුතු ලෙස අත් කර ගැනීමෙන් දූෂණයක් සිදු කර ඇති බවට.

කර්ණාටක මහාධිකරණය, ජයලලිතා ඇතුළු පිරිස සියලු චෝදනාවලින් නිදහස් කළේ 2015 මැයි 11 වැනි දා. කර්ණාටක ආණ්ඩුව 2015 ජූනි 23 වැනි දා ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළේ යථෝක්ත තීන්දුවට එරෙහි ව. අභියාචනය පිළිබඳ ව කුමන තීන්දුවක් ලැබේවි ද යන අවිශ්වාසය තිබියදී යි ජයලලිතාගේ අභාවයෙන් පසු සසිකලා ජයලලිතාගේ බලතල සියතට ගැනීමට පොර බැදුවේ. සිය පක්ෂයේ බහුතරයකගේ මෙන් ම තමිල්නාඩුවේ ආණ්ඩු පක්ෂයේ බහුතරයකගේ සහාය ලබා ගැනීමට කුමන අයුරකින් හෝ ඇය සමත් වූ බව යි පෙනී ගියේ.

ගිය දෙසැම්බර් 29 වැනි දා රැස් වූ පක්ෂය යෝජනා 14ක් සම්මත කළ අතර ඉන් එකකින් කියැවුණේ අලුත් මහ ලේකම් කෙනකු පත් කරන තුරු වැඩ බැලීමට සසිකලා පත් කැරෙන බව. මේ අතර පෙබරවාරි 05 වැනි දා රැස් වූ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් තීන්දු කළේ තම කණ්ඩායමේ නායකත්වයට ද සසිකලා පත් කළ බව. ඒ අනුව ඇය සුදුසුකම් ලබන්නේ මහ ඇමැතිනිය වීමට.

ජයලලිතා රෝහල්ගත කළ පසු වැඩ බලන මහ ඇමැති පදවියට පත් වූ ඕ.

පනීර්සෙල්වම් මහ ඇමති ධූරයෙන් ඉල්ලා අස් වුණේ සසිකලාට ඉඩ සලසනු වස්. එසේ වුව ද ටික දිනකට පසු ඔහු පියවර ගත්තේ සසිකලාට විරුද්ධ ව කඳවුරක් ගොඩ නැඟීමට. ආරාවුල් තත්ත්වයක් හට ගත්තේ ඒ අනුව.

පනීර්සෙල්වම් ප්‍රකාශ කළේ තමාට කළ දැඩි බලපෑම් නිසා තමාට ඉල්ලා අස් වීමට සිදු වූ බව. එමෙන් ම ඇය වැඩ බලන මහ ලේකම් ලෙස සහ ආණ්ඩු පක්ෂ ප්‍රධානියා ලෙස පත් වුණේ ද බලපෑම් කිරීමෙන් බව යි ඔහුගේ චෝදනාව වුණේ. එසේ වුව ද සසිකලා ප්‍රකාශ කළේ ඒ කතාවලින් වැඩක් නැති බව සහ ප්‍රාන්ත ආණ්ඩුවේ ඒ.අයි.ඒ.ඩී.එම්.කේ. මන්ත්‍රීවරුන් 129 දෙනකුගේ ම කැමැත්ත තමන්ට ඇති බව.

ආරාවුල් තත්ත්වයක් ඇති වෙද්දී සසිකලා කළේ දැඩි තීරණ ගැනීම මඟින් පනීර්සෙල්වම් කඳවුර ලත් තැන ම ලොප් කර දැමීමට උත්සාහ දැරීම. පනීර්සෙල්වම් දැරූ පක්ෂයේ භාණ්ඩාගාරික තනතුරෙන් ඔහු ඉවත් කරනු ලැබුවේ දෙ වරක් නො සිතා. පක්ෂයේ බැංකු ගිණුම් තමන්ට මිස අන් අයට හැසිරවිය නොහැකි බවට පනීර්සෙල්වම් වහා ම බැංකුවලට දැනුම් දුන්නේ තම ඉවත් කිරීම නීති විරෝධී බව අවධාරණය කරමින්. කිසිවකු තනතුරකින් ඉවත් කිරීමට හෝ පත් කිරීමට හෝ තාවකාලික මහ ලේකම් කෙනකුට පක්ෂ ව්‍යවස්ථාව අනුව බලයක් නැති බව යි ඔහු පෙන්වා දුන්නේ.

මේ අතර සසිකලාට සහාය නො දක්වමින්, ඇය පක්ෂයේ ප්‍රධාන ලේකම් ලෙස නොපිළිගන්නා යි ඉල්ලමින් මැතිවරණ කොමසාරිස්ගෙන් ඉල්ලා සිටි පක්ෂයේ සභාපති මණ්ඩලයේ ප්‍රධානියා වන ඊ. මදුසූදනන් පදවියෙන් එළවා දැමුණේ වහා ම. එමෙන් ම ඔහුගේ පක්ෂ සාමාජිකත්වය ද තහනම් කැරුණේ තමන්ට විරුද්ධ වන අයකුට සමාවක් නැති බවක් ප්‍රදර්ශනය කරමින්.

2016 අගෝස්තු මාසයේදී පක්ෂයෙන් නෙරපා හරින ලද රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරියක වන සසිකලා පුෂ්පා මැතිවරණ කොමසාරිස් වෙත දැනුම් දුන්නේ පක්ෂයේ අතුරු ව්‍යවස්ථා අනුව මහ ලේකම් පත් කළ හැක්කේ පක්ෂ නියෝජිත සමුළුවක දී හෙයින් සසිකලාගේ පත් වීම නීති විරෝධී බව. එමෙන් ම පනීර්සෙල්වම් පවසන්නේ වැඩ බලන මහ ලේකම් පදවියක් පක්ෂයේ නැති බව.


තවත් කාරණයක් නම් පක්ෂයේ මහ ලේකම් පදවියට පත් කළ හැක්කේ නො කඩවා අවුරුදු 5ක් පක්ෂයේ සාමාජිකත්වය දැරූ කෙනකුට පමණක් වීම. සසිකලා සමග නොහොඳ වූ සමයේ ජයලලිතා විසින් සසිකලා පක්ෂයෙන් එළවා දැමුණු අතර යළි පක්ෂයට භාර ගැනුණේ 2012 මාර්තු 31 වැනිදා යි. ඒ අනුව වසර 5ක් සම්පූර්ණ වීමේ කොන්දේසිය ඉටු කිරීමට සසිකලාට නොහැකි බව පැහැදිලි කරුණක්. එමෙන් ම මහ ඇමති ලෙස නම් කිරීමට ද නො කඩවා වසර 5ක් පක්ෂයේ මහ ලේකම් ලෙස කටයුතු කර තිබිය යුතු බව ද පක්ෂයේ එක් කොන්දේසියක්.

මේ ආරාවුල් මෙසේ ඉහළ යන අතර සසිකලා දිගින් දිගට ම තමිල්නාඩු ආණ්ඩුකාර සී. විද්‍යාසාගර් රාවෝ වෙතින් ඉල්ලා සිටියේ මහ ඇමැතිනිය ලෙස දිවුරුම් දීමට අවස්ථාව සලසා දෙන ලෙස. එහෙත් ඒ ඉල්ලීම ඉටු නො කරමින් ආණ්ඩුකාරවරයා කල් ගනිමින් සිටියේ අභියාචනාවේ තීන්දුව ලැබෙන තුරු වෙන්නට ද පුළුවන්. සසිකලා මහ ඇමැතිනිය ලෙස දිවුරුම් දුන්නේ නම් ආණ්ඩුව ඇතුළේ අර්බුදයක් හට ගැනීමට ද ඉඩ තිබුණු අතර නඩු තීන්දුව ලැබෙන තෙක් බලා සිටීම ප්‍රශ්නය සැහැල්ලුවෙන් විසඳා ගැනීමට ගත් නැණවත් තීරණයක් බව යි දැන් පෙනී යන්නේ.

කෙසේ වෙතත් සසිකලා සිරගෙදරට ගියේ සිය අභිමතය ජයග්‍රහණය කරවමින්. ඇය පක්ෂයේ මහලේකම් ධූරයට සිය සමීපතමයකු වන එඩප්පඩි කේ පලනිස්වාමි පත් කළ අතර ඔහු සමත් වුණේ මහ ඇමැති ලෙස දිවුරුම් දෙන්නට. මන්ත්‍රීවරුන් 124 දෙනකුගේ සහාය පළ කැරෙන ලිපියක් ඔහු ආණ්ඩුකාරවරයාට ඉදිරි පත් කළා. ආණ්ඩුකාරවරයා ඔහුට දින 15ක් කල් දුන්නේ ප්‍රාන්ත ආණ්ඩුවේ මන්ත්‍රීවරුන් බහුතරයකගේ කැමැත්ත ඔහුට තිබේ ද යන්න ඔප්පු කිරීමට.

පනීර්සෙල්වම්ට මහ ඇමති පදවිය අහිමි වූ අතර ඔහු ප්‍රකාශ කරන්නේ තමා සටන අත නොහරින බව. මේ සිද්ධි දාමය සැලකිල්ලට ගනිමින් ඇතමුන් අදහස් කරන්නේ සසිකලා විසින් ජයලලිතා විනාශ කරනු ලැබුවා පමණක් නො ව පක්ෂය ද අර්බුදයකට තල්ලු කරන ලද බව. සසිකලා සිරගෙදරට යද්දී ඇගේ රිය පෙළට ගල් ප්‍රහාර එල්ල වූ බව සහ ඇය ජයලලිතා ඝාතනය කළ බවට ජනතාව උද්ඝෝෂණය කළ බව යි ඇතැම් මාධ්‍යවල වාර්තා වුණේ.

**ගිය දෙසැම්බර් 29 වැනි දා රැස් වූ පක්ෂය යෝජනා 14ක් සම්මත කළ අතර ඉන් එකකින් කියැවුණේ අලුත් මහ ලේකම් කෙනකු පත් කරන තුරු වැඩ බැලීමට සසිකලා පත් කැරෙන බව. මේ අතර පෙබරවාරි 05 වැනි දා රැස් වූ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් තීන්දු කළේ තම කණ්ඩායමේ නායකත්වයට ද සසිකලා පත් කළ බව. ඒ අනුව ඇය සුදුසුකම් ලබන්නේ මහ ඇමැතිනිය වීමට.**






# රුසියන් ඇඟිලි ගැසීම

ධර්මදාස ගමගේ

**ප්‍රවෘත්ති** හසුරුවන ප්‍රධානියා වන ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ සෙප්පඩ විජ්ජාවන්ගෙන් හා උගුල්වලින් ප්‍රවේසම් වෙන්න.

ජනාධිපතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය උච්චස්ථානයට පැමිණෙමින් තිබියදී අප අතට ලැබුණු හඬ පටයක ඩොනල්ඩ් ට්‍රම්ප්, "ඇක්සස් හොලිවුඩ්" සත්කාරක බිලි බුෂ් වෙත පැමිණෙන කාන්තාවන් ගැන කරන නිච ප්‍රකාශයක් අසන්නට ලැබිණ. මාධ්‍යකරුවන් වන අපගේ කෝපය ඉහවහා ගියේ ය. ඉදිරි සති දෙක පුරා විවිධ කාන්තාවන් පෙරමුණට පැමිණ ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් කරන ලද ලිංගික හිරිහැර ගැන චෝදනා කළ අතර ඒවා මාධ්‍ය ක්ෂේත්‍රය ම වසා ගත්තේ ය. හිලරි ක්ලින්ටන්ගේ ප්‍රචාරක ව්‍යාපාරය මේ ගොදුර වහා ඩැහැ ගත් අතර සිය ප්‍රචාරක ක්‍රමෝපායයේ ප්‍රමුඛත්වයක් ලබා දුන්නේ ට්‍රම්ගේ නාරීද්වේශත්වය ගැන ය.

ඔක්තෝබර් 07 වැනි දා අසන්නට ලැබුණේ සිත් සතන් පැහැර ගත් ප්‍රවෘත්තියක්. එය නම් ක්ලින්ටන්ගේ සහ ඩිමොක්‍රැටික් පක්ෂයේ අභ්‍යන්තර ඊ මේල් ගිණුම්වලට අනවසරයෙන් කඩා වැදීම පිටුපස සිටින්නේ රුසියාව බවට අමෙරිකන් බුද්ධි අංශ ආයතන 17 ම විශ්වාස කරන බව යි. ඒ සමග ම බැඳී තිබුණේ රුසියන් ජනාධිපති ව්ලැදිමියර් පුටින් කෙරෙහි ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ අරුම පුදුම ආකර්ෂණය. ඒ සමග ම ඈඳුණු තවත් ප්‍රවෘත්තියක් වුණේ සිය ආදායම් බදු වාර්තා හෙළි කිරීමට ට්‍රම්ප් දැක්වූ අකමැත්ත. රුසියානු මූල්‍ය දැවැන්තයන් සමග මොහුගේ ව්‍යාපාරික සබඳතා පැවැතියේ ද? කොපමණ මුදලක් ට්‍රම්ප් ඔවුන්ට ණය ද? ඔවුන් කොපමණක් ට්‍රම්ප්ගේ ව්‍යාපාරවල ආයෝජනය කර තිබේ ද? යන කාරණා පැහැදිලි කර ගැනීම ඒ නිසා අපහසු විය. මේ කාරණා කොයික වුව ද සාහසික ය. මේ සියල්ල එකට ගෙන සැලකීමේදී හිතන්නටත් බැරි ආකාරයට යොමු විය හැකි නිගමනය වන්නේ මැතිවරණ ජයග්‍රහණය ට්‍රම්ප්ට වාසි වන පැත්තට හැරවීමට රුසියාව උත්සාහ ගන්නා ලද බව සී.අයි.ඒ. සංවිධානය පුද්ගලික ව තීරණය කර තිබීම.

ඇක්සස් හොලිවුඩ් කතාන්දරය සැබැවින් ම ප්‍රවෘත්ති වටිනාකමකින් යුක්ත එකක්. ක්ලින්ටන් පරාද වීමට රුසියන් හැකරුන් හේතු වූ බව මා කියන්නේ ද නැත. පරාජයට හේතුව ඇය ම ය. එහෙත් අපේ ප්‍රජාතන්ත්‍රවාදයේ කේන්ද්‍රය වන මැතිවරණ පැවැත්වීමේ චාරිත්‍ර විධියේදී රුසියාව ඇඟිලි ගැසීම විදේශීය සයිබර්යුදවාදී ක්‍රියාවක් නැතහොත් සී.අයි.ඒ. විධායක මයික් මොරෙස් කියන්නාක් මෙන් "සැප්තැම්බර් 11 ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ ප්‍රහාරයට සමාන දේශපාලන ක්‍රියාවක්. එහෙත් ඒ පළිබඳ ව නිසි බරක් ඇති ව මාධ්‍ය විසින්, විශේෂයෙන් කේබල් රූපවාහිනිය, සැලකිල්ල නො දක්වන ලද බව යි කිව යුත්තේ."

එහෙත් දැන් එයට අවස්ථාව. ජනාධිපතිවරයා සිය බදු වාර්තා එළි දැක්විය යුතු යි. රුසියානු සම්බන්ධය පූර්ණ ලෙස හෙළි කළ යුතු යි. රාජ්‍ය ලේකම් තනතුරට යෝජිත රෙක්ස් ටිකර්න් සහ රුසියාව අතර ඇති සබඳතාව නිශේධනය කළ යුතු යි. මෙය ඉටු කිරීම සඳහා මාධ්‍යය නිර්දය ලෙස පීඩනය එල්ල කළ යුතු යි.

මාධ්‍ය විසින් ඉගෙන ගනු ලැබිය යුතු ලොකු පාඩමක් මෙහි තිබෙනවා. ට්‍රම්ප්ගේ මුඛරිකමට විධික්‍රමයක් තිබෙනවා. අමෙරිකාන් ඉතිහාසයේ, කිසිදු ප්‍රශ්නයක් නැති ව, ඉහළ ම විශේෂඥ ප්‍රවෘත්ති හසුරුවන්නා ඔහු යි. ඇක්සස් හොලිවුඩ් කතාන්දරයෙන් ඇති වූ අපහසුතාව ද වාසියට හරවා ගන්නට ඔහුට පුළුවන් වුණා. ඔහු ඇමක් වතුරට විසි කරයි. ඊට පසු හැම තැන ම ට්විටර් ප්‍රවෘත්ති, මැතිවරණ දූෂණ, කොඩි ගිනි තැබීම. කේබල් ටී. වී. නාලිකා ප්‍රවෘත්ති දඩයම් උන්මාදයට යි පත් වන්නේ. මෙවායින් වෙන්නේ සිය ඡන්දදායකයන් තුළ ට්‍රම්ප් කෙරෙහි ඇති විශ්වාසය තව දුරටත් තහවුරු වීම. ඒ අල්ලපනල්ලේ සිදු වන්නේ වඩාත් වැදගත් ස්ථානයක් ලැබිය යුතු කාරණා ගිලිහී යාම. විශේෂයෙන් ම අශ්ව රේස් සහ විනෝදාස්වාද වැඩසටහන් පැතිර පවතින කේබල් ටී. වී. නාලිකා තමන් ප්‍රමුඛතාව දිය යුත්තේ මොනවා ගැන ද යන්න ගැන දැඩි මෙන් ම සන්සුන් සංවේදීතාවක් ඇති කර ගත යුතු යි. මේ ජනමාධ්‍යවලට සංවේදී සහ සමහර විට අනතුරුදායක මොහොතක්. දෙයාකාර වැඩපිළිවෙළකට කටයුතු කිරීමට ජනමාධ්‍යවේදීන්ට සිදු වනු ඇත. රුසියන් සම්බන්ධය වැනි බරපතළ කාරණාවල සත්‍යය පසුපස නිර්දය ලුහුබැඳ යාම සමාන ව ම ගෞරවය දිය යුත්තාට එය දීමට කැමැති නිදහස් මනසක් ද පැවතිය යුතු යි.

ට්‍රම්ප් මේ වන තෙක් කිසිවක් කර නැති නමුත් ඔහුගේ විරුද්ධවාදීන් කටයුතු කරන්නේ අහස කඩා වැටුණාක් මෙන්. මෙයින් සිදු වන්නේ ට්‍රම්ප්ට වාසියක් අත් කර දීම. නියත වෛරයකින් ම පටන් ගන්නේ නම් සැබැවින් ම වෛර කළ යුතු කරුණක් සිදු වන විට කරන්නට ඉතිරි ව තිබෙන්නනේ කුමක් ද? සමහර විට ඉතා ජනප්‍රිය ජනාධිපතිවරයෙක් බවට මොහු පත් වුණොත්? පොදු වාණිජ අරමුණු මත පදනම් ව රුසියාව සමග සමගිසන්ධානගත වීම ලෝක සාමයට ඉතා යහපත් වීමට ඇතිතේ පූර්ණ හැකියාවක්. එමෙන් ම විශ්වාස කළ හැක්කේ ඩොනල්ඩ් ට්‍රම්ප් තනතුරුවලට පත් කර ඇති සිය මතවාදීය පුද්ගලයන්, සෞඛ්‍ය, මානව සේවා, කම්කරු, අධ්‍යාපන සහ පරිසර ආරක්ෂණ අධිකාරිය වැනි ආයතනවල මකුළුදැල් කඩා සුද්ද බුද්ද කරනු ඇති බව.

2016 දෙසැම්බර් Time සඟරාවේ ලේඛක Joe Kelinගේ ලිපිය ඇසුරින්

# පෙරළිකාර පෙරළිය

## ෆින්ලන්ත අධ්‍යාපන පෙරැළිය

**ධර්මදාස ගමගේ**

**ෆින්ලන්ත නිලධාරීන්ට අවශ්‍ය වී ඇත්තේ අධ්‍යාපන විෂයමාලාවෙන් පාසල් විෂයයන් ඉවත් කිරීමට. භෞතික විද්‍යාව, ගණිතය, සාහිත්‍යය, ඉතිහාසය හෝ භූගෝල විද්‍යාව සඳහා තවදුරටත් පන්ති පැවැත්වෙන්නේ නැහැ.**

**ෆින්ලන්ත** අධ්‍යාපන ක්‍රමය සැලකෙන්නේ ලෝකයේ හොඳ ම අධ්‍යාපන ක්‍රම අතරින් එකක් හැටියට. අන්තර්ජාතික තක්සේරු කිරීම් අනුව හැම විට ම එය ඇතුළත් වන්නේ ඉහළ ම 10 අතරට. කෙසේ වුව ද ඒ කීර්තිය මත නතර වී සිටීමට බලධාරීන් සූදානම් නැහැ. ඒ නිසා ඔවුන් තීරණය කර ඇත්තේ පාසල් පද්ධතිය ම පූර්ණ විප්ලවයකට යොමු කිරීමට.

ෆින්ලන්ත නිලධාරීන්ට අවශ්‍ය වී ඇත්තේ අධ්‍යාපන විෂයමාලාවෙන් පාසල් විෂයයන් ඉවත් කිරීමට. භෞතික විද්‍යාව, ගණිතය, සාහිත්‍යය, ඉතිහාසය හෝ භූගෝල විද්‍යාව සඳහා තවදුරටත් පන්ති පැවැත්වෙන්නේ නැහැ.

හෙල්සින්කි නුවර, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රධානි, මාර්ජෝ කිලොනෙන් නව වෙනස්කම් පැහැදිලි කරන්නේ මෙසේ.

"පාසල්වල ඉගැන්වෙන්නේ පරණ තාලයට. එය 1900 ගණන්වල ආරම්භයේ ප්‍රතිඵලදායි වුව ද මේ කාලයේ අවශ්‍යතා වෙනස්. ඒ නිසා අපට අවශ්‍ය වන්නේ 21 වැනි සියවසට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක්."

වෙන වෙන ම විෂයයන් වෙනුවට අන්තර්ක්ෂේත්‍ර ආකෘතියක් යටතේ සිසුන් අධ්‍යයනය කරනු ඇත්තේ, සිද්ධීන් සහ ප්‍රපංචයන්. උදාහරණයක් ගතහොත් දෙවැනි ලෝක සංග්‍රාමය පරීක්ෂණයට භාජනය කරන්නේ ඉතිහාසමය, භූගෝලීය සහ ගණිතමය දෘෂ්ටිකෝණයකින්. "ආපනශාලාවක වැඩ කිරීම" යන පාඨමාලාව ගතහොත් ඉංග්‍රීසි භාෂාව, ආර්ථික විද්‍යාව සහ සංනිවේදන කුසලතා අවශෝෂණය කර ගන්නවා ඇති.

නව ක්‍රමය හඳුන්වා දීම පටන් ගන්නේ අවුරුදු 16 සිට ඉහළ ජ්‍යෙෂ්ඨ සිසුන්ගෙන්. පොදු අදහස වන්නේ, සිය කුසලතා හා අනාගත අපේක්ෂා සිත්හි තබා ගනිමින් තමන් අධ්‍යයනය කිරීමට තෝරා ගන්නා විෂයක්ෂේත්‍රය හෝ ප්‍රපංචය සිසුන් විසින් ම තෝරා ගැනීමේ අවස්ථාව ලබා දීම යි. මේ අනුව තවදුරටත්, "මේවා ගැන දැන ගැනීමෙන් ඇති පලේ කුමක් ද?" යනුවෙන් හැම විට ම තම තමන් ම නිතමින් භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ සම්පූර්ණ පාඨමාලාව වශයෙන් සමත් වීම අවශ්‍ය වන්නේ නැහැ.

සාම්ප්‍රදායික ගුරු - සිසු සන්නිවේදන රටාව ද නව ක්‍රමය අනුව වෙනස් වනු ඇති. සිසුන් ලියන මේස පිටුපස වාඩි වී ගුරුවරයා තමන්ගෙන් ප්‍රශ්නයක් විමසන තුරු කුතුහලයෙන් බලා සිටීම තවදුරටත් සිදු වන්නේ නැහැ. ඒ වෙනුවට සිදු වන්නේ කුඩා කණ්ඩායම් ලෙස ප්‍රශ්න සාකච්ඡා කිරීම යි. ෆින්ලන්ත අධ්‍යාපන ක්‍රමය සාමූහික ක්‍රියාකාරකම් දිරි ගන්වන අතර නව වෙනස්කම් ගුරුවරුන්ට ද බලපාන්නේ එහෙයින්. විවිධ විෂයයන් උගන්වන ගුරුවරුන් අතර ප්‍රබල සහයෝගයක් නව අධ්‍යාපන ක්‍රමය සඳහා අත්‍යවශ්‍ය වෙයි. හෙල්සින්කි නුවර ගුරුවරුන්ගෙන් 70%ක් පමණ ම නව ක්‍රමයට අදාළ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා මූලික සූදානම් ආරම්භ කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට වැටුප් වැඩි වීමක් ද සිදු වීමට නියමිත යි.

2020 වන විට මේ නව වෙනස්කම් සම්පූර්ණ කිරීමට යි අපේක්ෂාව.





# මහ පුටුවේ මහ තරගය

## ප්‍රංශ ජනාධිපතිවරණය

ධර්මදාස ගමගේ

**ප්‍රංශයේ** ජනාධිපතිවරණය පැවැත්වීමට නියමිත ව ඇත්තේ එළඹෙන අප්‍රියෙල් මාසයේ. දේශපාලන විචාරකයන් දැනටමත් පුරෝකථනය කර ඇත්තේ පළමු වටයෙන් ම කිසිවකුට ජය අත් නො වනු ඇති බව. ඒ අනුව මැයි මාසයේදී දෙ වැනි වටයක් ද පැවැත්වීමට යි අපේක්ෂා කරන්නේ.

වර්තමාන ජනාධිපති ප්‍රැන්කෝ හොලන්දේ තරගයට ඉදිරිපත් නො වන අතර ඔහුගේ ජනප්‍රියත්වය පහළට ම වැටී ඇති බව යි සමීක්ෂණ වාර්තා හෙළි කරන්නේ. ඔහුගේ සෝෂලිස්ට් පක්ෂය එක බහක් නැති තත්ත්වයට පත් ව ඇති බව වාර්තා වන්නේ පක්ෂයේ ම කොටස් පක්ෂයේ අපේක්ෂක බිනෝයිි හැමොන්ට පිටු පා වෙනත් අපේක්ෂකයන්ට සහාය දෙන බවට මත පළ වීම නිසා.

ජනමාධ්‍යවල පළ වන විචාරයන් අනුව පෙනී යන්නේ අපේක්ෂකයන් දෙදෙනකු පෙරමුණට පැමිණ සිටින බවක්. හොලන්දේගේ ආණ්ඩුවේ ටික කලක් ආර්ථික කටයුතු ඇමති ලෙස කටයුතු කොට පසු ව ඔහුට පිටු පා එයින් ඉවත් ව දකුණටත්, වමටත් නැති නිදහස් මධ්‍යම පිළිවෙතක් අනුගමනය කරන බව ප්‍රකාශ කරන එම්මානුවෙල් මැක්රොන් එක් අයෙක්. අනිත් කෙනා වන්නේ දැඩි ආගමන විරෝධී පිළිවෙතක සිටින අන්ත ජාතිකවාදී "ජාතික පෙරමුණේ" මැරීන් ලේ පෙන්.

ඇතැම් අයගේ විශ්වාසය නම් පළමු වටයේදී ලේ පෙන් මුල් තැන ගනු ඇති බව. එහෙත් දෙ වැනි වටයේදී ඇය අබිබවා ජය ගනිමින් මී ළඟ ප්‍රංශ ජනාධිපති වීමේ වැඩි බර තිබෙන්නේ මැක්රොන්ට බව. එසේ වුව ද ලේ පෙන් ජයග්‍රහණය කරනු ඇති බව ද සමහරුන්ගේ විශ්වාසය. ඇය ට්‍රම්ප් සහ ඔහුගේ පිළිවෙත් මහත් සේ අගය කරන්නේ ප්‍රංශයේ දැඩි ට්‍රම්ප් විරෝධයක් ද තිබියදී. ඇයගේ අදහස ද ප්‍රංශය තුළ ප්‍රංශ ජාතිකත්වය ඇති කළ යුතු බව. ට්‍රම්ප් සේ ම ඇය ද බ්‍රිතාන්‍යය යුරෝපා සංගමයෙන් ඉවත් වීමට ගත් තීන්දුව අගය කරන්නියක්. එමෙන් ම ඇය ගෝලීයකරණය විවේචනය කරන්නේ දැඩි ලෙස.

ඇය ප්‍රකාශ කරන තවත් කාරණයක් නම් මූල්‍ය, නීති සම්පාදක, භෞමික සහ ආර්ථික වශයෙන් යුරෝපා සංගමයෙන් නිදහස් වීම පිළිබඳ ව සාකච්ඡා ආරම්භ කළ යුතු බව. එමෙන් ම යුරෝ මුදල භාවිතයෙන් ද ප්‍රංශය ඉවත් විය යුතු බව යි ඇය කියා සිටින්නේ. ඒ සඳහා මෙන් ම ප්‍රංශ ජාතිකයාට ප්‍රමුඛත්වය පිරිනැමෙන පරිදි නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම පිළිබඳ ව ද ජනමත විචාරණ දෙකක් පැවැත්වීම ද තම අදහස බව ඇය අවධාරණය කරන්නාය.

"මේරියන්" සඟරාවේ ලිපියක සඳහන් කර ඇත්තේ මැක්රොන් ජනප්‍රිය බව පෙනී ගියත්, විවෘත ආර්ථිකය හා ගෝලීයකරණය සහ ආගමනිකයන් පිළිබඳ ලිහිල් පිළිවෙත් නිසා ඔහුට ලොකු වාසියක් අත් කර ගැනීමට ඇති ඉඩකඩ සීමිත බව. අනිත් අතට සඟරාව පෙන්වා දෙන්නේ දෙවැනි වටයේදී දක්ෂිණාංශික ඡන්ද ලේ පෙන්ට ලැබෙනු ඇතැ යි ද සිතිය හැකි බව. ඒ අතර මධ්‍යම පාක්ෂිකයන් දෙවැනි වටයේ ඡන්දය පාවිච්චි කිරීමට නො යාමේ ඉඩකඩක් ද ඇති බවත් එය මැක්රොන්ට අවාසියක් විය හැකි බව යි එය තවදුරටත් සඳහන් කරන්නේ.

තවත් සාකච්ඡා කැරෙන කරුණක් නම් රුසියානු ජනමාධ්‍ය වැඩි ප්‍රමුඛතාවක් දෙන්නේ සහ වැඩියෙන් සාකච්ඡා කැරෙන්නේ ලේ පෙන් පිළිබඳ ව බව. ඩොනල්ඩ් ට්‍රම්ප් පිළිබඳ ව රුසියන් මාධ්‍ය කටයුතු කළේ ද ඒ ලෙස බව යි, ලෝක සමාජවාදී වෙබ් අඩවියේ අලෙක්ස් ලැන්ටියර් සඳහන් කරන්නේ.

ට්‍රම්ප්ගේ ප්‍රතිපත්ති නිසා යුරෝපා බලවතුන් කැලඹී සිටින අවස්ථාවේ පැවැත්වෙන ප්‍රංශ ජනාධිපතිවරණය ප්‍රංශයට කුමන ප්‍රතිඵල අත්කර දේවි ද යන්න ගැන විමසිලි ඇසින් බලා සිටීමට යි සිදු වන්නේ.



# ලෝකයම එක මිටට

## සුහුරු තාක්ෂණය

## SMART TECHNOLOGY

චම්මි ජයනෙත්ති



වසන්ත දේශප්‍රිය
ලේකම් - විදුලි සංදේශ සහ ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යංශය



**තාක්ෂණය යනු ඇසිපිය හෙළන මොහොතකදී පවා දියුණු වෙමින් වේගයෙන් ඉදිරියට ගමන් කරන්නක්. ලොව මවිත කරවන නව නිපැයුම් බිහි කරන්නට මෙන්ම මිනිස් චර්යා රටාවන්ට ද බලපෑම් කිරීමට තරම් එම තාක්ෂණය අද අප අතට පත්වන්නේ ඉතා සූක්ෂ්ම අයුරින්. එබඳු පසුබිමක් තුළ සුහුරු තාක්ෂණය ගැන අද වැඩි වශයෙන් කතාබහට ලක් ව තිබෙනවා. එය මානව සංවර්ධනයට මෙන්ම අවසානයේ රටේ සංවර්ධනයට යොදා ගන්නේ කෙසේ ද ? යන්න පිළිබඳවයි මෙවර කවරයේ කතාවෙන් විමසන්නේ.**

ඉතා සීඝ්‍රයෙන් දියුණුවන ලොව තාක්ෂණික වෙනස්වීම් හමුවේ අපට පමණක් හුදෙකලා වී සිටිය නොහැකි තරමට අප ජාලගත වී අවසන්. ඒ ඔස්සේ ආර්ථික, සාමාජික හා දේශපාලනික කාරණා පමණක් නොව අපගේ චර්යා රටාවන් කෙරෙහිද බලපෑම් කිරීමට තරම් එම තාක්ෂණික දියුණුව බලපා තිබෙන බව නොරහසක්. එහෙත් සැබැවට ම සිදු විය යුතු වන්නේ එවැනි තාක්ෂණික දියුණුවක් මඟින් මිනිසාගේ ජීවන මට්ටම ඉහළට ඔසවා තැබීම. ඒ සඳහා සුහුරු තාක්ෂණය **(Smart Technology)** හොඳ ප්‍රවේශ මාර්ගයක්.

මේ වන විටත් ලොව පුරා ම ව්‍යාප්ත වී ඇති සුහුරු තාක්ෂණය පිළිබඳ අපේ රටේ ද වැඩි වශයෙන් කතාබහට ලක් වනු දක්නට පුළුවන්. ඉදිරි ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේදී ඒ හා සමගාමී ව දියුණු තාක්ෂණය ද භාවිත කළ යුතු බව යි වත්මන් රජය අදහස් කරන්නේ. සුහුරු රජයක්, සුහුරු දැයක්, සුහුරු පුරවැසියකු බිහි කිරීම පිළිබඳ කතිකාව ගොඩනැගෙන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසින්.


අති නවීන තාක්ෂණික යෙදවුම් හරහා ලොව බොහොමයක් රටවල් සීඝ්‍රයෙන් සංවර්ධනය වන විට අප ද එම තාක්ෂණික භාවිතාවේ ගෝලීය තරඟකාරී පාර්ශ්වකරුවකු වීම අත්‍යවශ්‍ය යි. ඒ නිසා ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණයෙන් සිටින්නේ කොතැන ද යන්න බැලිය හැකි වන්නේ ඒ සඳහා ඇති අන්තර්ජාතික දර්ශක පළමුව විමර්ශනය කිරීමෙන්. **NRI** දර්ශකය **(Networked Readiness Index** - ජාලගත කිරීමට සූදානම් දර්ශකය) ඉන් එකක්. 2016 දී එම දර්ශකය තුළ අප සිටින්නේ 63 වැනි ස්ථානයේ. ඒ රටවල් 139ක් අතරින්. ඒ අනුව පැහැදිලි වන්නේ තවමත් අප, එම ජාලගත කිරීමට සූදානම් ලොව බහුතරයක් රටවල් අතර පළමු වැනි 50% අතර සිටින බව යි. දෙ වැනිව රාජ්‍ය අංශයේ තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ එක්සත් ජාතීන් විසින් වසර දෙකකට වරක් පවත්වනු ලබන සමීක්ෂණයක් මත සකසන "ඊ රාජ්‍ය සංවර්ධන දර්ශකය" **(Egovernment Development Index)** අනුව 2016 දී රටවල් 193ක් අතරින් අප සිටින්නේ 79 වැනි ස්ථානයේ. එනම්, 50%ටත් වඩා අඩු මට්ටමක. එහෙත් රජය විසින් තොරතුරු තාක්ෂණ සේවා මහජනතාවට ලබා දීමේදී සෑහෙන ඉදිරියෙන් සිටින බවත් එහි සඳහන්. කෙසේ වෙතත් ව්‍යාපාර කිරීමේ පහසුව පිළිබඳ දර්ශකයේදී **(Doing Business Index)** අපේ රට පහළ මට්ටමක සිටීම කනගාටුවට කරුණක්. ඊට හේතුව තොරතුරු තාක්ෂණය නොව නීතිරීති හා ක්‍රියාපිළිවෙළ ප්‍රමාද නිසා බව යි එහි සඳහන් වන්නේ. මේ නිසා දැනටමත් රජය ඒ පිළිබඳ අවධානය යොමු කොට ව්‍යාපාර පහසුව ඇති කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා බවට රජයේ ඉදිරි වැඩපිළිවෙළ තුළ සඳහන්. මීට අමතර ව 2015, 2016 වර්ෂ තුළ BPO (Business Process Out Services) ක්ෂේත්‍රයේදී එනම්, වෙනත් රටවල හෝ ආයතනවල ගිණුම් කටයුතු වැනි දෑ Online හරහා සිදු කර ගැනීමේදී ලංකාව හොඳ ම ගමනාන්තයක් බව යි, ජාත්‍යන්තර ආයතන හඳුනාගෙන

**ත්‍රිමාන (3D) ආකාරයෙන් අවශ්‍ය ඕනෑම දෙයක් මුද්‍රණය කිරීමේ තාක්ෂණික හැකියාව ද දැන් රටවල් ගණනාවක ක්‍රියාත්මක වෙනවා. චීනය, එහි වැඩි ප්‍රතිලාභ අත්පත් කරගත් රටක්. අනාගත අභ්‍යවකාශ තරණයේදී පවා බොහොමයක් රටවල් මේ ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍ර යොදාගැනීමට යි අපේක්ෂා කරන්නේ.**

තිබෙන්නේ. මෙවැනි කාරණා මත ලංකාව සැහෙන ඉදිරියෙන් සිටින බවත් කළ යුතු තවත් බොහෝ දෑ තිබෙන බවත් කිව යුතු යි. ඒ අතර සුහුරු තාක්ෂණය ද නිසි පරිදි භාවිත කිරීම ඉතා වැදගත්.

"සුහුරු" (Smart) යන්නට නොයෙකුත් අර්ථකථන ඇතත් ඒ සඳහා ලක්ෂණ කිහිපයක් තිබිය යුතු වෙනවා. සන්නිවේදන මෙවලමක් තිබීම, ස්වාධීන ව වැඩ කළ හැකි වීම, විශාල ජාලයක කොටස්කරුවකු වීම ඊට අයත්. ඒ අනුව වෙනත් කෙනකුගේ ආධාරයක් නොමැති ව පරිගණකය මඟින් යමක් කර ගත හැකි ආකාරයට තාක්ෂණය සැකසීමක් සුහුරු තාක්ෂණය ලෙස අර්ථ ගැන්විය හැකි යි. එහෙත්, අද මේ සුහුරු තාක්ෂණය සඳහා යොදා ගැනෙන Smart Phone වලින් අපේ රටේ වැඩි වශයෙන් සිදු කරන්නේ Face Book (මුහුණු පොත) වැනි ගිණුම් සඳහා යොමු වීම යි. ඒ නිසා සුහුරු තාක්ෂණය (Smart Technology) තිබුණත් එය සුහුරු ලෙස භාවිත කිරීමට අවශ්‍ය දේශීය පද්ධතියක් නොමැති වීම ගැටලුවක්. ඉන් අදහස් වන්නේ උදාහරණයක් ලෙස, ගොවියකුට නාම් ඉදිරි කාලගුණය, නිෂ්පාදන මිල, ආර්ථික මධ්‍යස්ථාන සහ වගා රෝග යනාදිය පිළිබඳ තොරතුරු ලබා ගැනීමට Smart Phone එක වටා ඒකරාශී වී තිබීම යි. මේ නිසා අපට තිබෙන තාක්ෂණය දේශීය කර ගැනීම වැදගත්. එහිදී අප තවමත් සිටින්නේ බොහෝ පසුපසින්. සුහුරු තාක්ෂණය (Smart Technology) යන්න ඉතා ඉක්මනින් වෙනස් වීම ඊට හේතුවක්. බොහෝ විට ඒ වෙනස්වන වේගයට අපට හැඩගැසීමට නොහැකි යි. සුහුරු තාක්ෂණය භාවිතයේදී ප්‍රධාන ම අවශ්‍යතාවක් භාෂාව. ජපානයේ සහ කොරියාව ගතහොත් ඔවුන්ගේ පරිගණකයේ 100%ක් ම තිබෙන්නේ ඔවුන්ගේ රටේ භාෂාව. ඊට හේතුව එම රටවල තිබෙන ආර්ථික ශක්තිමත්භාවය සහ ඔවුන් එක් එක් සමාගමට කොපමණ වැදගත් ද යන කාරණා යි. ඒ නිසා මයික්‍රොසොෆ්ට් ඇතුළු සියලු ම සමාගම් විසින් එම රටවලට අදාළ භාෂාවට පරිගණක මෙහෙයුම් රටාව හැරවීම දක්නට පුළුවන්. එහෙත් කුඩා ආර්ථිකයක් සහ කුඩා ජනගහනයක් හිමි අප වැනි රටක භාෂාවට පරිගණකයේ භාෂාව හැඩගැස්වීමෙන් එවැනි මහා පරිමාණ සමාගම්වලට විශාල ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ.

කෙසේ වෙතත් විවිධ ක්ෂේත්‍ර සඳහා තාක්ෂණය භාවිතාව අතින් අප තවමත් සිටින්නේ පහළ මට්ටමක. ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ මුදල් වැය කරන ප්‍රසම්පාදන ක්‍රියාවලියට තවමත් අප Online E Procurement ක්‍රමවේදය භාවිත කරන්නේ නැහැ. එහෙත් එය බහුතරයක් රටවල දැනටමත් භාවිත කරන්නක්. එමඟින් සෑම ආයතනයකට ම ටෙන්ඩර් කැඳවීම, බදු මිල දී ගැනීම යනාදී සියලු ම කාර්යයන් එම පද්ධතිය හරහා පහසුවෙන් ඉටු කර ගත හැකි යි. එය ඉතා ම පාරදෘශ්‍ය වූ විනිවිදභාවයෙන් යුක්ත වූවක්. මේ නිසා ලෝකයේ ප්‍රධාන රාජ්‍ය විසින් දැනටමත් එය ක්‍රියාත්මක කර අවසන්. එහෙත් අපේ රටේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වැනි බදු ආදායම් ලබන ආයතන එවැනි දේ ක්‍රියාත්මක කිරීමට මූලික විය යුතු යි. මානව සම්පත කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය වගේ ම මහජන සේවා පවත්වා ගෙන යාමේදී Online ක්‍රමවේදය ක්‍රියාත්මක කළ යුතු යි. ඉන් පුද්ගලයකුට කිසි ම කරදරයකින් තොර ව මඟ මඟ කාලය වැය නොකොට නිවසේ සිට ම සිය සේවාවන් අන්තර්ජාලය හරහා ලබා ගැනීමට පුළුවන්. මෙහිදී විශේෂයෙන් ම අන්තර්ජාලය හරහා රාජ්‍ය සේවාවන් ලබාදීමේදී අප තවමත් සිටින්නේ ළදරු අවස්ථාවේ.



කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඉතා ඉදිරියෙන් සිටින ඉන්දියාව, ලෝකයේ Software (මෘදුකාංග) සකසන රටවල් අතර ද ප්‍රමුඛස්ථානයේ සිටිනවා. ඔවුන් තොරතුරු තාක්ෂණයෙන් ඉතා ඉහළ ආදායමක් ලැබුව ද තාක්ෂණය සාමාන්‍ය ජනතාව අතරට ගෙන යාමේදී සහ රාජ්‍ය අංශයේ සේවාවන් ලබා දීමේදී අපට වඩා පසුපසිනුයි සිටින්නේ. ඊට හොඳ ම නිදසුන තොරතුරු තාක්ෂණ සාක්ෂරතාව නැත්නම් e රාජ්‍ය දර්ශකය තුළ 79 වැනි තැන සිටින අපට වඩා පහළින් ඔවුන් 120 වැනි තැන සිටීමයි. තාක්ෂණය අතින් බොහෝ දියුණු වූ ඔවුන් එය වැඩි වශයෙන් විදෙස් සමාගම්වලට විකුණා දැමීමට භාවිත කිරීම ඊට හේතුවක්.

ඊට සාපේක්ෂ ව අපේ රට ද විදෙස් රටවලට මෘදුකාංග අලෙවියෙන් වසරකට ඩොලර් බිලියනයක පමණ ආදායමක් ඉපැයීමට සමත් ව තිබෙනවා. එය මෙරට 5 වැනි විදේශ විනිමය ආදායම් උපයන ක්ෂේත්‍රය යි. 2022 වන විට එය වසරකට ඩොලර් බිලියන 5 දක්වා වැඩි කිරීමට යි අපේක්ෂා කරන්නේ. ඒ සඳහා අවශ්‍ය වන්නේ අදාළ පහසුකම් සැපයීම යි.

එක් පැත්තකින් අපට හොඳ සාක්ෂරතාවක් තිබුණ ද, තාක්ෂණය භාවිතයට යොමු වීම පිළිබඳ ව ගැටලු මතුවන්නේ හේතු දෙකක් නිසා. අපේ රටේ රාජ්‍ය අංශයට නිසි ඒකාබද්ධ වූ වැඩපිළිවෙලක් නොමැතිකම ඉන් එකක්. දෙවැන්න, රාජ්‍ය අංශය විසින් අනෙක් ආයතනවලට මේ දේ අදාළ දිනට කළ යුතු යි යන්නට බල කිරීමක් හෝ ක්‍රියා පිළිවෙතක් නොමැතිකම. මේ සඳහා අවශ්‍ය වන්නේ උපායමාර්ගික සැලසුමක් ක්‍රියාත්මක කිරීම යි. ICT ආයතනය සමඟ එක්ව 2022 අරමුණු කරගෙන එවැනි උපායමාර්ගික සැලසුමක් සැකසීම මේ වන විටත් අප ආරම්භ කර තිබෙනවා.

සුහුරු තාක්ෂණය පිළිබඳ කතා කිරීමේදී වැදගත් වන අනෙක් පුද්ගලයා සුහුරු පුරවැසියා යි (Smart Citizen). සුහුරු පුරවැසියකු වීමට නම් තාක්ෂණය පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ සඳහා සුහුරු තාක්ෂණය විසින් ඒ ඒ පුරවැසියාගේ අවශ්‍යතා ලබා ගැනීමට අවකාශ ලබා දී ඊට අවශ්‍ය පරිසරය සැකසිය යුතු යි. එනම් සුහුරු තාක්ෂණය අපගේ දේශීය අවශ්‍යතාවලට බද්ධ කිරීමට හැකි විය යුතු යි. අද අපට තාක්ෂණය තිබුණත් අපේ අවශ්‍යතාවන්ට අනුව පුරවැසියන්ට එය භාවිත කිරීමට ලබා දිය නොහැකි වී තිබෙනවා. උපාය මාර්ගික සැලසුමක් අවශ්‍ය වන්නේ ඒ සඳහා යි. එහිදී ක්‍රමානුකූල ව වසර ගණනාවකදී සුහුරු පුරවැසියන් බිහි කළ යුතු යි.

බොහෝ විට Face Book (මුහුණු පොත) භාවිත කරන්නේ නම්, You Tube බලන්නේ නම් Blogs කියවන්නේ නම් එවැන්නන් සුහුරු තාක්ෂණය භාවිත කරන සුහුරු පුරවැසියන් ලෙස සිතන්නට පුළුවන්. එහෙත් එය නිවැරැදි නොවේ. මගේ අදහස නම් සුහුරු පුරවැසියකු වීමට නම් තාක්ෂණය භාවිතයෙන් ජීවන මට්ටම ඉහළ නංවා ගැනීමට, තම මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි විය යුතු යි. රටේ පවතින දුප්පත්කම වැනි දැවෙන ප්‍රශ්නවලට විසඳුම් සොයා ගැනීමට තාක්ෂණය භාවිත කළ යුතු යි. එවිට අපට සුහුරු ජනතාවක් බවට පත්වීමට පුළුවන්. දැන් ඒ සඳහා මූලික අඩිතාලම් දමා ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කෙරෙනවා. ඒ නිසා ඔබ භාවිත කරන ජංගම දුරකථනය, ටැබ් පරිගණකය මඟින් ජීවන මට්ටම උසස් කර ගැනීමට එය නිවැරැදි ව භාවිත කළ යුතු වෙනවා. විශේෂයෙන් ම සුහුරු තාක්ෂණය මඟින් සුහුරු දැයක්, සුහුරු ජනතාවක් බිහි කිරීමට අවශ්‍ය නීතිමය, ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු කළ යුතු වෙනවා. එහිදී සුපිරි නාගරික පන්තියට වඩා 80%ක් පමණ වන බහුතරයක් සිටින සාමාන්‍ය ජනතාවට එම තාක්ෂණයේ ප්‍රයෝජන ගලා යා යුතු වෙනවා. ඉන් ඔවුන්ගේ ජීවන ශෛලිය, ජීවන මට්ටම ඉහළ නැංවිය යුතු වෙනවා. ඒ සඳහා වඩාත් වැදගත් වන්නේ නීතිමය, ප්‍රතිපත්තිමය ප්‍රමිතීන් භාවිත කරගෙන නිවැරැදි මාවතක ගමන් කිරීම යි. දැන් ගමන ආරම්භ කර තිබෙනවා. එහෙත් අප එහි ගමන් කර තිබෙන්නේ 25%යි.

ඒ නිසා මේ සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් අතර පළමු ව එකඟතාවක් ඇති කර ගෙන තාක්ෂණය භාවිතය සම්බන්ධයෙන් එක අරමුණක් කරා යාමට අවශ්‍ය පියවර ගත යුතු වෙනවා. එය ක්‍රියාත්මක කිරීමේ හස්තය ලෙස භාවිත වන්නේ ICT ආයතනය යි. මේ වන විටත් විදේශ ගමන් බලපත්‍රයක් දිනකින් ලබා ගැනීමට හැකි වීම තාක්ෂණය කාර්යක්ෂම ව භාවිත කිරීමට හොඳ ම උදාහරණයක්. එලෙස දිනකින් ගමන් බලපත්‍ර ලබා ගත හැකි ලොව රටවල් තිබෙන්නේ කිහිපයක් පමණයි. ඊට අමතර ව අප



සුහුරු තාක්ෂණය සෞඛ්‍ය ක්ෂේත්‍රයටත්...







රටට පැමිණෙන ඕනෑ ම විදේශිකයකුට අන්තර්ජාලය හරහා වීසා ලබා ගැනීමට දැන් හැකියාව තිබෙනවා. එලෙස මෙරටට පැමිණෙන විදේශිකයන් සංඛ්‍යාව දිනකට 3500ක් 4000කට ආසන්න යි. මහ බැංකුව හරහා Online ගෙවීම් පද්ධති සැකසීමට ක්‍රියා කිරීම ද වැදගත්. චෙක්පත් නිෂ්කාශනය ඊට හොඳ නිදසුනක්.

අපගේ බැංකු ක්ෂේත්‍රය තොරතුරු තාක්ෂණයෙන් ඉදිරියට ම ගිය අංගයක් ලෙස හැඳින්විය හැකි යි. වෙනත් පුද්ගලික අංශයේ එකදු ක්ෂේත්‍රයක්වත් එතරම් දියුණු වී ඉදිරියට ගමන් කර නැහැ. සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා ද දියුණු තාක්ෂණය යොදා ගැනීමට කටයුතු කර තිබෙනවා. විශේෂයෙන් ම ඇතැම් රජයේ රෝහල් මේ තොරතුරු තාක්ෂණයෙන් ඉදිරියට ගොස් තිබෙන්නේ මහජන සේවය සඳහා එය කෙතරම් අපූරු ලෙස භාවිත කළ හැකි ද යන්න මූර්තිමත් කරමින්. ඊට හොඳ ම උදාහරණය දොම්පේ රෝහල යි. ඔබ එහි ප්‍රතිකාර ලබා ගත්තේ නම් එම රෝහලේ මීට පෙර ඔබව පරීක්ෂා කළ වෛද්‍යවරුන්, නියම කළ ඖෂධ වට්ටෝරු, රෝග ලක්ෂණ, වෛද්‍ය වාර්තා ඇතුළු සියලු විස්තර ඇතුළත් වාර්තාවක් ලබා ගැනීමට පුළුවන්. එහි ඖෂධ නිකුත් කරන ඔසුසල පවා පරිගණකගත කර තිබෙන්නේ වඩාත් විනිවිද වූ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින්. මෙහිදී රෝගියාට නැවත සායනයට පැමිණිය යුතු නම් ඒ සඳහා දිනයක් සහ වේලාව වෙන් කර දෙන්නේ අනාවශ්‍ය ලෙස පෝලිම්වල වරු ගණන් රෝගීන් රස්තියාදු වීම වළක්වාලීමේ අපේක්ෂාවෙන්.

මීට පෙර පැවති එවැනි පෝලිම් ක්‍රම දැන් ක්‍රමයෙන් අහෝසි වන්නේ තාක්ෂණය නිසි පරිදි යොදා ගැනීම නිසයි. වාහන ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී දැන් පෝලිම් අවශ්‍ය නැත. තත්පර 57ක් තුළ වාහනයේ සිට ම ආදායම් බලපත්‍ර ලබාගත හැකි ස්ථාන දැන් අපට තිබෙන්නේ ඒ නිසයි. එහෙත් තාක්ෂණය භාවිත කොට අපට තව ඉදිරියට යා යුතු ක්ෂේත්‍ර ගණනාවක් තිබෙන බව මතක තබා ගත යුතු යි. මේ සියල්ල ඉටුකර ගැනීමට නම් සුහුරු තාක්ෂණයේදී ද වැදගත් අංගයක් වන අන්තර්ජාල පහසුකම් සැමට තිබිය යුතු යි. Cisco Ericson ආයතනය පවසන ආකාරයට 2020 වන විට අන්තර්ජාලය සම්බන්ධ විවිධ මෙවලම් එනම් (Internet of Things - IOT) 50ක් පමණ තිබිවිය හැකි යි. ඒ අනුව ඔබේ වාහනය, ශීතකරණය, රූපවාහිනිය පමණක්

**කෙසේ වෙතත් විවිධ ක්ෂේත්‍ර සඳහා තාක්‍ෂණය භාවිතාව අතින් අප තවමත් සිටින්නේ පහළ මට්ටමක. ප්‍රධාන වශයෙන්ම රාජ්‍ය අංශයේ මුදල් වැය කරන ප්‍රසම්පාදන ක්‍රියාවලියට තවමත් අප Online E Procurement ක්‍රමවේදය භාවිත කරන්නේ නැහැ. එහෙත් එය බහුතරයක් රටවල දැනටමත් භාවිත කරන්නක්.**



සුහුරු තාක්‍ෂණය කෘෂිකර්මයට භාවිත කරමින්

හොාව මගේ ශරීරය පවා අන්තර්ජාලයට සම්බන්ධ වීමට පුළුවන්.

නවීන තාක්‍ෂණික දියුණුවේ තවත් ප්‍රතිඵලයක් රොබෝ තාක්‍ෂණය. අද එය අපේ නිවසට පවා පැමිණ තිබෙන්නක්. ජපානය රොබෝ තාක්ෂණය ලොව වැඩි වශයෙන්ම භාවිත කරන රටකට හොඳම උදාහරණයක්. ඩ්‍රෝන තාක්‍ෂණය සමඟ එකතු වීමෙන් එය වඩාත් ඉදිරියට ගමන් කිරීමක් අපේක්ෂා කරනවා. මේ වන විට ලොව තාක්‍ෂණික දියුණුව කෙතරම් ද කියනවා නම් එදිනෙදා කටයුතු පහසු කිරීමේ අරමුණින් අතේ පැලඳිය හැකි උපාංගයක් ලෙස තාක්‍ෂණය නිර්මාණය වී අවසන්. එංගලන්තයේ ඇතැම් බැංකුවල ණය පත් (Credit Card) වැනි ද සම්පූර්ණයෙන් ම ඉවත් කර බැංකු කටයුතු සිදු කර ගැනීමට එය අතේ පැලඳිය හැකි උපාංගයක් ලෙස නිකුත් කිරීමට කටයුතු කිරීම ඊට හොඳ උදාහරණයක්.

මීට අමතරව ත්‍රිමාන (3D) ආකාරයෙන් අවශ්‍ය ඕනෑම දෙයක් මුද්‍රණය කිරීමේ තාක්‍ෂණික හැකියාව ද දැන් රටවල් ගණනාවක ක්‍රියාත්මක වෙනවා. චීනය, එහි වැඩි ප්‍රතිලාභ අත්පත් කරගත් රටක්. අනාගත අභ්‍යවකාශ තරණයේදී පවා බොහොමයක් රටවල් මේ ත්‍රිමාන මුද්‍රණ යන්ත්‍ර යොදාගැනීමට යි අපේක්‍ෂා කරන්නේ. සුහුරු තාක්ෂණයේදී අපට හමුවන තවත් සංකල්පයක් "සුහුරු නිවාස". ඒ යටතේ නිවසේ සිදු කෙරෙන සෑම කටයුත්තක් ම දුරස්ථ ව පාලනය කළ හැකි සේ ම දුරස්ථ ව අධීක්‍ෂණය කළ හැකි ද වෙනවා. ඒ අනුව දුරස්ථ ව සිට නිවසට ඇතුළුවීම, දුරකථනය, විදුලි බල්බ, රූපවාහිනිය වැනි උපාංග ක්‍රියාත්මක කිරීම හෝ පාලනය හෝ කළ හැකි වෙනවා. ලෝකයේ එසේ වේගයෙන් තාක්‍ෂණය දියුණු වන විට එහි ගෝලීය පාර්ශ්වකරුවකු වශයෙන් අප ද එම ගමන්මගෙහි ඉදිරියට යා යුතු වෙනවා. ඒ සඳහා අවශ්‍ය නව දැනුම අපේ දරු පරපුරට ලබා දිය යුතු වෙනවා. රටක් ලෙස අනාගත අපේක්‍ෂිත ඉලක්ක කරා ළඟා වීමට නම් එම අඩිතාලම් අනිවාර්යෙන්ම අප සැකසිය යුතු වෙනවා. ඒ නිසා අනාගත තාක්‍ෂණික අභියෝගවලට මුහුණ දීමට ද අප සූදානම් ව සිටිය යුතුයි. මේ වන විට උපාය මාර්ගික සැලසුම් සකස් කෙරෙන්නේ ඒ සියල්ලට ම මුහුණ දීමේ අරමුණින්.

(ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ දිනය නිමිත්තෙන් කොළඹ පැවැති ජාත්‍යන්තර සමුළුවේදී හා දෙසතියට ඉදිරිපත් කළ අදහස් ඇසුරිනි)



# සුහුරු රජයක් දියුණු රටක්



**මහාචාර්ය හේමන්ත් ජෝෂි**
ඉන්දියානු ජනසන්නිවේදන ආයතනය
නවදිල්ලිය

"සුහුරු පුරවැසියෙක් කියන්නේ රජයේ හෝ රාජ්‍ය නොවන හෝ සේවාවන් සඳහා සුහුරු ජංගම දුරකථන හෝ එවැනි වෙනත් තාක්ෂණ මෙවලම් හෝ භාවිතයෙන් ප්‍රවේශ වීමේ හැකියාව ඇති පුද්ගලයෙක්. සුහුරු පුරවැසියෙක් වීමට නම් ඔවුන්ට සුහුරු තාක්ෂණයක්, සුහුරු රජයක්, සුහුරු බැංකුකරණයක් වගේ ම සුහුරු ව්‍යාපාර අවශ්‍ය වෙනවා. සුහුරු තාක්ෂණය භාවිත කිරීමේදී එම ජාලය මන්දගාමී නොවිය යුතු යි.

එමෙන් ම සුහුරු රජයක් කියන්නේ තාක්ෂණය යොදා ගනිමින් පුරවැසියන් සමඟ සම්බන්ධ වන්නේ කෙසේ ද යන්න පිළිබඳ අවබෝධයක් ඇති ආයතනයක්. එහිදී පුරවැසියා දන්නා භාෂාවෙන් සන්නිවේදන තාක්ෂණය යොදා ගෙන ඔවුන් සමඟ සම්බන්ධ වීමට රජයට හැකි විය යුතු යි. ඒ අනුව තමන්ගේ කටයුතු තමන්ට ම පාලනය කර ගැනීමට එමඟින් හැම පුරවැසියකුට ම හැකියාව ලැබෙනවා.

2016 වන විට ලොව පුරා සුහුරු ජංගම දුරකථන Smart mobile භාවිතය බිලියන 2 කින් පමණ වැඩි වී තිබෙනවා. ඉන්දියාවේ එම දුරකථන භාවිතය මිලියන 201.4ක්. ප්‍රතිශතයක් ලෙස එය ජනගහනයෙන් 17%ක්. ලංකාවේ සුහුරු දුරකථන භාවිතය මිලියන 2.75ක්. එය ජනගහනයෙන් 13.23%ක්. එහෙත් එහි තේරුම සුහුරු දුරකථන (Smart Phone) නොමැති නම් e රාජ්‍යයකට (e governance) යාමට නොහැකියි යන්න නොව භාවිත කරන ප්‍රමාණය අඩුවන විට සුහුරු බව ද අඩු වෙන බව යි.

මේ වන විට ලොව පුරා අන්තර්ජාල භාවිතය ද ක්‍රමෙන් වර්ධනය වී තිබෙනවා. දැනටමත් ලෝක ජනගහනයෙන් 50%ක් පමණ අන්තර්ජාල පරිශීලනය කරන අතර ඉන්දියාවේ එය 36.5%ක්. ලංකාවේ 27.4%ක්. එය ඉදිරියේදී තවත් වර්ධනය වේවි. මීට හේතුව සුහුරු දුරකථන තාක්ෂණය යි. නාගරික මෙන් ම ග්‍රාමීය වශයෙන් ද වර්ධනය වී ඇති ජංගම දුරකථන භාවිතය ලංකාවට වඩා ඉන්දියාවේ වේගයෙන් වර්ධනය වීමක් දක්නට පුළුවන්.

1994, 95 කාලවකවානුවේදී e පාලන (e governance) ව්‍යාපෘතිය පැමිණීමත් සමඟ හින්දි සහ ඉංග්‍රීසි පමණක් නොව විවිධ භාෂා භාවිත කිරීමේ වැදගත්කම තේරුම් ගැනීමට හැකි වුණා. ඒ අනුව කමිටුවක් ස්ථාපිත කර එක් එක් ප්‍රදේශයට උචිත පරිදි විවිධ භාෂා භාවිත කරමින් වෙබ් අඩවි සකස් කෙරුණා. මේ නිසා අද වන විට බැංකුකරණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, කෘෂිකර්මය, ග්‍රාමීය සංවර්ධනය වැනි විවිධ ක්ෂේත්‍ර කරා e තාක්ෂණය ව්‍යාප්ත වී තිබෙනවා. මේ සඳහා රජය පමණක් නොව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය ක්‍රියාත්මක වීම ද ඉතා වැදගත්. එසේ අඛණ්ඩ ව ක්‍රියාත්මක වූ e පාලන ව්‍යාපෘතිය තවදුරටත් වැඩි පුද්ගල සංඛ්‍යාවක් අතරට ගෙන යෑමේ අරමුණින් ජංගම (mobile) තාක්ෂණයට යොමු කෙරෙනවා. e පාලනයේ සිට mobile පාලනය දක්වා යොමු වන්නේ ඒ ආකාරයෙන්. එය වඩාත් සාර්ථක වන්නේ එ මඟින් අත්‍යවශ්‍ය සේවා ඇතුළු සෑම සේවාවක් ම ලබා දීමෙන්. ඒ සඳහා ජංගම දුරකථන සඳහා ප්‍රවිෂ්ට විය හැකි විවිධ Apps ඉදිරිපත් කර තිබෙනවා. එමඟින් අධ්‍යාපනය ලබන දරුවන්ට ඔවුන්ගේ විෂය මාලාවට අදාළ පෙළ පොත්වල අවශ්‍ය පරිච්ඡේද බාගත (download) කර ගත හැකි වීම ඊට එක් නිදසුනක්. ඇතැම් දරුවන්ට පෙළපොත් සම්බන්ධයෙන් පැවැති ගැටලුවලට මෙය හොඳ විසඳුමක්.

ග්‍රාමීය ප්‍රදේශවල සිටින දරුවන්ට වඩා නාගරික ප්‍රදේශවල දරුවන්ට දැනටමත් මේ පහසුකම් ලැබෙනවා. ඉන්දියානු වෙළෙඳපොළ තුළ පෙරදී රු. 15,000ක් පමණ වූ සුහුරු දුරකථනයක (Smart Phone) මිල මේ වන විට ඉන්දියානු රුපියල් 4000කට පමණ අඩු වී තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී ග්‍රාමීය ප්‍රදේශවලට ද එය ව්‍යාප්ත වීමේ ඉඩකඩ වැඩි යි. එමඟින් විශාල වෙනසක් ඇති කළ හැකි බව යි අපගේ විශ්වාසය. සුහුරු තාක්ෂණය භාවිත කිරීමේදී පැන නඟින ගැටලුවලට විසඳුම් සෙවීම ද අවශ්‍ය යි. ඒ සඳහා රාජ්‍ය මට්ටමින් මැදිහත්වීම අත්‍යවශ්‍ය යි. එහිදී අප හොඳ වේගවත් ජාලයකට සම්බන්ධ වීමත් සෑම පුද්ගලයකු ම සතුව Smart දුරකථනයක් තිබිය යුතු වීමත් වැදගත්. සුහුරු පුරවැසියකු බිහිකර ගැනීමේ සිහිනය යථාර්ථයක් වීමට නම් ඔවුන් සෑමට සුහුරු තාක්ෂණය ලබා දීමත් වැදගත්.

(ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ දිනය නිමිත්තෙන් කොළඹ පැවැති ජාත්‍යන්තර සමුළුවේදී ඉදිරිපත් කළ අදහස් ඇසුරින්)

චම්මි ජයනෙත්ති

# නුහුරු සුහුරු හුරු කරවමු

**සුනිල් හෙට්ටිආරච්චි**
ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය.



**රටේ අනාගතය භාර ගැනීමට සිටින අපේ දරු පරපුරට නිසි අධ්‍යාපනයක් ලබා දීම අප කාගේත් වගකීමක්. ඒ සඳහා රටේ අධ්‍යාපන විප්ලවයක් සිදු කිරීමයි වත්මන් රජයේ අරමුණ. එම ශක්තිමත් අඩිතාලම සකසමින් පන්ති කාමරය තුළට දැන් සුහුරු තාක්ෂණය ගෙනැවිත් තිබෙනවා.**

**ලෝකය** වෙනස්වන විට අධ්‍යාපනය ද වෙනස් විය යුතු යි. එය දරුවාට ලබා දෙන ආකාරය, උගන්වන ආකාරය ද වෙනස් විය යුතු යි. අද ලොව ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම නවීකරණය වී තිබෙනවා. විශේෂයෙන් ම පන්ති කාමරයේදී දරුවා සහ ගුරුවරයා අතර සබඳතාව අතරට තාක්ෂණය පැමිණ තිබෙනවා. කළුලෑල්ල, සුදු ලෑල්ල, රට හුණු කෑල්ල වෙනුවට පැමිණි තාක්ෂණය අද වඩාත් හුරුබුහුටි කර තිබෙනවා. මේ නිසා ගුරුවරයා හා සිසු දරුවා අතර සබඳතාව වැඩි කිරීමට එය උපකාර වී තිබෙනවා. අවුරුදු 81ක් පැරණි අධ්‍යාපන අමාත්‍යාංශය දැන් වෙනස් වීමට පටන්ගෙන තිබෙනවා. එහිදී **Smart Technology** (සුහුරු තාක්ෂණය) භාවිත කරන්නේ දරුවා නූතන ලෝකයට නොව අනාගත වැඩ ලෝකයට සූදානම් කිරීමට යි. ඉන් සැකසෙන්නේ ශ්‍රී ලංකාවට පමණක් සීමා වූ දරුවකු නොව ලෝකයට ම ගැළපෙන දරුවෙක්. **Global Citizen** (ගෝලීය පුරවැසියකු) සැකසීමට නම් විශේෂයෙන් ම ඉගැන්වීමේ තිබෙන නව ක්‍රමවේද භාවිත කර අධ්‍යාපනය වෙනස් විය යුතු යි. ඒ නිසා සුහුරු පුරවැසියකු බිහි කිරීමට නම් සුහුරු අධ්‍යාපනයක් **(Smart Education)** ලබා දිය යුතු යි. මේ සඳහා දැනටමත් ගුරුවරුන් පුහුණු කෙරෙනවා.

එපමණක් නොව මේ වන විට අප සුහුරු පන්ති කාමරය ද **(Smart class room)** ආරම්භ කර තිබෙනවා. එම අත්හදා බැලීම පළමු ව සිදු කළේ ශ්‍රී ජයවර්ධනපුර මහා විද්‍යාලයේ. 2020 වසර වන විට සමස්ත පාසල් පද්ධතියේ ම සුහුරු පන්ති කාමර තුළ සුහුරු අධ්‍යාපනය සාර්ථක ව ආරම්භ කිරීමට යි අපේක්ෂා කරන්නේ. ඒ නිසා ඉදිරියේදී පාසල්වල විවිධ විෂයයන් ඉගැන්වීමට මෙන් ම ඇගයීම් කටයුතු සඳහා ද සුහුරු තාක්ෂණය භාවිත කිරීම යි අපේක්ෂාව වන්නේ.

ඒ අනුව මෙරට ලක්ෂ 45ක් පමණ වූ සිසු පරපුරට සමස්ත පාසල් පද්ධතිය ම ඩිජිටල්කරණය වීමෙන් නව තාක්ෂණික දැනුම ලබා ගැනීමට හැකි වෙනවා. එහි ප්‍රථම පියවර ලෙස 2018 වසරේදී මෙරට නාගරික පාසල් 50ක සුහුරු පන්ති කාමර 50ක් ආරම්භ කිරීමට නියමිත යි. ඒ සමඟ ම සියලු විෂය ධාරාවන්හි විභාග ආදිය ද සුහුරු ක්‍රමයට පරිවර්තනය කරනවා. මේ අනුව ඉදිරියේදී මෙරට පාසල්වල පන්ති කාමරවල සියලු ඉගැන්වීම් ඩිජිටල්කරණය වනු ඇති. එපමණක් නොව මේ වසර අවසානයේදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත් ම පද්ධතියක් වන විභාග කටයුතුවලදී විභාග ඇගයීම් මෙන් ම ඔන්ලයින් **(Online)** විභාග ප්‍රශ්න පත්‍ර ලබා දෙන ක්‍රමවේදයක් ආරම්භ කිරීමට යි සැලසුම් කර තිබෙන්නේ.

එලෙස සියලු ම පාසල් දරුවන් අනාගතයේදී තාක්ෂණික දැනුමෙන් යුතු දක්ෂයන් බවට පත් කරන ළමා හිතකාමී ප්‍රියමනාප පාසලක් මේ යටතේ බිහි කෙරෙනු ඇති. ඒ සඳහා ක්‍රමානුකූල ව ඉදිරි වසර 4 තුළ **e** අධ්‍යාපනයට ප්‍රවිෂ්ට විය හැකි යි. එපමණක් නොව මේ වැඩපිළිවෙළ යටතේ දෙමව්පියන්ට තම දරුවා පන්ති කාමරය තුළ සිටින්නේ ද යන්න වුව දැක බලා ගැනීමට හැකි පරිසරයක් 2020 වසර වන විට නිර්මාණය කිරීමට අපේක්ෂා කරනවා. සමස්ත වැඩපිළිවෙළ පිළිබඳ දෙමව්පිය දැනුවත්භාවය මෙහිදී ඉතා ම වැදගත්.

ක්‍රියාත්මක කිරීමට නියමිත මේ නව තාක්ෂණික වැඩපිළිවෙළ යටතේ **e - books** (විද්‍යුත් පොත්) භාවිත කරන නිසා මෙතෙක් කලක් පෙළ පොත් මුද්‍රණයට වාර්ෂික ව වැය කළ විශාල මුදල් ප්‍රමාණය ඉතිරි කර ගැනීමට පුළුවන්. 2017 වසරේදී පෙළ පොත් බෙදා හැරීමට එලෙස වැය කළ මුදල රුපියල් බිලියන 4.5ක්. නව තාක්ෂණය හරහා භාවිත **e books, e library** (**e** පුස්තකාල), සුහුරු පන්තිකාමර යනාදිය නිසා කොළඹට මෙන් ම දුෂ්කර පළාත්වලට ද එම සේවා එක හා සමාන ව ලබා ගත හැකි වෙනවා. එය සමස්ත පාසල් පද්ධතියේ සමානාත්මතාව තවදුරටත් තහවුරු කිරීමට ඉවහල් වන්නක්.

අධ්‍යාපන ක්ෂේත්‍රයේදී පාසල් පරිපාලනය පවත්වාගෙන යාම අප මුහුණපාන තවත් ප්‍රධාන ගැටලුවක්. එම පද්ධතියට අයත් පාසල් 11,000ක ගුරුවරු 2,35,000ක් සිසු දරුවන් ලක්ෂ 45ක්, පන්ති කාමර 1,68,000ක් පාලනය කිරීම එතරම් පහසු කටයුත්තක් නොවෙයි. එහෙත් හඳුන්වා දෙන නව සුහුරු තාක්ෂණය නිසා එම කාර්යය වඩාත් පහසු වෙනවා. නවීන තාක්ෂණය නිසා ලොව පුරා ළමයින් පාලනය කළ නොහැකි අයුරින් පරිගණක ක්‍රීඩා ආදියට යොමු වී ඇති බව පර්යේෂණවලින් සොයා ගෙන ඇති කාරණාවක්. එහෙත් පන්ති කාමර තුළ සුහුරු තාක්ෂණය යොදා ගැනීමේදී පාසල් අධ්‍යාපනයට අදාළ විෂයයන්වලට පමණක් ප්‍රවේශ විය හැකි ලෙසිනුයි නව ඩිජිටල් පන්ති කාමර සැලසුම් කෙරෙන්නේ.

එහිදී පාසල පවත්වන කාලය තුළ සිසු සිසුවියන්ට සුහුරු තාක්ෂණය පිළිබඳ නව දැනුම ලබා දීමට විවිධ ක්‍රම හඳුන්වාදෙන අතර පස්වරු 1.00න් පසුව තාක්ෂණය ගමට ගෙන යාමේ අරමුණින් "පාසල" භාවිත කරන්නේ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයක් ලෙසින්. ඒ අනුව පාසලේ පරිගණක විද්‍යාගාර භාවිත කරමින් ගමේ ජනතාව සහ පාසල ආශ්‍රිත ප්‍රජාව වෙත තාක්ෂණික දැනුම ගෙනයාමට අවශ්‍ය සැලසුම් සකස් කෙරෙනවා. මේ ක්‍රමය මගින් ගොවියන්ට මෙන් ම ගම්වාසීන්ට නව තාක්ෂණික ක්‍රම පිළිබඳ අවබෝධයක් ලැබෙන නිසා ඒ හරහා රජයේ කටයුතු පහසුවෙන් සිදු කරගෙන යාමට ද පුළුවන්.

**චමීම් ජයනෙත්ති**

(ජාත්‍යන්තර තොරතුරු දැනගැනීමේ දිනය නිමිත්තෙන් කොළඹ පැවැති ජාත්‍යන්තර සමුළුවේදී හා දෙසතියට ඉදිරිපත් කළ අදහස් ඇසුරින්)



# පිරිපුන් සැලැස්මක් ඕනෑ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
**මංජුල උදයංග හේමපාල**
විදුලි ඉංජිනේරු අංශය
මොරටුව විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ බොහෝ දෙනෙක් විශ්වාස කරන්නේ ස්මාර්ට් කිව්වම ස්මාර්ට් ජංගම දුරකථනය පමණයි. එහෙත් ඒ මතය වැරැදි යි. ස්මාර්ට් හෙවත් සුහුරු තාක්ෂණය කියන්නේ දැනට පවතින ස්වරූපයෙන් එහාට ගොස් යම් දෙයක් කර ගැනීමට ඇති හැකියාව යි. සරලව ම පැවසුවොත් යමක් ඉතාමත් සරල ව කර ගැනීමට ඇති හැකියාව යි. එය ජංගම දුරකථනයකට පමණක් සීමා නොවී ඕනෑම දෙයක් සඳහා යොදාගත හැකි වනවා. මෙහි ඇති ප්‍රධානතම ලක්ෂණ දෙකක් වන්නේ ඉක්මන්කම හා අඩු වියදම යි. වෙළෙඳපොළට ගැළපෙන අයුරින් අද ස්මාර්ට් යන වචනය වෙනත් අර්ථකතනවලට භාජනය කර තිබෙන බව යි අපේ අධ්‍යයනවලින් පැහැදිලි වන්නේ. නිදසුනක් ලෙස, වෙළෙඳපොළේ ඇති ස්මාර්ට් ජංගම දුරකථනයකින් අනෙක් දුරකථනවලට වඩා ඉක්මනින් ඇමතුමක් ගත හැකි ද? එය අඩු මිලෙන් යුතු ද? යන ගැටලු අපට තිබෙනවා.

රටක අවශ්‍යතාව වන්නේ සියල්ල ම ඉක්මනින් හා අඩු වියදමින් කර ගැනීම යි. ඒ නිසා ම යි ශ්‍රී ලංකාවේ විදුලි පද්ධතියටත් මේ සුහුරු තාක්ෂණය අන්තර්ගත කළ යුතු වන්නේ. එහෙත් මුලින් ම හඳුනාගත යුතු වන්නේ ඒ සඳහා රට තුළ පවතින ගැටලු හා බාධා මොනවාද යන්න යි. ඉංජිනේරුවන් ලෙස අප විමසිලිමත් විය යුතු යි මෙවැනි දෙයක් රටේ ස්ථාපනය කිරීමට පෙර ප්‍රධාන කරුණු තුනක් පිළිබඳ ව. ඉන් පළමුවැන්න වන්නේ එවැන්නක් හමුවේ රටේ යම් කිසි පාරිසරිකමය ගැටලු මතුවන්නේ ද යන්න. දෙවැන්න සමාජීය ගැටලු සහ තෙවැන්න ඉන් රටට ලැබෙන ආර්ථිකමය වටිනාකම කුමක්ද? යන්න. එහෙත් වර්තමානයේදී බොහෝ විට මේ පැති තුන ම පිළිබඳ එක සමාන ව අවධානය යොමු වන්නේ නැහැ.

විශේෂයෙන් අපේ විදුලිබල පද්ධතියේ බොහෝ ගැටලු තිබෙනවා. පසුගිය කාල වකවානුවල ලංකාවේ ම එකවර විදුලිය බිඳවැටීම් ගණනාවක් සිදු වුණා. එසේ සිදුවන බව ගණනයන් මඟින් කලින් දැනගැනීමට නොහැකි වීම ඊට හේතුව යි. යම් අයකු ඔප්පු කරන්නට පුලුවන් මේ බිඳවැටීම් ස්මාර්ට් විදුලි පද්ධතියක් තිබුණා නම් සිදු නොවන බව. එහෙත් එය ම ප්‍රමාණවත් වන්නේ නැහැ එවැනි තාක්ෂණයක් ලංකාවේ ස්ථාපනය කළ යුතු බවට. තමා වෙසෙන නිවෙස්නය සුහුරු තාක්ෂණයට නතු නොකර විදුලිබල පද්ධතිය පමණක් සුහුරු තාක්ෂණයෙන් සන්නද්ධ කළාට ඵලක් නැහැ. එය අදාළ කාරණයෙන් ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රමාණවත් වන්නේ නැහැ. උදාහරණ වශයෙන් විදුලිය බෙදාහරින ට්‍රාන්ස්ෆෝමර් සුහුරු තාක්ෂණයට භාජනය කරනවා සේම නිවෙස් සඳහා ලබා දෙන විදුලි මීටර් ද එම තාක්ෂණය සහිත විය යුතු යි. එසේ වුවහොත් පමණයි විදුලි පද්ධතියේ යම් කිසි බිඳවැටීමක් සිදුවන්නේ නම් එසේ සිදුවීමට පෙර එම ආපදාව පිළිබඳ දැන ගැනීමට හැකි වන්නේ. එසේ නැතිනම් ආපදාව සිදු වූ පසු ගැටලුව ඇති තැන ද පැහැදිලි ව සොයා ගත හැකි වනවා. බොහෝ පිරිස් මෙවැනි ආපදා හමුවේ බැන වදින්නේ ඉංජිනේරුවන්ට යි. එහෙත් ඉංජිනේරුවන් කරුණු සොයා බලන්නේ යම් කිසි දත්ත අනුව යි. ඒසේ කරුණු සලකා බලන්න දත්ත නොමැති නම් හරි නිගමනයක් දීමට ඉංජිනේරුවන්ට ද හැකියාවක් නැහැ. ඒ අනුව ස්මාර්ට් විදුලි පද්ධතියක අවශ්‍යතාව රට හමුවේ ඇති බව පෙනී යනවා.

එහෙත් මෙවැනි තාක්ෂණයක් මුලුමනින් ම රටේ ස්ථාපිත කරන්නට යන වියදම රටේ ආර්ථිකය අතින් කොතරම් ඵලදායී වන්නේ ද යන්න ලබාගත හැකි ගැටලුවක් තිබෙනවා. එහෙත් මේ සඳහා අදාළ ප්‍රදේශ තෝරාගෙන මේ කාර්යය සිදු කිරීම මඟින් යම් ඵලදායිතාවක් ලබා ගත හැකි බව යි මගේ හැඟීම. විශේෂයෙන් දැනට නිවාස මට්ටමින් සිදුකරමින් පවතින සූර්ය කෝෂ විදුලි පද්ධති ක්‍රමය හොඳ වැඩපිළිවෙළක්. මේවා පුනර්ජනනීය බලශක්ති ලෙස හඳුන්වන්න පුලුවන්. මේවායින් තමා භාවිත කරන විදුලි ප්‍රමාණයට අමතර ව ජනනය කරන විදුලිය ප්‍රමාණය ජාතික විදුලි පද්ධතියට ද එක් කරනු ලබනවා. මෙහි ඇති ගැටලුව වන්නේ එසේ එකතුවන විදුලි ප්‍රමාණ දත්ත ලෙස ගණනය නොවීම යි. ඉන් තිබුණාට වඩා බොහොමයක් විදුලිය බිඳවැටීම් සිදුවීමට ඉඩකඩ තිබෙනවා. අනෙකුත් රටවල පුනර්ජනනීය බලශක්ති භාවිත කරනවා නම්, මුළු විදුලි පද්ධතිය ම සුහුරු තාක්ෂණයට නතුකර තිබෙනවා. එය යි වඩා යෝග්‍ය වන්නේ. එසේ කිරීම අමෙරිකාව, යුරෝපය වැනි රටවලට සුදුසු වන්නේ ඔවුන් සතුව තාක්ෂණය පවතින නිසා. සූර්ය කෝෂ මෙන් ම අනෙකුත් ස්මාර්ට් උපකරණ සියල්ලක්ම ඔවුන් විසින් නිර්මාණය කිරීම වඩා ලාභදායී වනවා. එහෙත් ලංකාව වැනි රටකදී මේ සියල්ලක්ම විශාල පිරිවැයක් යොදා වෙනත් රටකින් ආනයනය කිරීමට සිදු වීම කනගාටුවට කරුණක්.

මෙවැනි ආයෝජනයක් හමුවේ පාරිසරික පැත්තෙන් සුබවාදී වුව ද ආර්ථික පැත්තෙන් ගත් විට ඉන් ප්‍රතිලාභ ලැබීමට වසර ගණනාවක් සිටීමට සිදු වනවා. එය සමාජීය ගැටලුවක් බවට පත්වීමට ද වැඩි කලක් ගත නොවන බව යි මා විශ්වාස කරන්නේ. එහෙත් සුහුරු තාක්ෂණය රටකට අතිශයෙන් වැදගත් වනවා. මේ සඳහා තිබිය යුතු යි අප යන මාර්ග සැලැස්මක්. එය ගෙන එන්නේ කවදා ද ? කොහොම ද ? ඉන් ජනතාවට ප්‍රතිලාභ ලැබෙන්නේ කොහොම ද ? ප්‍රතිලාභ ලැබෙන්නේ කවදාද? යනාදී කරුණු සියල්ලක්ම ඒ මාර්ග සැලැස්මේ තිබිය යුතු යි.

සංජීව පෙත්තාවඩු

# රැල්ලට අනුව යාමට නොවේ



**මේජර් ඩී. ඒ. ඩී. වානගුරු**
විදුහල්පති
ශ්‍රී ජයවර්ධනපුර මහා විද්‍යාලය

සුහුරු පන්ති කාමර (Smart Class Rooms) සංකල්පය පිළිබඳ ව සහ එය සකස් වී ඇති ආකාරය දුටු විට පාසලෙන් බැහැර ප්‍රජාවට මේ සම්බන්ධයෙන් යම් සැකයක් නැත්නම් සුළු බියක් තිබෙනවා. ඊට හේතුව මේ තාක්ෂණික මෙවලම්වලින් ළමයින්ට සිදුවන අවැඩදායක තත්ත්වය පිළිබඳ ව අසන්නට දකින්නට ලැබෙන කාරණා අනුව ඔවුන් තුළ යම් චකිතයක් තිබීම යි. තාක්ෂණය කියන්නේ පිහියක් වැනි දෙයක්. පිහියක් එළවළු, පලතුරු කැපීම් වැනි අත්‍යවශ්‍ය කාර්යයන්ට මෙන් ම මිනිසකුගේ ජීවිත හානිය සිදු කිරීමට ද කෙනකුට යොදා ගත හැකියි. එහෙත් පිහිය, අප අත් නොහැර එය අත්‍යවශ්‍ය හොඳ දෙය වෙනුවෙන් ප්‍රයෝජනයට ගන්නවා. ඒ වගේ ම තමයි තාක්ෂණයත්. එහි නරක පැත්ත ඉවත් කර හොඳ පැත්ත ප්‍රයෝජනයට ගන්නවා.

වසර ගණනාවක් පුරා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළෙමින් සමීක්ෂණ සිදුකරන අපට මේ තාක්ෂණය මඟින් දරුවන්ට සිදු වන අයහපත් දේ පිළිබඳ ව හොඳ අවබෝධයක් තිබෙනවා. ඒ නිසා එවැනි දේ සඳහා දරුවන්ට යොමු විය නොහැකි ලෙස ඒවා අවහිර කරමින් අධ්‍යාපනය සඳහා තාක්ෂණය යොදා ගැනීමේ උපරිම ඵල නෙළා ගැනීමටයි මෙහිදී අවකාශය සලසා තිබෙන්නේ. ඒ අනුව මෙහිදී ගුරුවරුන් උගන්වන දෙය මෙන් ම දරුවන් ඉගෙන ගන්නා දේවල් මොනවා ද? යනාදී සියලු ම කාර්යයන් පිළිබඳ ප්‍රධාන පාලක පද්ධතිය මඟින් අපට අධීක්ෂණය කළ හැකි යි. උදාහරණයක් ලෙස, වෙබ් අඩවි (Web Site), මුහුණු පොත (Face Book) වැනි දෑ මෙන් ම විවිධ Apps එකතු කිරීම වැනි දරුවන්ට අයහපත් යැයි ගැනෙන සියල්ල අවහිර කරමින් අධ්‍යාපනයට අවශ්‍ය වන තාක්ෂණය භාවිත කිරීම මෙහි විශේෂත්වයක්. ඒ සඳහා ගුරුවරුන්ට අමතර ව විදුහල්පති ලෙස මා පෞද්ගලික ව ම ඒ සියල්ල අධීක්ෂණය කරනවා. ඒ අනුව ළමයින්ට සිදුවන අවැඩදායක තත්ත්වය මින් සම්පූර්ණයෙන් ම ඉවත් කර තිබෙන බවට සහතික වීමට පුළුවන්.

මේ වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු ම පහසුකම් ගුරුවරුන්ට ද ලබා දී තිබෙනවා. ඒ අනුව ඒ සෑම ගුරුවරයකුට ම ලැප්ටොප් එකක්, දත්ත රඳවනයක් (Pen Drive) ලැබී තිබෙනවා. තාක්ෂණික මාධ්‍යයෙන් ඉගැන්වීමට අවශ්‍ය පුහුණුව ද ලබා දී තිබෙනවා. දරුවන්ගේ අධ්‍යාපන ප්‍රගතිය විමසා බැලීම සඳහා පළමු වාර පරීක්ෂණයෙන් පසුව සංඛ්‍යානුකූල ව ලකුණු ලබා දෙනවා. ඒ පිළිබඳ අප පෞද්ගලික ව ම අධීක්ෂණය කරන්නේ මෙවැනි වැඩසටහන් මඟින් අපේක්ෂිත ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු වී තිබේද යන්න විමසා බැලීමට යි. මේ වැඩසටහනට සාමාන්‍ය අධ්‍යාපනයේදී වඩාත් ම දුර්වල ළමයින් කිහිපදෙනකු ද ඇතුළත් ව සිටිනවා. ඔවුන්ගේ දෙමාපියන් පවසන පරිදි ඔවුන් පරිගණකයට ඇබ්බැහි වූ දරුවන්. එම ඇබ්බැහිය හොඳ පැත්තට යොමු කරලීමට හැකි වීම මේ වැඩසටහනේ තවත් වැදගත්කමක්.

ඒ සඳහා ගුරුවරුන් දරුවන්ට නිසි පරිදි ශිල්ප ලබා දිය යුතු යි. මේ ගුරුවරුන් ඉතා ම උනන්දුවෙන් ඒ කාර්යය, වගකීම ඉටු කරන බව අද මට ඉතා ම සතුටින් කියන්නට පුළුවන්. ඉදිරි මාස 3කට අවශ්‍ය අධ්‍යාපන සැලසුමක් අනුව ඔවුන් සිය ඉගැන්වීම් කටයුතු සකස් කරන්නේ අපගේ ද



චානිකා රත්නායක ගුරුතුමිය සමඟ සුහුරු පන්තියේ දරුවන් දැනුම බෙදා ගනිමින්

**අප පෞද්ගලිකව ම අධීක්ෂණය කරන්නේ මෙවැනි වැඩසටහන් මඟින් අපේක්ෂිත ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු වී තිබේද යන්න විමසා බැලීමට යි. මේ වැඩසටහනට සාමාන්‍ය අධ්‍යාපනයේදී වඩාත්ම දුර්වල ළමයින් කිහිපදෙනෙක් ද ඇතුළත් ව සිටිනවා.**

අනාදිමත්කින් තොරව යි. එය ඉතා ම අගය කළ යුතු යි. දරුවන්ට සිය විෂයයන් හැදෑරීමේදී ඒ එක් එක් විෂයයන් සඳහා වෙන ම Apps තිබෙනවා. පෙළ පොත් පවා තිබෙන්නේ ටැබ් එකේ. දරුවන් සටහන් මෙන් ම රචනා ලිවීමට ද භාවිත කරන්නේ එම ටැබ් පරිගණකය යි. අධ්‍යාපනඥයන් ලෙස මෙම වැඩසටහන පර්යේෂණාත්මක ව සකස් කර තිබෙන්නේ රැල්ලට අනුව යාමට නොව සැබෑ ලෙස මේ අධ්‍යාපනයේ උපරිම ඵල ලබා ගත හැකි ලෙස යි.

කෝජේන් (CODGEN) ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි ආචාර්ය හර්ෂ සුබසිංහ මහතාගේ අදහසකට අනුව සහ විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ආචාර්ය හර්ෂ ද සිල්වා මහතාගේ ප්‍රතිපාදන සහාය මත මේ වැඩසටහන ක්‍රියාත්මක කළ බව මා මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු යි. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යංශයේ මැදිහත්වීමද තවදුරටත් ලැබෙන්නේ නම් අපට මෙය වඩාත් දියුණු කළ හැකි යි.

මේ වසරේ ජනවාරි 13 වැනි දා ඇරඹි අපේ ප්‍රථම ස්මාර්ට් පන්ති කාමරයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන සිසු දරුවන් සංඛ්‍යාව 17ක්. ඊට අමතර ව පෙළ පොත භාවිත කරන සිසුන්ට ද ඔවුන්ගේ විෂයමාලාවලට අදාළ වීඩියෝ දර්ශන ආදිය පරිශීලනය කිරීමටත් ගුරුවරුන්ගේ උපදේශකත්වය මත මෙහිදී අවකාශය ලබා දී තිබෙනවා. ඉදිරියේදී එම සිසු දරුවන් සියලු දෙනාට ම මෙවැනි පහසුකම් ලබාදීම යි අපේ අපේක්ෂාව. ඒ සඳහා ලබන වසරේදී ද මෙවැනි ස්මාර්ට් පන්ති කාමරයක් ඇරඹීමට අප සැලසුම් කර තිබෙනවා. වසරින් වසර ක්‍රියාත්මක කිරීමට නියමිත එම වැඩසටහනට අදාළ බලධාරීන්ගේ සහාය ලැබෙන්නේ නම් අපට එම අපේක්ෂා ඉටු කර ගැනීමට පුළුවන්.

**චම්මි ජයනෙත්ති**



# සහල් මිලේ බාලගිරි අවසන් ද?

**ශ්‍යාමා සන්ධ්‍යානායකගේ**

**ආර්ථික** විද්‍යාවේ න්‍යායයන්ට අනුව වී සහ සහල් වෙළෙඳපොළ පූර්ණ තරගකාරී එකක් විය යුතු බවට යි පිළිගැනීම. එහෙත් වර්තමාන වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය විමසන විට පෙනී යන්නේ එය අතරමැදියන්ගේ ක්‍රියාකාරිත්වය මඟින් පාලනය වන්නක් බව යි. එසේ ම වෙළෙඳපොළක නිෂ්පාදකයන්, අතරමැදියන්, තොග හා සිල්ලර වෙළෙඳුන් සියලු දෙනා ම අවසානයේදී පත්වන්නේ පාරිභෝගිකයන් බවට. මේ නිසා සහල් පාරිභෝගිකයන් පිළිබඳ ව සුළුවෙන් සිතන්නට බැහැ. එයට හේතුව සහල් යනු එදානෙදා භාවිතයට ගන්නා ආහාර ද්‍රව්‍ය ලැයිස්තුවේ ඉහළින් ම සිටින පාරිභෝගික ද්‍රව්‍යය වන නිසා.

මෙරට ඒක පුද්ගල සහල් පරිභෝජනය වසරකට කිලෝ ග්‍රෑම් 110ක් පමණ. මාසික සහල් අවශ්‍යතාව මෙ. ටො. මිලියන 1.94ක්. ඒ අනුව වාර්ෂික අවශ්‍යතාව සාමාන්‍යයෙන් මෙ. ටො. මිලියන 2.33ක්. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි භෝග පුරෝකතන වාර්තාවට අනුව 2016 සමස්ත වී අස්වැන්න මෙ. ටො. මිලි. 4.47ක්. එය සහල් බවට පත් කළ විට සහල් ප්‍රමාණය මෙ. ටො. මිලි. 2.77ක් . ඒ අනුව බැලූ විට 2017 වසර ආරම්භ වන විටත් සහල් මෙ. ටො. 4,43,000ක ප්‍රමාණයක් රට තුළ තිබූ බව යි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගණන් බැලීම. මේ අනුව රට තුළ කිසිදු සහල් හිඟයක් නොතිබූ බවත් එම ප්‍රමාණය පෙබරවාරි මාසය දක්වා ප්‍රමාණවත් වූ බවත් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේ අලෙවි හා ආහාර ප්‍රතිපත්ති කෘෂි ව්‍යාපාර අංශයේ අංශ ප්‍රධානී ඩබ්. එස්. දුමින්ද ප්‍රියදර්ශන පවසනවා.

මේ අදහස සමස්ත ලංකා ගොවිජන සම්මේලනය ද සනාථ කරනවා. එහි ජාතික සංවිධායක නාමල් කරුණාරත්න පවසන්නේ එළඹෙන යල කන්නයේ වී අස්වැන්න කොතරම් අඩු වුවත් 2018 පෙබරවාරි මාසය දක්වා ප්‍රායෝජනයට ගැනීමට තරම් රටේ සහල් තොග තිබෙන බව යි. "මේ මිල ඉහළ යාම සහල් මාෆියාවක ප්‍රතිඵලයක්" ඔහු පවසනවා.

එසේ වුවත් අතරමැදියන්ගේ ක්‍රීඩාවේ අවසාන ප්‍රතිඵලය වූයේ සාමාන්‍ය සිල්ලර වෙළෙඳපොළේ එදිනෙදා භාවිතයට ගන්නා අඩුම මිල ඇති සහල් වර්ගය වූ සුදු හා රතු කැකුළු මෙන් ම නාඩු මිල ද රුපි. 95 - 100 දක්වා ඉහළ යාම යි. මෙසේ අසාමාන්‍ය මිල ඉහළයාමකදී රජයට සහල් අපනයනයට ඉඩ දීම හැර වෙනත් විකල්පයක් නැහැ. අනෙක් අතට සහල් වෙළෙඳපොළට සෘජුව ම මැදිහත්වීමට අවශ්‍ය තරම් ආරක්ෂිත තොග සැබැවින් ම රජය සතු වූයේ ද නැහැ. ඒ අනුව මෙට්‍රික් ටොන් ලක්ෂ 2.5ක් ආනයනය සඳහා පෞද්ගලික අංශයට කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා දුන් බව යි කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය රිෂාඩ් බදියුදීන් පවසන්නේ. දැනටමත් ඉන් මෙට්‍රික් ටොන් 86000ක් ආනයනය කර ඇති බවත් අමාත්‍යවරයා පවසනවා.

එම සහල් ජනාධිපතිවරයාගේ උපදෙස් හා ජීවන වියදම් කමිටුවේ නිර්දේශ මත ආනයනික නාඩු කිලෝව රුපි. 72ක් ද කැකුළු සහල් කිලෝව රුපි 80ක් ද, සම්බා රුපි. 80ක් ද බැගින් අලෙවි කිරීමට උපරිම සිල්ලර මිලක් නියම කර තිබෙනවා.

වී අලෙවි මණ්ඩලය ද තමන් සතුව පැවැති ස්වාරක්ෂක තොගය වූ වී. මෙ. ටො.



2,09,000න් 50,000ක් අත තබාගෙන ඉතිරිය ලියාපදිංචි වී මෝල් හිමියන් 172 අතරේ බෙදා දී තිබෙනවා. එසේ ම ඔවුන් සතුව තබාගත් වී මෙ. ටොන් 50,000ක් ද මේ වන විට රජයෙන් වී මෝල් හරහා සහල් බවට පත්කර (සහල් මෙ. ටො. 37000ක්) පාරිභෝගිකයන්ට ලබා දීමට කටයුතු සැලසුම් කරලා. එම සහල් සතොස ශාඛා 325ක් හරහා බෙදාහැරීමට කටයුතු කරන බව යි සතොස සභාපති රොහාන්ත අතුකෝරාළ පවසන්නේ. දැනටමත් මෙ. ටො. 8,000ක් බෙදාහැර තිබෙන අතර තවත් මෙ. ටො. 7000ක් ඉදිරියේදී බෙදා හැරීමට ද කටයුතු සූදානම් කර තිබෙනවා. ඒ, දේශීය නාඩු කිලෝව රු. 80ක් ද දේශීය කැකුළු සහල් කිලෝව රුපි. 78ක් ද දේශීය සම්බා කිලෝව රුපි. 90ක් ද බැගින් වූ නව උපරිම සිල්ලර මිලක් යටතේ යි.

ඒ අනුව වෙළෙඳපොළේ මේ වන විට සහල් මෙ. ටො. ලක්ෂ 05ක් පමණ සංසරණය වන බව යි එම අමාත්‍යංශයේ ලේකම් චින්තක ලොකුහෙට්ටි පෙන්වා දෙන්නේ. ආනයනික සහල්තොග වෙළෙඳපොළට ලැබීමත් සමග අප්‍රේල් මාසය දක්වා සහල් හිඟයකට ඉඩක් නොමැති බව යි හෙක්ටර් කොබ්බෑකඩුව ආයතනයේ අලෙවි ආහාර ප්‍රතිපත්ති කෘෂි ව්‍යාපාර අංශයේ අංශ ප්‍රධානී දුමින්ද ප්‍රියදර්ශනගේ ද අදහස. එසේ ම ඉදිරියේදී තවත් සහල් මෙ. ටොන් 1,90,000ක් පමණ වෙළෙඳපොළට ලැබීමට නියමිත අතර පිටකොටුව සහල් තොග වෙළෙඳුන් නාඩු සම්බා හා කැකුළු සහල් සාධාරණ මිලට අලෙවි කරන නිසා සිල්ලර වෙළෙඳුන්ට උපරිම සිල්ලර මිලට යටත් ව සහල් අලෙවි කිරීමේ ගැටලුවක් නොමැති බව අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ආනයනය හා වෙළෙඳ සංගමයේ සභාපති නිහාල් සෙනෙවිරත්න ද පවසනවා.

එසේ වුවත් ප්‍රමිති සහතික (SGS) වලින් තොරව පාරිභෝජනයට නුසුදුසු සහල් ආනයනයට ඉඩ තිබෙන බවත් පිළිකාකාරක හා ආසනික් ඒවායේ තිබිය හැකි බවත් පාරිභෝගික අයිතීන් සුරැකීමේ සංගම් චෝදනා කරනවා. එහෙත් පාරිභෝගික අධිකාරියේ සභාපති හසිත තිලකරත්න පවසන්නේ දැනට රේගුව විසින් අනිවාර්ය තත්ත්ව සහතික 04ක් යටතේ පරීක්ෂා කිරීමෙන් පසුව ආනයනික සහල් මෙරට වෙළෙඳපොළට නිකුත් කරන බව යි. ආනයනයට පෙරදී ද අදාළ රටවල තම නියෝජිතයන් හරහා එම සහල් තොග නිරන්තර පරීක්ෂාවට ලක් කරන බව අමාත්‍යවරයා ද අවධාරණය කරනවා.

සහල්වල ප්‍රමිතිය පිළිබඳ පමණක් නොව පරිභෝජනයට නුසුදුසු සහල් විකිණීම, වැඩිමිලට විකිණීම පිළිබඳ වූ සියලු පැමිණිලි 1977 දුරකතන අංකයට දැන්විය හැකි බවත් මේ මාසය තුළදී පමණක් වැටලීම් 3000ක් පමණ සිදුකර 1200 දෙනකුට විරුද්ධ ව නීතිය මඟින් කටයුතු කර තිබෙන බවත් අමාත්‍යවරයා පවසනවා.

කෙසේ වෙතත් විවෘත වෙළෙඳපොළ අර්ථ ක්‍රමයක අතරමැදියන්ගෙන් තොරව වෙළෙඳපොළ පවත්වා ගෙන යා නොහැකි යි. එහෙත් අතරමැදි වෙළෙඳාම පාලනය කිරීමේ ක්‍රමවේදයක් රජයට ද තිබිය යුතු යි. සහල් බෙදාහැරීම කාර්යක්ෂම ව හා විධිමත් ව සිදු කිරීම සඳහා උපරිම වශයෙන් රජය මැදිහත් විය යුතු යි. එවිට අතරමැදියන්ට රිසි සේ නිෂ්පාදකයා (ගොවියා) මෙන් ම පාරිභෝගිකයා සූරා කෑමට අවස්ථාව ලැබෙන්නේ නැහැ.

මාධ්‍ය

# ඇතුවත් බැරි නැතුවත් බැරි විද්‍යුත් මාධ්‍ය රේටින්



විද්‍යා ලේඛක
නාලක ගුණවර්ධන

ශ්‍රී ලංකාවේ විද්‍යුත් මාධ්‍ය ඒකාධිකාරය 1992 වසර වන තුරු පැවතියේ රජයට යි. එය අවසන් කොට ක්‍රමයෙන් රේඩියෝ හා ටෙලිවිෂන් විකාශ ඇරඹීමට බලපත්‍ර හා සංඛ්‍යාත දීමට ඒ වසරේ තීරණය කෙරුණා. මේ අනුව පුද්ගලික සමාගම් රැසක් රැක මේ ක්ෂේත්‍රයට පිවිසියා.

අද මෙරට නොමිලයේ ඇන්ටෙනාවකින් හසු කර ගත හැකි ටෙලිවිෂන් නාලිකා 18ක් (බස්නාහිර පළාතේ) හා රට පුරා රේඩියෝ නාලිකා 50කට වැඩිය තිබෙනවා. මෙයින් අති බහුතරයක ප්‍රධාන ආදායම් ප්‍රභවය වන්නේ වෙළෙඳ දැන්වීම් හා වෙළෙඳ අනුග්‍රාහකයන්. නාලිකා ගණන ඉහළ යත්ම දැන්වීම් සඳහා ඔවුන් අතර තරගය ද උත්සන්න වුණා. කුමන නාලිකාවලට කොපමණක් තම දැන්වීම් ලබා දෙනවා ද යන්න තීරණය කිරීමට දැන්වීම් ලබා දෙන සමාගම්වලට මෙන් ම ඔවුන්ගේ දැන්වීම් ඒජන්සිවලටත් යම් නිර්ණායක අවශ්‍ය වුණා.

නාලිකා තමන් ගැන කරන පම්පෝරි විශ්වාස කරන්නට අමාරු යි. ඒ නිසා බාහිර පාර්ශ්වයක් විසින් රේඩියෝ හා ටෙලිවිෂන් රේටින් (**broadcast ratings**) හෙවත්



**රේටින් කරන සමාගම්වල අපක්ෂපාතී බව හා ක්‍රමවේදයේ නිවැරැදි බව ගැන කලක සිට ලොකු විවාදයක් තිබෙනවා. මේ ගැන චෝදනා වැඩිපුර ම නඟන්නේ රේටින්වලින් පහළ සිටින නාලිකාවල උදවිය යි. එහෙත් කල් යාමෙන් ඔවුන්ගේ රේටින් ඉහළ ගියොත් විවේචන කිරීම නවතිනවා.**

ජනප්‍රියතාව මත නාලිකා ශ්‍රේණිගත කිරීම වාණිජමය සේවාවක් ලෙස වෙළෙඳපොළ තුළින් ම මතුව ආවා. ලෝකයේ වෙනත් රටවලත් මෙය සිදු වූයේ මීට සමාන ලෙසින්.

මේ වන විට අපේ රටේ රේටින් සපයන සමාගම් දෙකක් තිබෙනවා. සර්වේ රිසර්ච් ලංකා **(SRL)** සහ ලංකා මාකට් රිසර්ච් බියුරෝ **(LMRB)** නමින්. ඔවුන් නිශ්චිත ක්‍රමවේද හරහා සිදු කරන රේටින් සාක්ෂ්‍ය මත පදනම් වී රුපියල් බිලියන ගණන් වටිනා දැන්වීම් කොන්ත්‍රාත්තු ලබා දීමේ තීරණ ගනු ලබනවා.

මේ නිසා දැවැන්ත රේටින් පොරයක් පටන් අරන්. යම් නාලිකාවක රේටින් වැඩි වූ පමණට දැන්වීම් ආදායම සරු වනවා. රේටින් වැඩි කර ගන්නට ප්‍රමිති හෝ මාධ්‍ය ආචාරධර්ම නොතකා සමහර නාලිකා ලාබාල, හරසුන් අන්තර්ගතයන් විකාශය කරන බවට චෝදනා එමට යි. නාලිකා පවසන්නේ එසේ නොකළොත් රේටින්වලින් පහළ වැටී තම ආයතන වසා දමන්නට සිදුවනු ඇති බව යි.

එසේ ම රේටින් කරන සමාගම්වල අපක්ෂපාතී බව හා ක්‍රමවේදයේ නිවැරැදි බව ගැන කලක සිට ලොකු විවාදයක් තිබෙනවා. මේ ගැන චෝදනා වැඩිපුර ම නඟන්නේ රේටින්වලින් පහළ සිටින නාලිකාවල උදවිය යි. එහෙත් කල් යාමෙන් ඔවුන්ගේ රේටින් ඉහළ ගියොත් විවේචන කිරීම නවතිනවා. මේ ක්ෂේත්‍රයේ කටයුතු වඩා විධිමත් කිරීමට හා විශ්වසනීයත්වය ඉහළ දැමීමට කුමක් කළ හැකි දැයි විමර්ශනය කිරීමට 2016 ජූලි මසදී මාධ්‍ය අමාත්‍යාංශය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ස්වාධීන විද්වතුන් සය දෙනකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කළා.

මහාචාර්ය කේ. ඒ. පී. සිද්ධිසේන, මහාචාර්ය රත්නසිරි අරංගල, ආචාර්ය මධුභාෂිනී ගලගෙදරගේ, ආචාර්ය ප්‍රදීප් වීරසිංහ, කුමාරි වෙලගෙදර සමඟ මා ද එහි සිටියා. අපේ කාර්යභාරය වූයේ අදාළ සියලු ම පාර්ශ්වයන්ට සවන් දී, තුලනාත්මකව මේ ක්ෂේත්‍රයේ ප්‍රගතියට නිර්දේශ ඉදිරිපත් කිරීම යි.

දැනට යොදා ගන්නා ගෘහස්ත නියැදිය කුඩා වැඩි බවත්, ඇති තරම් දීපව්‍යාප්ත නොවන බවත්, සුළුජන කොටස් මෙන් ම දෙමළ හා ඉංග්‍රීසි බසින් අන්තර්ගතයන් ලබා ගන්නා ග්‍රාහකයන් හරිහැටි නියෝජනය නොවන බවත් නාලිකා ප්‍රධානීන් ගණනාවක් අප හමුවේ කියා සිටියා.

රේටින් සපයන සමාගම් පවසන්නේ මීට වඩා ලොකු නියැදියක් නිතිපතා සමීක්ෂණයට ලක් කිරීම ඉතා වියදම් අධික බව යි. එමෙන් ම ඒ වැය පියවා ගන්නට තරම් විශාල ග්‍රාහක ගාස්තු රේටින් වාර්තා ලබා ගන්නා සමාගම්වලින් අය කර ගත නොහැකි බවත් ඔවුන් සඳහන් කරන කාරණයක්.

සමීක්ෂණ ක්‍රමවේදයේ දියුණු කළ හැකි තැන් තිබෙනවා. එසේ ම ආවේණික සීමා ද තිබෙනවා. කොපමණ නියැදිය විශාල කළත් රේටින් යනු ප්‍රමාණාත්මක මිනුමක් පමණ යි. නාලිකාවක හා යම් ගුවන් කාලයක සාපේක්ෂ ජනප්‍රියතාව එයින් කළ ද වැඩසටහන්වල ගුණාත්මක බව එයින් මනින්නට බැහැ. එසේ කිරීමට නම් මුළුමනින් ම වෙනස් ක්‍රමවේද අවශ්‍ය යි.

විද්‍යුත් මාධ්‍යවලට මෙරට නිසි නියාමනයක් නැති නිසා ද විෂමතා රැසක් මතුව තිබෙනවා. ඒවා රේටින් ඉක්මවා යන, සංකීර්ණ ප්‍රශ්න යි. ඒවාට වෙන ම විසඳුම් සෙවිය යුතු යි. ස්වාධීන මාධ්‍ය නියාමන කොමිසමක් පත් කිරීමේ අවශ්‍යතාව තදින් ම දැනෙනවා.

එහෙත් රේටින් සම්පාදනය කිරීමට රජය මැදිහත් නොවිය යුතු ය යන්න අපේ කමිටුවේ ඒකමතික නිගමනයක්. හේතුව රජයට අයත් නාලිකා ද දැන්වීම් සඳහා තරග කරන නිසා. ඒ නිසා පවතින ක්‍රමවේද වඩාත් පාරදෘශ්‍ය හා ශක්තිමත් කර ගනිමින් මෙය පුද්ගලික සමාගම් හරහා පමණක් මේ කාර්ය පමණක් පමණක් දිගට ම කරන අතර යම් අධීක්ෂණයක් පමණක් රජය හරහා ලබා දිය යුතු යයි අප නිර්දේශ කරනවා.

මේ සඳහා ස්වාධීන රේටින් අධීක්ෂණ මණ්ඩලයක් පිහිටුවීමටත්, එයට මාධ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය හා පුද්ගලික විද්‍යුත් මාධ්‍ය ආයතන, දැන්වීම් හා අලෙවිකරණ වෘත්තිකයන් මෙන් ම මාධ්‍ය පර්යේෂකයන් ද ඇතුළත් විය යුතු බවටත් නිර්දේශිත යි. එසේ ම තම අන්තර්ගතය ග්‍රාහකයන් කෙසේ ග්‍රහනය කර ගන්නවා ද හා ඔවුන්ගේ වෙනස් වන රුචි අරුචිකම් මොනවාද යන්න තේරුම් ගැනීමට සියලු රේඩියෝ හා ටෙලිවිෂන් ආයතන අදට වඩා ග්‍රාහක පර්යේෂණ කළ යුතු බවද අප අවධාරණය කරනවා. පරම්පරාවක් තුළ විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ සමාගම් හා නාලිකා ගණන කිහිප ගුණයකින් වැඩි වී, ගුවන් තරංග පුරවන්නට සමත් ව ඇතත් කර්මාන්තයක් ලෙස තවමත් හරිහැටි පරිණත වී නැහැ. රේටින් හරඹය හරහා ද අපට දැකිය හැක්කේ ඒ අපරිණත බව යි. මෙයට විසඳුම් සොයා ගත යුත්තේ වෙළෙඳපොළ තරගකාරිත්වයට ඉඩ දෙන අතර නිසි නියාමනය හා අධීක්ෂණයට අවශ්‍ය නීතිමය රාමුව රජය විසින් ලබා දීමෙන්.

අපේ විද්වත් කමිටු වාර්තාව 2017 මාර්තු මාසයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ම පළ කිරීමට නියමිත යි.




# ඉගිලෙන්න තහනම් නම් ඇයි දුන්නෙ අත් තටුදෙකක්

නිලුපුල් ප්‍රියංකර පෙරේරා

ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ක්ෂේත්‍රය නිරන්තරයෙන් විවාදයට කතාබහට ලක්වෙන්නක්. ඒ බව පසුගිය සමය පුරා ම වූ සිදුවීම්වලින් තහවුරු වන දෙයක්. එහි ආසන්නතම සිද්ධියක් වශයෙන් හඳුනාගත හැක්කේ මෑත කාලයේ ඩ්‍රෝන (Drone) හෙවත් නියමුවන් රහිත ගුවන් යානා භාවිතයෙන් මාධ්‍ය ආයතන සිදු කළ ඇතැම් සිද්ධි, රූගත කිරීම් හා ඡායාරූපගත කිරීම්. මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ දේහය ගොඩගැනීමේ සිද්ධියේදී සහ හම්බන්තොටදී සිදු වූ නොසන්සුන්කාරී සිද්ධියේදී මෙවැනි ඩ්‍රෝන වාර්තාකරණයන් පිළිබඳ ව කතාබහ කෙරුණා.

Drone හෙවත් මිනිසුන් රහිත ගුවන් යානා (Unmanned aerial Vehices UAVS) ලෙස හැඳින්වෙන යානා භාවිතය විශේෂයෙන් ම ලංකාව තුළ ව්‍යාප්තියට සහ වැඩි වීමට බලපාන ලද්දේ යුද්ධය අවසන් වීමෙන් පසුව ගුවන් අවකාශය ආශ්‍රිත සීමා ලිහිල් කිරීම යි. ජාත්‍යන්තර වශයෙන් විමසා බලන විට මෙය ලොව දියුණු බොහෝ රටවලට අලුත් අත්දැකීමක් නොවුණ ද ලංකාවේ අපට නවමු මාතෘකාවක් බවට යි පත්ව තිබෙන්නේ. ලෝකයේ බොහෝ රටවල කෘෂිකාර්මික කාර්යයන් සඳහා පවා මේ ඩ්‍රෝන යානා භාවිතය සිදු වෙනවා. අද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පුරවැසියන් අත පවා ඩ්‍රෝන යානා පරිහරණය සාමාන්‍ය කරුණක් බවට පත් වෙලා. මීට අමතර ව ලංකාවට පැමිණෙන සංචාරකයන් ද බහුල වශයෙන් ඩ්‍රෝන යානා පරිහරණය කරනු ලබනවා. තවත් විශේෂ ප්‍රවණතාවක් වන්නේ ස්වාභාවික ආපදා ආවරණය, මහජන රැලි, විවාහ උත්සව ආදී ප්‍රිය සම්භාෂණ යනාදිය ඡායාරූපගත කිරීමට ද මේ ක්‍රමවේදය යොදා ගැනීම යි.

නූතන දියුණු තාක්ෂණ ක්‍රමවේදවලට අනුගත ව මාධ්‍ය වාර්තාකරණය සිදු වීම ඉතා වැදගත් වූ කරුණක්. එහිදී ඩ්‍රෝන යානා භාවිතය පිළිබඳ ව ජනමාධ්‍ය අමාත්‍යංශයේ ද පවතින්නේ එකඟතාවක්. විශේෂයෙන් ම ප්‍රවෘත්ති රැස් කිරීමේ වෘත්තීය කාර්යයේදීත් ඊට අදාළ සිදු වීම සහ ස්ථානයන් අදාළ ක්‍රියාවලිය ආවරණය කිරීමටත් මාධ්‍යවේදීන් විසින් ඩ්‍රෝන යානා යොදාගැනීම පිළිබඳ මාධ්‍ය අමාත්‍යංශය සහාය පළ කරනවා.

එසේ වුවත් මාධ්‍ය වාර්තාකරණ ක්‍රියාවලියේදී මාධ්‍යවේදීන් විසින් ඩ්‍රෝන යානා භාවිත කිරීම සිදු කළ යුතු වන්නේ ද රට තුළ පවත්නා සාමාන්‍ය නීති පද්ධතියට අනුගතව යි. එහිදී මිනිස් අයිතිවාසිකම්, සුරක්ෂිතභාවය, මාධ්‍ය ආචාරධර්ම, පෞද්ගලිකත්වය යනාදී කාරණා බැහැර කරමින් මේ කාර්යයේ යෙදීමට කිසිවකුට හෝ අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

ශ්‍රී ලංකාව තුළ ගුවන් අවකාශය භාවිත කිරීම සම්බන්ධයෙන් පූර්ණ අධිකාරී බලය සහිත ආයතනය වන්නේ සිවිල් ගුවන් සේවා අධිකාරිය යි. මෙරට ජනමාධ්‍ය ක්‍රියාවලියට අදාළ ව ඩ්‍රෝන යානා භාවිතය සම්බන්ධයෙන් CA - IS - 2016 - GEN - 001 අංකය යටතේ සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා සහ නීති රෙගුලාසි පිළිබඳ ව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් උපමාන ඉදිරිපත් කර තිබෙනවා.

විශේෂයෙන් ම මාධ්‍ය වාර්තාකරණය සඳහා ඩ්‍රෝන යානාවක් ඉහළට යැවීමේදී එය පහළ සිට ක්‍රියාත්මක කරවන නියමුවාගේ දෘෂ්ටි සීමාව තුළ තබා ගැනීමේ වැදගත්කම පිළිබඳවත් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විශේෂයෙන් අවධාරණය කරනවා.

කෙසේ වෙතත් නූතන දියුණු තාක්ෂණයට අනුගත ව මාධ්‍ය ක්‍රියාකාරීත්වය සිදු වීම වැදගත් වුව ද මාධ්‍ය නිදහස, සමාජ වගකීම, මූලික මිනිස් අයිතිවාසිකම් සහ පෞද්ගලිකත්වය, සුරක්ෂිත බව යනාදී කරුණු කෙරෙහි ප්‍රමුඛතාව ලබා දෙමින් තාක්ෂණය භාවිත කිරීම යි වැදගත් වන්නේ.

# ඩ්‍රෝන යානා භාවිතය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රධාන කරුණු

* සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් නිශ්චිත අනුමැතියක් ලබාගෙන නැත්නම් කි. ග්‍රෑ. 25ට වැඩි දළ ස්කන්ධයකින් යුතු, නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා නො කරවිය යුතු ය.

* අනුමැතිය ලද පුද්ගලයකුට හෝ අනුමැතිය ලද සංවිධානයකට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවසරය යටතේ කි. ග්‍රෑ. 1 සිට කි. ග්‍රෑ. 25 අතර දළ ස්කන්ධයකින් යුතු, නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා කරවිය හැකි ය.

* ක්‍රියාත්මක කෙරෙන්නේ පුද්ගලයන්ගේ හා දේපළවල සුරක්ෂිතතාව සම්බන්ධයෙන් නිසි සැලකිල්ල දක්වමින් දේපළ හිමියාගේ එකඟතාව ඇතිව පෞද්ගලික පරිශ්‍රයක විනෝදය හෝ අධ්‍යාපනය ආශ්‍රිත අභිමතාර්ථයන් උදෙසා හෝ අදාළ අභිමතාර්ථය උදෙසා පැහැදිලි ලෙස හඳුනාගත් ප්‍රසිද්ධ ස්ථානයකදී නම් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව කි. ග්‍රෑ. 1ට අඩු දළ ස්කන්ධයකින් යුතු නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා කරවිය හැකි ය.

* නියමුවන් රහිත ගුවන් යානයක් මත හඳුනා ගැනීමේ මුද්‍රාවක් පැවතිය යුතු අතර එය එහි අනන්‍යතා අංකය, හිමිකරුවාගේ ජාතික හැඳුනුම්පත් අංකය හා ඔහුගේ / ඇයගේ ඇමතුම් තොරතුරු දැක්විය යුතු ය.

* ඒ ඒ ගුවන් ගමනට අදාළ ගාස්තුව ගෙවා සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලිඛිත ව විශේෂ අනුමැතියක් ලබා ගෙන නැත්නම් කිනම් බර කාණ්ඩයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් වුව ද කුලියක් හෝ වෙනත් දීමනාවක් පතා ක්‍රියා නො කරවිය යුතු ය.

* පුද්ගලයන් හෝ දේපළ අනතුරේ නොහෙළන සුරක්ෂිත මෙහෙයුමක් බව සහතික කරමින් පියාසර කිරීමට පෙර සාමාන්‍ය මෙහෙයුම් උදෙසා පැදවීමේ විධික්‍රමය, බලශක්ති මූලාශ්‍රය හා පාලන ක්‍රම පරීක්ෂා කොට නිරවද්‍යතාව සහතික නොකරන්නේ නම් කිනම් බර කාණ්ඩයකට අයත් නියමුවන් රහිත ගුවන් යානයක් වුව ක්‍රියා නො කරවිය යුතු ය.

* පහත සඳහන් ආකාරයේ පුද්ගලයකු නම් ඔහු හෝ ඇය නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා නො කරවිය යුතු ය.

1. ගුවන් යානයේ සුරක්ෂිත මෙහෙයුම් හා උපක්‍රම පිළිබඳ ව හුරුවක් නැති;
2. යහපත් කායික හා මානසික සෞඛ්‍ය තත්ත්වයක පසු නොවන සහ,
3. මද්‍යසාර හෝ මානසික බලපෑමක් ඇති කරන මත්ද්‍රව්‍යයක බලපෑමට ලක්ව සිටින; සහ,
4. සමාජ වගකීම පිළිබඳ නිවැරදි අවබෝධයක් නැති

* සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අනුමැතිය ලබා දී නැත්නම් ගුවන් තොටුපොළක සීමාවේ සිට සැතපුම් 5ක් ඇතුළත සහ බිම් මට්ටමේ සිට අඩි 400කට වැඩි උසකින් නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා නො කරවිය යුතු ය.

* ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිත ව අවසර ලබා දී නැත්නම් ශ්‍රී ලංකාවේ කිසිදු ප්‍රදේශයක නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා නො කරවිය යුතු ය; එනම්,

a. අනුමැතියකින් තොර ව සක්‍රිය ගුවන් තොටුපළක කවර හෝ සංචලන ප්‍රදේශයකට ඉහළින්; හෝ කවර හෝ සක්‍රිය ධාවන තීරුවකට ඉහළින්; හෝ
b. පුද්ගල පර්ෂදයකට හෝ ප්‍රසිද්ධ රැස්වීමකට ඉහළින්; හෝ
c. ජනාකීර්ණ ප්‍රදේශවලට ඉහළින්; හෝ
d. මාර්ගයක මං තීරු හෝ දුම්රිය පාරක් ඔස්සේ හෝ ඒවාට ඉහළින්; හෝ
e. විවෘත විදුලි කම්බිවලට පහළින් හෝ ඉහළින්; හෝ
f. සන්නිවේදන කුලුනුවලට සමීපාසන්න ප්‍රදේශය තුළ ;
g. ජාතික උද්‍යාන, ආරක්ෂිත ප්‍රදේශ හෝ ආරක්ෂක සංස්ථාපිතයන් තුළ

* නියමුවන් රහිත ගුවන් යානයක් පහත සඳහන් ආකාරයෙන් ක්‍රියා නො කරවිය යුතු ය.

a. එම දේපළේ පදිංචි පුද්ගලයන්ගෙන් හෝ දේපළ හිමියාගෙන් නිශ්චිත පූර්ව අවසරයක් ලබා ගෙන නැත්නම් කවර හෝ දේපළකට ඉහළින්; සහ
b. තුන් වැනි පුද්ගලයකුට හෝ දේපළකට සුරක්ෂිතතා හෝ ආරක්ෂක අවදානමක් ඇති කරමින්

* සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියකින් තොරව, පියාසර කරමින් තිබෙන නියමුවන් රහිත ගුවන් යානයකින් කිසිවක් පහතට හෙළීම හෝ එවැනි යානයක කවර හෝ බැනරයක් ප්‍රදර්ශනය කිරීම හෝ නොකළ යුතු ය.

* නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා කරවන පුද්ගලයකු හැම විට ම,
a. ගුවන් යානය සමඟ දෘෂ්ටි රේඛාව පවත්වා ගත යුතු ය; සහ
b. ගුවන් යානය ක්‍රියා කරවනු ලබන ගුවන් අවකාශයේ හාත්පස දැක ගත හැකි විය යුතු ය; සහ
c. ගුවන් යානය වලාකුළු පත්ලට පහළින් පවත්වා ගත යුතු ය.

* සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් විශේෂ අනුමැතියක් ලබා නො ගෙන නියමුවන් රහිත ගුවන් යානයක් කවරාකාර හෝ ධාවන තරගයක් හෝ තරගයක් තුළ ක්‍රියා නො කරවිය යුතු ය.

* හෝම්මන් වේලාවේ සිට හිමිදිරිය දක්වා කාලය තුළ (රාත්‍රී කාලයේදී) නියමුවන් රහිත ගුවන් යානයක් ක්‍රියා නො කරවිය යුතු ය.

# හතුරු - මිතුරු වෙසින් එන අභියෝග



මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර

**අමරිකානු** ජාතික කවියකු වූ ජෝන් අප්ඩයික් (John updike) අපූරු කවියක් ලියුවේ ය. ඉන් කියැවුණේ අභියෝග (Challanges) ගැන ය. එහි මෙසේ සඳහන් වේ.

"මට නොදන්වා
මවෙත පැමිණෙන,
හතුරෙක් ද මිතුරෙක් ද
අභියෝග ?
ඔහුගේ ස්වභාවය මා හැඳින ගන්නේ
මුහුණට මුහුණලා
ඔහු පිළිගැනීමෙනි.
එවිට මට පෙනී යයි
හතුරු වෙසින් මා වෙත ආවේ
මිතුරකු නොවන්නේ ද ?
මිතුරු වෙසින් මා වෙත ආවේ
හතුරකු නොවන්නේ ද"

නිර්මාණශීලී ලේඛනය (Creative writing) යන මැයෙන් නිව්යෝර්ක් විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් ඇමතූ අප්ඩයික් කවියා කියා සිටියේ "අභියෝග" නොමැති ජීවිතය ගත කරන කෙනකු තුළ නිමැවුම් ලොවක් (Creative warld) නොමැවෙන බව ය. ඔහු ලේඛනයෙන් ඔබ්බට ද සිසුන්ගේ පරිකල්පනය මෙහෙයවීය. ඔහු විද්‍යාඥයන්ගේ විවිධ විද්‍යා සංකල්ප බිහි කිරීමට හේතු කාරක වූ "සමාජ අභියෝග" සමුදායක් ගෙන හැර දැක්විය. "හැම මොහොතක ම විද්‍යාඥයා පසුවන්නේ තමන් හමුවේ පවතින අභියෝගයේ ස්වරූපය හදාරමිනි" යි ඔහු ප්‍රකාශ කළේ ය.

රසායනාගාරයේ කල්ගත කරන විද්‍යාඥයා හුදෙකලා වූවකු ලෙස නොසැලකිය යුතු ය. ඔහු හමුවේ පවතින්නේ සමාජ විඥානය (Social Conscience) මෙහෙයවන බලවේග සමුදායකි. ඔහු විද්‍යාඥයකු ලෙස පෙනී සිටියත් පොදුවේ ගත් කල සමාජ චින්තනය මෙහෙයවන නිමැවුම්කරුවකු වශයෙන් සැලකිය යුතු ය. ඔහුගේ අභියෝගය වන්නේ "මෙසේ කළහොත් මෙසේ සිදු

**මට මගේ හිත නිදහස් කර ගැනුමට නම් මා හමුවේ පවතින අභියෝග සමුදාය කෙසේ හෝ ජය ගත යුතුය**

**- ඒබ්‍රහම් ලින්කන් -**

වේ" (If this is done this will happen) යන නියාම ධර්මයකි. මෙලෙසින් ම වෙනත් සමාජ චින්තකයන් ද ගත හැකි ය. මිනිසා චින්තකයකු වන්නේ ඔහුගේ හෝ ඇයගේ හිත නිදහස් කර ගැනීමට ය. හිතක් නිදහස් වන්නේ අභියෝගවලට මුහුණ දීමෙනි.

"මට මගේ හිත නිදහස් කර ගැනුමට නම් මා හමුවේ පවතින අභියෝග සමුදාය කෙසේ හෝ ජය ගත යුතුය" යි වතාවක් ඒබ්‍රහම් ලින්කන් තම සගයන්ට පැවසීය. ලින්කන් හමුවේ තිබුණේ හුදු සාමාන්‍ය දේශපාලන ගැටලු (Political Problems) නොවේ. වර්ගවාදය, ජාතිවාදය, පරමාධිපත්‍යය කෙමෙන් ඉහළට නැගෙන පවුරක් සේ ඔහුට පෙනෙන්නට පටන් ගත්තේ ය. ඔහු නිතර ම මිනිනුවේ යැයි සැලකෙන්නේ තමන් තුවා කළ උගත් කියමනකි. "මා වට කොට මා හිර කොට තබන්නට එන මේ විශාල ප්‍රාකාරය මා හිරකර තැබීමට ඉඩ නොදිය යුතු ය. මම ජය ගනිමි."

යම් කිසි අභියෝගයක ස්වභාවය (Nature) වටහා ගත හැකි නම් ඒ අභියෝගය ජය ගත හැකි ය යන චින්තනය කෙමෙන් පැතිරෙන්නට විය. "අභියෝග" යනු පළවා හැරිම වෙනුවට මුහුණ දිය යුතු බලවේග ලෙස සැලකිණ. "තමන් හමුවේ පවතින ස්වභාවය වටහා නොගන්නා පුද්ගලයකුට එම ස්වභාවය පවතින බලවේගයන් ද වටහා ගත නොහැකි ය" යනුවෙන් මහා චින්තක බර්ට්‍රන්ට් රසල් (Bertrand Russell) ප්‍රකාශ කර ඇතත් ඔහු ලියූ "නිසරු දැනුම" (Useless knowledge nation) නමැති ලේඛනයේ ය. රසල්ගේ වෑයම වූයේ "මිනිසා නිසරු දැනුමෙන් යුත් කෙනකු වන්නේ ඔහු හිත නිදහස් නොකරනතාක් කල් ය." නිදහස් චින්තකයා (Free thinker) යන නාම පදය බහුල ව භාවිතයට ගත්තේ රසල්ගෙන් පසු ව බිහි වූ ක්‍රිස්තියානි චින්තකයන් ය. ඔවුන් හැම කෙනකුගේ ම මූලික තේමාව වූයේ තමන් හමුවේ පවතින ගැටලු දෙස "නිදහස්මතිකව" හිතන්නට පුරුදු වීමෙන් මිනිස් ජීවිත වඩාත් නිසරු බවින් මුදා ගත හැකි බව ය. මේ තත්ත්වය මතුපිටින් පෙන්නුම් කරන්නේ "හිත නිදහස් කර ගැනීමක්" ලෙසින් වුව ද සැබැවින් නම් අභියෝග ජය ගැනීමකි. මේ හේතුවෙන් නිදහස් චින්තනය යනු හුදු ලාමක චින්තනයක් නොව, සමස්ත සමාජයක් ම ගලවා ගත හැකි බලවේගයක් ලෙස සැලසුම් විය යුතු ය. ප්‍රාචීනවාදී සමාජ බලවේග මෙහෙයවීමට බුදුරජාණන් වහන්සේ වදාළ දසරාජ ධර්මය ඵලදායක න්‍යාය සපයන බව උගත්හු පවසති. ඥානවන්ත පාලකයා (Knowledgeble Ruler) යනු ප්‍රාචීනවාදී නාමයකි. ඥානවන්ත යනු කල්පනාවෙන් සමාජ චින්තනය මෙහෙයවීමක් ලෙස භාරතීය උගතකු වන සර්වපල්ලි රාධක්‍රිෂ්ණා පඬිතුමා සැලකීය. ඒ සම්බන්ධයෙන් ඔහු Man : In Political Perspective (මිනිසා : දේශපාලන පර්යාලෝකය) යනුවෙන් දිගු ලේඛනයක් සම්පාදනය කළේ ය. ඇනුම් බැනුම්, ඉවසිය හැකි, සමාව දෙන, නිවැරදි ආකල්ප ඇති උතුම් මිනිසා නිරන්තර ව ම තම සිත නිදහස් ලෙසින් අභියෝග ජය ගන්නා කෙනකු ලෙස මෙහිලා සැලකේ.

# මේ තරම් සියුමැලිද කළුගල්



**කථිකාචාර්ය එම්. එම්. දයානන්ද**
දෘශ්‍ය කලා පීඨය - සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

■ සංජීව පෙත්තාවඩු

ආගමික සන්දර්භයක් තුළ හෝ ලෞකික සන්දර්භයක් තුළ හෝ නිර්මාණය වුණත් අතීතයේ සිදු කළ මහා කළුගල් නිර්මාණ අදටත් රස විඳීමේ හැකියාවෙන් අනූන යි. සමාධි පිළිමය, අවුකන බුද්ධ ප්‍රතිමාව, ඉසුරුමුණි පෙම්යුවල ආදී වශයෙන් ඒවා ලොව පුරා ම නම් දරා තිබෙනවා. ඇතැම් ඒවා ලෝක පූජනීයත් බවට ද පත් වෙලා. එහෙත් කනගාටුවට කරුණ වන්නේ ඒවා අතීතයට ම පමණක් සීමා වී තිබීම. අද කළුගල් නිර්මාණ බිහි වන්නේ ඉතාමත් අල්ප වශයෙන්. දෙස් විදෙස් සංචාරකයන්ට රසවිඳින්නට අතීත කලාව මෙන් ම නවමු කලා කෘති ද බිහි විය යුතු යි. එය රටේ සංචාරක කර්මාන්තය නගා සිටුවීමට ද ඉතාමත් වැදගත්.

ශ්‍රී ලංකාවේ කළුගල් මූර්ති කලාව සඳහා වැඩි ප්‍රසිද්ධියක් උසුලන්නේ ඉන්දියාවෙන් ගෙන්වන ලද නිර්මාණ ශිල්පීන්. ඊට අමතර ව වෙනත් විදේශීය ශිල්පීන් ද වනවා. විශාල ප්‍රමාණයේ කළුගල් නිර්මාණ ශ්‍රී ලාංකික ශිල්පීන්ට කිරීමට නොහැකි විශ්වකර්ම වැඩක් ලෙසට මතයක් පැවතීම සහ කලා කර්මාන්තයක් ලෙස ක්‍රියාත්මක නොවීම ඊට හේතු. කෙසේ වෙතත් දැවැන්ත කළුගල් මූර්ති නෙළීමේ ශිල්පය ලබා දීමට වර්තමාන ශාස්ත්‍රාලයීය අධ්‍යාපනය හැඩගැසී තිබීම හොඳ දෙයක් බව යි කලුගල් මූර්ති ශිල්පී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ කථිකාචාර්ය එම්. එම්. දයානන්ද පවසන්නේ.

ඔහු: ''වර්තමානය වන විට අපේ රටේ නිර්මාණාත්මක කලාකරුවන් බිහි කිරීමට ශාස්ත්‍රාලයීය අධ්‍යාපනයක් ගොඩනැගී තිබෙනවා. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයත් බටලීයේ පිහිටි පුරාවිද්‍යා අනුරූ නිෂ්පාදනායතනයත් ඒ සඳහා දැකිවිය හැකි හොඳ ම නිදසුන් දෙක යි. ඒවායින් කළුගල් නෙළීමේ කලාව ප්‍රගුණ කරන ශිල්පීන්ගේ සංඛ්‍යාව ඉතා විශාල යි. එහෙත් මොවුන් අපේ රටේ ම රැඳෙනවාද යන්න ප්‍රශ්නයක්. විය යුත්තේ ඔවුන් රැක ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම යි. අනෙක් ගැටලුව නම්, දැනුම ලංකාව තුළ තිබුණත් එය ප්‍රායෝගික ව සිදු කිරීමේ ඉඩප්‍රස්ථාව ලාංකික ශිල්පීන්ට හිමිනොවීම. එයට හේතුව වන්නේ විශාල මුදලක් මෙවැනි නිර්මාණ සඳහා වැය කිරීමට සිදු වීමත්, පෙර පුහුණුව සහ අත්දැකීම ඒ සඳහා ප්‍රධාන වන නිසාත්. යම් වැරදීමක් වුවහොත් එය නිවැරැදි කිරීමට ඇති හැකියාව ඇත්තේ ද ඉතා අඩු ප්‍රතිශතයක. මේ සියල්ලට ම පිළිතුරක් ලෙස යි, මා විසින් නිර්මාණය කළ 'ඉන්ඩිපෙන්ඩන්ට්' ආකේඩ් පරිශ්‍රයේ ඉදි වූ සිංහ පවුල නිර්මාණය වුණේ. 'නිදහස' තේමා කරගනිමින්, දින සියයක් වැනි කෙටි



කාලයක් ඇතුළත මේ නිර්මාණය අවසන් කළ අතර ඒ සඳහා මා ඇතුළු ගෝල පිරිස විවිධ ශිල්පීය ක්‍රම භාවිත කළා. මා විශ්වාස කරන්නේ මේ නිර්මාණය රස විඳීම සඳහා සුදුසු පරිසරයක් ඊට ම හිමි වූ බව.''

සිනමා කර්මාන්තය, වෙළෙඳ දැන්වීම්කරණය, මෙන් ම මංගල ජායාරූපකරණය වැනි වෘත්තීයමය කටයුතු හරහා දැවැන්ත කළුගල් මූර්තියක් ලෙස නිර්මාණය වී ඇති සිංහ මූර්තිය රජයට එක් කරන්නේ අමතර ආදායමක්. දෙස් විදෙස්

**සිනමා කර්මාන්තය, වෙළෙඳ දැන්වීම්කරණය, මෙන් ම මංගල ජායාරූපකරණය වැනි වෘත්තීයමය කටයුතු හරහා දැවැන්ත කළුගල් මූර්තියක් ලෙස නිර්මාණය වී ඇති සිංහ මූර්තිය රජයට එක් කරන්නේ අමතර ආදායමක්. දෙස් විදෙස් සංචාරකයන්ගේ ජායාරූප සඳහා මෙය පසුබිමක් ද වනවා.**

සංචාරකයන්ගේ ජායාරූප සඳහා මෙය පසුබිමක් ද වනවා. කොළඹට යන එන බොහෝ දෙනකුට සිංහ මූර්තිය තමන්ගේ සෙල්ෆි ජායාරූපය සරසන ආභරණයක් බවට පත් වෙලා. සියල්ලට ම වඩා වටිනා කාරණය වන්නේ එය කොයි කාගේත් රස වින්දනයට ඉවහල් වීම යි. රස වින්දනය යනු රටක අවශ්‍යතාවක්.

පාෂාණ මූර්ති කලාව ශිල්පීන් රැසකගේ එකතුවක්. සිංහ මූර්තිය සඳහා ද එය එසේ ම වුණා. ප්‍රධාන ශිල්පියාගේ සිට කළුගල් කැඩීමට ගන්නා උපකරණය නිර්මාණය කරන්නා දක්වා එය විහිදෙනවා. එහෙත් අවසාන වශයෙන් මෙය නරඹන්නාට දැක ගන්නට හැකි වන්නේ අවසන් කළ කෘතියක් ලෙසින් පමණ යි. එය ස්වාභාවික දෙයක්. අතීතයේදී පවා අති දැවැන්ත නිර්මාණ තුළ එහි අයිතිකරු ලෙස ඉස්මතු වී පෙනුණේ රජකුගේ හෝ නායකයකුගේ නමක් පමණ යි. සීගිරි බිතුසිතුවම් මෙන් ම අවුකන බුද්ධ ප්‍රතිමාවේ ද මහා නිර්මාණකරුවන් කවුරුන් ද යන්න අදටත් අවිනිශ්චිත යි. එහෙත් එහි කාල පරාසය අනුව හෝ හමුවන පුරාවිද්‍යා සාක්ෂි මත එවකට සිටි රාජ්‍ය නායකයාට එහි ගෞරවය හිමි වනවා. මේ කාරණය අදටත් වෙනසක් නැහැ.

නැවතත් ඔහු: ''අතීතයේ සිට ම පාෂාණ මූර්ති කලාව ශ්‍රී ලංකාවේ තිබුණත් සිංහලයේ අවසන් රජුගෙන් පසු මේ කලාව ක්‍රමයෙන් වියැකී ගිය බව යි මා විශ්වාස කරන්නේ. එවකට සිටි නිර්මාණ ශිල්පීන් ව උගතුන් විසින් පවා හැඳින්වූයේ 'ගල් වඩුවන්' ලෙසින්. එසේ ඔවුන් හැඳින්වීමෙන් ලාංකික කළුගල් මූර්ති කලාව ආගමික සන්දර්භයක් මත පදනම් වී තිබීමත් ඒ හැඳින්වීම ම අපේ රටේ කළුගල් මූර්ති ශිල්පීන් නොමැති වීමට හේතුවක් වූ බවත් මගේ හැඟීම යි. හොඳින් අධ්‍යයනය කර බැලුවිට



පෙනෙන්නේ යුරෝපය, ඉන්දියාව, ග්‍රීසිය හෝ රෝමය මෙවැනි කලාවන් යථාර්ථවාදී පදනමක් මත සිදු කර ඇති බව. ඒ නිසයි මෙවැනි නිර්මාණ කිරීමට විදේශීය ශිල්පීන්ට පමණක් හැකි බව බෝහෝ දෙනෙක් විශ්වාස කරන්නේ. එය අප විසින් ම අපේ හැකියාවන් අවතක්සේරු කිරීමක්. එයට හේතු වූයේ ලාංකික ශාස්ත්‍රාලයීය අධ්‍යාපන රටාවට මෙවැනි දැවැන්ත කලාවක් ඇතුළත් වී නොතිබීම යි. ඉන්දියාව වැනි රටවල් අතීතයේ සිට ම පරම්පරාගත ව නෙළීමේ කලාව ප්‍රගුණ කළා. අපේ රටේ කළුගල් නිර්මාණ කලාව අවසාන වශයෙන් ඉතිරි වුණේ කර්මාන්තයක් ලෙස විතර යි. ඒ, සොහොන් ගල්වලට හා මිරිස්ගල්වලට සීමා වෙමින්. එහෙත් නිර්මාණාත්මක හැකියාව ඇති අය ලංකාවේ නොවුණා නොවෙයි. එයට නිසි වටිනාකමයි හිමි නොවුණේ.''

විවිධ රටවල් ගත් විට මේ හා සමාන අති දැවැන්ත නිර්මාණ බොහොමයක් තිබෙනවා. (උදාහරණ ලෙස, ඉන්දියාවේ ටජ්මහල්, අමෙරිකාවේ ලිබර්ටි වැනි) ඒවා අතීතයෙන් ම නිර්මාණශීලී වන අතර ආගමික සන්දර්භයක් තිබුණත් නැතත් රස වින්දනයෙන් නම් අනූන යි. එහෙත් ලංකාවේ ඒ තත්ත්වය අල්ප යි. රස විඳිය හැකි නිර්මාණ වුණත් ස්ථානගත කර ඇත්තේ රස විඳිය නොහැකි කලබලකාරී වටපිටාවක වීම කනගාටුදායක කරුණක්.

අවසන් වශයෙන් කරුණු දක් වූ කථිකාචාර්ය එම්. එම්. දයානන්ද: ''කොළඹ නගරය තුළ පවා බොහොමයක් දක්නට ඇත්තේ රාජ්‍ය නායකයකුගේ හෝ වීරයකුගේ හෝ පිළිමයක්, එසේත් නැතිනම් ආගමික සන්දර්භයක් පදනම් කර ගත් පිළිමයක් විතරයි. නිදසුනක් ලෙස, විහාරමහාදේවි උද්‍යානයේ බුදු පිළිමය දක්වන්න පුළුවන්. උද්‍යානයකට බුදු පිළිමයක් තිබීමේ වැදගත්කම කුමක් ද? එවැනි ස්මාරකත් තිබිය යුතු යි. එහෙත් කලා රස වින්දනයක් ඇති කිරීම සඳහා එය පමණක් ප්‍රමාණවත් ද? යන ගැටලුව මට නිරන්තරයෙන් ම මතු වනවා. දැවැන්ත නිර්මාණ කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබිය යුතු යි. කොළඹ නගරය කියන්නේ ජාත්‍යන්තර තලයට ගෙන යා හැකි නගරයක්. බටහිර ජාතිකයන් කොළඹ නගරය නිර්මාණය කළත්, ශ්‍රී ලාංකික අනන්‍යතාවක් සහිත වින්දනයක් ලැබිය හැකි පරිසරයක් තිබිය යුතු යි. කලා නිර්මාණකරුවන්ගේ දායකත්වය නගර සැලසුම් අතරට එකතු කිරීමට දැන් කාලය පැමිණ තිබෙන බව යි මට දැනෙන්නේ. එහෙත් අදහා ගන්නට බැරි කාරණය වන්නේ මේවා අනවශ්‍ය වියදම් ලෙස ඇතැමුන් හුවා දැක්වීම යි.''

# රන්ගිරි දඹුලු ලෙනේ උරුමය අහිමි වෙයි ද?



**පී. පී. මාලා මල්කාන්ති**

**ඓතිහාසික** බව, පෞරාණික බව රටක සංස්කෘතික වටිනාකම් ඉහළ නංවන අතර ම එය රැක ගැනීම ජාතික වගකීමක් හා යුතුකමක්. එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) විසින් 1972 වසරේ සම්මත කර ගත් ලෝක සංස්කෘතික හා ස්වාභාවික උරුමය සුරැකීමේ සම්මුතිය මඟින් ශ්‍රී ලංකාවේ ලෝක උරුම නම් කිරීම සැලැකිය හැක්කේ මේ සඳහා ගනු ලැබූ සාධනීය පියවරක් ලෙස. පොළොන්නරුව (1982), සීගිරිය (1982), මහනුවර (1988), අනුරාධපුරය (1982), ගාලු නගරය (1988), රන්ගිරි දඹුලු විහාරය (1991), සිංහරාජ වනාන්තරය (1988) හා මධ්‍යම උස්බිම් (2010) ඊට අයත්.

නොබෝදා ලෝක උරුම සුරැකීම පිළිබඳ නැවත කතාබහක් ඇති වන්නේ එම ලෝක උරුම අට අතරින් රන්ගිරි දඹුලු විහාරය ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කිරීමේ අවදානමක් උද්ගත වීම හේතුවෙන්. ඒ, ශ්‍රී ලංකාවේ ඓතිහාසික ස්ථාන නැරඹීමට පැමිණි යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල් ඉරිනා බොකෝවා විසින් රන්ගිරි දඹුලු විහාරයේ නව ඉදි කිරීම් නිසා එහි ඓතිහාසික බවට හා පෞරාණිකත්වයට හානි සිදු ව ඇති බැවින් තවදුරටත් එය ලෝක උරුමයක් ලෙස නම් කිරීම අපහසු බවට ප්‍රකාශ කරනු ලැබීමත් සමඟ. ලෝක උරුම ප්‍රකාශයට පත් කිරීමේ නිර්දේශ ඉදිරිපත් කරන ඉක්‍රොම් (ICCROM) ආයතනයේ නිර්ණායක ඉක්මවා යැමක් එහිදී සිදු වී ඇති බව යි යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරිය එවැනි ප්‍රකාශයක් මඟින් අවධාරණය කරන්නේ.

කෙසේ වෙතත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක පෙන්වා දෙන්නේ රන්ගිරි දඹුලු විහාරය ආශ්‍රිත ව පැන නැඟී ඇති වර්තමාන තත්ත්වය පැහැදිලි කර දීමත් සමඟ ඇය එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගත් බව. ආචාර්ය සෙනරත් දිසානායක: "මීට වසර දෙකකට පෙර දෝහා කටාර්වල පැවැති ලෝක උරුම පිළිබඳ කමිටුවේදීත් අප යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරියට පැහැදිලි කළා බිතු සිතුවම් සහිත රන්ගිරි දඹුලු ලෙන සහ මෑතක ඉදි කරන ලද විශාල බුදු පිළිමය අතර යාර 100ක පමණ කලාපයක් තිබෙන නිසා පිළිමය ඉදි කිරීමෙන් දඹුලු ලෙනට විශාල බලපෑමක් සිදු වන්නේ නැති බව. වන්දනාමාන කිරීමට පැමිණෙන බැතිමතුන්ට රිසි ලෙස දඹුලු ලෙන තුළ වැඳ පුදා ගැනීමට අපහසු නිසා ඒ සඳහා අවස්ථාව ලබා දීමට මෙවැනි නව ඉදි කිරීම් සිදු කළ බවත් අප ඇයට පෙන්වා දුන්නා. ඇය ඒ කාරණය පිළිගත්තා. ඒ වගේ ම එතුමිය ලංකාවට දූත පිරිසක් එව්වා මේ පිළිබඳ සොයා බැලීමට. ඔවුන්ගේ ප්‍රතිචාරත් තිබුණේ යහපත් මට්ටමක. එසේ තිබියදීයි ඇය නැවතත් ශ්‍රී ලංකාවට පැමිණි පසු මෙවැනි ප්‍රකාශයක් සිදු කළේ."

රන්ගිරි දඹුලු විහාරය ආශ්‍රිත ව මෙවැනි අවදානම් තත්ත්වයක් ඇති බවට අනතුරු ඇඟවා ඇත්තේ මීට වසර කිහිපයකට පෙර සිට බව යි අනාවරණය වන්නේ. මධ්‍යම සංස්කෘතික අරමුදලේ අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සඳහන් කරන පරිදි යුනෙස්කෝ සංවිධානය විසින් 2010 වසරේදී ඒ බව පෙන්වා දී තිබෙනවා. එහි බිතු සිතුවම් අවපැහැ ගැන්වීම, බදාම ගැලවී තිබීම මෙන් ම සංරක්ෂණ කටයුතු ප්‍රමාණවත් නොවීමත් එහි අලුතින් ඉදි කිරීම් කටයුතු සිදු වීමත් එහිදී අවධානයට ලක් වූ කරුණු. ඒ අනුව එයට ප්‍රතිචාර දැක්වීමක් ලෙස මධ්‍යම සංස්කෘතික අරමුදල, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ජාතික භෞතික විද්‍යාත්මක ආයතනය හා ඒ සඳහා දායක වන අනෙකුත් ආයතන එක් වී රන්ගිරි දඹුලු විහාරය ආශ්‍රිත ගැටලු හඳුනා ගනිමින් කළමනාකරණ සැලැස්මක් සහිත විද්‍යාත්මක වාර්තාවක් සකස් කළ බවත් මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන සඳහන් කළ කරුණක්. ඔහු: "අප සකස් කළ කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ලැබුණේ නැහැ පැන නැඟුණු නොඑකඟතා මත. එහෙත් 2013 වසරේ යුනෙස්කෝ සංවිධානයෙන් පැමිණ මේ පිළිබඳ ලබා දුන් අධ්‍යයන වාර්තාවේ ද සඳහන් වුණේ රජයේ අවධානය රන්ගිරි දඹුලු විහාරයේ සංරක්ෂණ කටයුතු සඳහා



යොමු විය යුතු බව. රන්ගිරි දඹුලු විහාරයේ නායක ස්වාමීන් වහන්සේගේ මතය වන්නේ මෙය ලෝක උරුමයක් නොව ලාංකික උරුමයක් වන අතර වත්මන් අවශ්‍යතාව මත එය වෙනස් කිරීමේ හැකියාව පවතින බව. ඒ, රන්ගිරි දඹුලු විහාරයට අයත් භූමියක් ලෙස"

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සෙනරත් දිසානායක පවසන්නේ ද රන්ගිරි දඹුලු විහාරය පෞද්ගලික ස්මාරක ගණයට අයත් නිසා 1940 අංක 09 දරන පුරාවිද්‍යා ආඥා පනත අනුව එහි කටයුතු සඳහා මැදිහත්විය නොහැකි බව. එහෙත් ලෝක උරුමයක් ලෙස නම් කිරීම තුළ ම ඇත්තේ එය සුරක්ෂිත කිරීමේ අවශ්‍යතාවක්.

මෙයින් පෙනී යන්නේ සාමූහික ඒකඟතාවකින් රන්ගිරි දඹුලු විහාරය ලෝක උරුමයක් ලෙස රැක ගැනීම සඳහා කටයුතු කළ යුතු බව. කෙසේ වෙතත් මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන පවසන්නේ 2010 වසරේ සකසන ලද කළමනාකරණ සැලැස්ම ද පාදක කර ගනිමින් සියලු පාර්ශ්වවල ඒකඟතාව ඇති ව පුළුල් සැලැස්මක් සැකසීමට කටයුතු කරමින් සිටින බව. එහිදී පළමු ව රන්ගිරි දඹුලු ලෙන ආශ්‍රිත ව මූලික විමර්ශනයක් කළ යුතු බව යි ඔහු අවධාරණය කරන්නේ. තව ද එම සැලැස්ම තුළ අන්තර්ජාතික විද්වත් කමිටුවක් පත් කර ගනිමින් ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට යි නියමිත. එහිදී දඹුලු ලෙන් චිත්‍ර සංරක්ෂණයට මෙන් ම රන්ගිරි දඹුලු විහාරයේ අනන්‍යතාව රැකෙන පරිදි එහි ඓතිහාසික භූ දර්ශනය රැක ගැනීමත් අපේක්ෂිත කරුණක්. මෙරටට පැමිණි යුනෙස්කෝ සංවිධානයට අනුබද්ධ ඉකෝම් ආයතනයේ විශේෂඥ වර්නර් ෂ්මිඩ් (Waman Schmid) ගේ නිරීක්ෂණ ද මේ සඳහා ඉතා වැදගත් වූ බව යි මහාචාර්යවරයා පෙන්වා දෙන්නේ.


කෙසේ වෙතත් ආචාර්ය සෙනරත් දිසානායක පවසන පරිදි යුනෙස්කෝ අධ්‍යක්ෂ ජනරාල්වරිය රන්ගිරි දඹුලු විහාරය ලෝක උරුම ලැයිස්තුවෙන් ඉවත් කරන බවට මෙතෙක් නිල වශයෙන් දැනුම් දීමක් කර නැහැ. ඇතැම් විට රජය මේ සඳහා දක්වන නම්‍යශීලී පිළිවෙත කෙරෙහි ඇයගේ අවධානය යොමු වන්නට ඇති බව යි සිතිය හැක්කේ. ශ්‍රී ලාංකිකයන්ගේ එක ම ප්‍රාර්ථනාය වනු ඇත්තේ ද එය යි.

පොත්පත්

# ප්‍රහසනයට තෝතැන්නක් චෙකෝව්ගේ කෙටි නාට්‍ය

සුනිල් මිහිඳුකුල

**ඇන්ටන්** චෙකෝව් ලෝක ප්‍රකට වේදිකා නාට්‍ය රචකයෙක්. ඔහු දිගු හා කෙටි නාට්‍ය ගණනාවක් ම ලියා තිබෙනවා. චෙකෝව්ගේ නාට්‍ය ගැන අද ලොවපුරා ශාස්ත්‍රාලයීය මට්ටමෙන් විචාර, විමර්ශන සිදු කෙරෙනවා. ආරියරත්න විතාන මෙරට සිටින චෙකෝව් විශේෂඥයෙක් විදියට හඳුන්වන්න පුළුවන්. ඔහු කලකට ඉහතදී චෙකෝව්ගේ ජීවිතය හා නිර්මාණ අළලා අගනා පොතක් සම්පාදනය කළා. එසේ ම 'මුහුදුලිහිණියා' නාට්‍යය සිංහලයට නැඟුවා. 'චෙකෝව් නාටක අනන්‍යකරණය' ඔහු චෙකෝව්ගේ නාට්‍ය ගැන පළල් අධ්‍යයනයකින් යුතු ව ලියූ කෘතියක්. ඔහුගේ අලුත් ම පරිවර්තන කාර්යය වන්නේ චෙකෝව්ගේ කෙටි නාට්‍ය අටක් සිංහලයට නැඟීම යි.



චෙකෝව්ගේ දිගු නාට්‍ය හතරක් තිබෙනවා. ඒ, 'චෙරිවත්ත', 'මුහුදුලිහිණියා', 'අන්කල් වන්යා' හා 'සහෝදරියන් තිදෙනා'. ඒ හැරුණු කොට ඔහු 'ඉවනොෆ් 'නමින් තවත් දිගු නාට්‍යයක් ලියා තිබෙනවා. ඒත් ඒ නාට්‍යය ගැන විචාරකයන් එතරම් අවධානයක් යොමුකරන්නේ නැහැ. කොහොම වුණත් ඒ නාට්‍යයත් එක්ක



බැලුවොත් චෙකෝව්ගේ දිගු නාට්‍ය සංඛ්‍යාව පහක්. චෙකෝව් කෙටි නාට්‍ය ගණනාවක් ලියා තිබෙනවා.

චෙකෝව් තමන්ගේ කෙටි නාට්‍ය හැඳින්වූයේ වොඩ්විල (VAUDEVILLE) යන නාමින්. මොකක්ද මේ වොඩ්විල කියන්නේ ? ඒ ගැන ආරියරත්න විතාන : වොඩ්විල කියන්නේ විනෝදාත්මක විවිධ ප්‍රසංග ප්‍රභේදයක්. එයට විකට ජවනිකා හා ගීත, නැටුම්, කරණම්, සත්ත්ව රැඟුම් යනාදිය ඇතුලත් වුණා. ඒ ප්‍රසංගවල අඩුවක් පුරවන්න තමයි චෙකෝව් කෙටිනාට්‍ය ලිව්වේ. චෙකෝව් තමාගේ 'වලහා' නම් වූ නාට්‍යය හැඳින්වූයේ ප්‍රංශ තාලයේ වොඩ්විලයක් වශයෙන්. ඇත්තට ම දිගු නාට්‍යවලටත් වඩා මේ කෙටි නාට්‍යයෙන් චෙකෝව් සැලකිය යුතු ආදායමක් ලැබුවා. ඔහු 'වලහා' නාට්‍යය හැඳින්වූයේ එය වලහෙක් නොව කිරි එළදෙනක් කියා යි. ටෝල්ස්ටෝයි කියා ඇති විදියට චෙකෝව්ගේ හොඳ ම නාට්‍යයත් මෙය යි.

චෙකෝව් තමන්ගේ කෙටි නාට්‍යවලට වස්තු කර ගත්තේ මොන වගේ අත්දැකීම්ද, මොන වගේ චරිත ද, ඒ වගේ ම ඒ නාට්‍යවලින් ඔහු කියන්න හැදුවේ මොකක්ද කියා සොයා බැලීම වැදගත්.

චෙකෝව්ගේ නාට්‍යවල බොහෝවිට එන්නේ මැදපාංතික චරිත. ඒත් 'මහමඟදී' කියන නාට්‍යයේ ඔහු ප්‍රථම වතාවට පාදඩයන්, සිඟන්නන්, වන්දනාකරුවන්, කම්කරුවන් වැනි චරිත යොදා ගන්නවා. මනුෂ්‍යයන් තුළ තිබෙන දුර්වලකම් ගැන තමයි චෙකෝව් කතා කරන්නේ. නමුත් අවසානයේ ඒ චරිත පිළිබඳ කිසියම් අනුකම්පාවක් ප්‍රේක්ෂකයන් තුළ ජනිත වෙනවා. 'දිවි පුදන්නා', 'දුම්පානයේ ආදීනව' වැනි කෙටිනාට්‍යවල එන ප්‍රධාන චරිත දෙක මේකට හොඳ නිදසුන්. අවසානයේදී ප්‍රකට කරන්නේ උතුරා යන මානව දයාවක්.

චෙකෝව්ගේ කෙටිනාට්‍යවල කෙටිකතා ලක්ෂණ ද දක්නට පුළුවන්. ඇතැම් කෙටිනාට්‍ය ඔහුගේ කෙටි කතාවල ම අනුවර්තන. උදා: 'හංස ගීතය', 'මහමඟදී' වැනි)

'ඇන්ටන් චෙකෝව් කෙටිනාට්‍ය අට' නම් වූ මේ පොතට කෙටිනාට්‍ය අටක් ඇතුළත්. ඉන් ඇතැම් කතා ප්‍රථම වතාවට යි සිංහලට නැඟී ඇත්තේ. 'මංගල සාදය', 'දිවි පුදන්නා', 'හංස ගීතය නොහොත් අන්තිම රංගනය' මේ පොත උදෙසා ම පරිවර්තිත ඇති කෙටිනාට්‍ය තුනක්.

මේ පොතේ එනවා 'මහමඟදී' කියලා කෙටිනාට්‍යයක්. එහි පිටපත සොයාගෙන ඇත්තේ චෙකෝව්ගේ මරණයෙන් පස්සේ. එය කවදාකවත් වේදිකාගත ව නැහැ. ඊට අත්වූ ඉරණම මේක යි. චෙකෝව් මේ පිටපත ආරූඪ නාමයකින් ලියා අනුමැතිය සඳහා වාරණ මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. එහිදී මෙය තහනමට ලක්ව තිබෙනවා. පසු කාලයක තමයි මේ පිටපත සොයා ගෙන තිබෙන්නේ.

වේදිකා නාට්‍යයක පෙළ ඉතා වැදගත්. නාට්‍යයේ කර්තෘත්වය ඇත්තේ රචකයාට යි. නිෂ්පාදකවරුන් කවුරු වුණත් ග්‍රීක නාට්‍ය, ශේක්ෂ්පියර්ගේ නාට්‍ය, කාලිදාසගේ නාට්‍ය අදටත් පවතින්නේ රචනය මත යි. චෙකෝව් කිසිදාක නාට්‍ය නිෂ්පාදනය කළේ නැහැ. බොහෝවිට ඔහුගේ නාට්‍ය වේදිකාවට ගෙන ආවේ කොන්ස්තන්තින් ස්ටැනිස්ලව්ස්කි. 'චෙරිවත්ත' නිෂ්පාදනයේදී චෙකෝව් ඔහු සමඟ පවා ගැටී ඇති බවත් මෙය විනාශ කළ බවට චෝදනා නැගූ බවත් ආරියරත්න විතාන කියා සිටිනවා.

චෙකෝව්ගේ කෙටිනාට්‍ය වර්තමානයට අදාළ වන්නේ කොහොම ද? වැදගත් වන්නේ කොහොම ද? ඒ ගැන ආරියරත්න: "චෙකෝව් නාට්‍ය රචනයේදී ගුරු කොට ගත්තේ ග්‍රීක හා ඉංග්‍රීසි නාට්‍ය ආකෘතිය. ඔහු ග්‍රීක නාට්‍යයේ ආකෘතිය කාලයට සරිලන පරිද්දෙන් තාත්වික සම්ප්‍රදායකට ගළපා ගත්තා. ශේක්ෂ්පියර්ගේ නාට්‍ය ද ඔහුට බලපා තිබෙනවා. විශේෂයෙන් 'මුහුදුලිහිණියා' නාට්‍යයට ආභාස වෙලා තිබෙන්නේ 'හැම්ලට්'. ඒ බව තෝමස් ජේ. විනර් වැනි විචාරකයන් සඳහන් කර තිබෙනවා. චෙකෝව්ගේ කෙටිනාට්‍ය අද නාට්‍ය ආයතනවල මොඩල් එකක් (ආදර්ශ කෘති) විදියට භාවිත කරනවා. කෙටි නාට්‍ය යනු කුමක්ද යන්න වටහා ගන්න චෙකෝව්ගේ මේ කෙටිනාට්‍ය මහෝපකාරී වෙනවා."





# තනි ස්වරයක මාධූර්යය

සුනිල් මිහිඳුකුල

**ආචාර්ය** පණ්ඩිත් අමරදේව එක් පැත්තකින් සුභාවිත සංගීතයත් එච්. ආර්. ජෝතිපාල තවත් පැත්තකින් ජනප්‍රිය සංගීතයත් ඉදිරියට ගෙන ගිය අතර ඒ මැද වූ හිඩැස පිරවීම කාලීන අවශ්‍යතාවක් වුණා. හැටේ දශකය අග භාගයේදී පමණ ගායනයට ප්‍රවිෂ්ට වූ මහාචාර්ය සනත් නන්දසිරි මෙන් ම ආචාර්ය වික්ටර් රත්නායක ද පුරවන්නට යෙදුණේ ඒ හිස් අවකාශය යි.

1958 දී පමණ ඒකල ගායනා තරගයක් විනිශ්චය කිරීම සඳහා පැමිණි සදානන්ද පට්ටියආරච්චි, බී. එස්. විජේරත්න හා අමරදේවයන් වැනි සංගීතයේ ප්‍රාමාණිකයන්

අතරින් අමරදේවයන්, වික්ටර් ගැයූ ගීයකින් ඔහු ගැන පැහැදී "ඔහු කවදා හෝ හොඳ ගායකයකු වෙනවා" යැයි අනාවැකියක් ද පළ කර තිබෙනවා.

වික්ටර් හාත්ඛණ්ඩේ සංගීත විද්‍යාලයෙන් සංගීත අධ්‍යාපනය ලද ගායකයෙක් නොවේ. ඇත්ත වශයෙන්ම පසුගිය දශක ගණනාව තුළ ඉතා ම මිහිරි ගී තනු නිර්මාණය කර ඇත්තේ හාත්ඛණ්ඩයට නොගිය ප්‍රේමසිරි කේමදාස, රෝහණ වීරසිංහ, ක්ලැරන්ස් විජේවර්ධන හා වික්ටර් වැනි ශිල්පීන්. මෙය නූතන සිංහල සංගීතයේ සුවිශේෂ සලකුණක්.

ප්‍රකට සංගීතවේදී සිරිල් පෙරේරා යටතේ පැවැති මහනුවර එම්. ජී. පී. කලායතනය වික්ටර්ගේ ප්‍රථම සංගීත තක්සලාව බවට පත්වුණා. ඉන්පසු කොළඹ එන ඔහු රජයේ සංගීත විද්‍යාලයට බැඳෙනවා. කේ. ඒ. දයාරත්න, ගුණසේන ද සිල්වා, ගුණපාල පෙරේරා, ධර්මසිරි පෙරේරා එදා වික්ටර්ගේ ගුරුවරුන් වුණා. ඔවුන් සියලු දෙනා ම සංගීත විශාරදවරුන්.

වික්ටර් ඒ සමාසන්න අවදියේ මරදාන සංගීත කාමර සම්ප්‍රදායෙන් ද නොමඳ පෝෂණය ලැබූ ආකාරය දක්නට ලැබුණා. ආර්. ඒ. චන්ද්‍රසේන, ප්‍රේමසිරි කේමදාස (සංගීත මංජරිය) යටතේ ඔහු වයලින් වාදකයකු ලෙස කටයුතු කර තිබෙනවා. වික්ටර් චිත්‍රයට පසුබිම් ගායකයකු වන්නට ඉඩ ප්‍රස්ථාව සැලසුණේ විශේෂයෙන් කේමදාස මාස්ටර් ඇසුරෙන්. ඔහු සංගීතවත් කළ "හන්තානේ කතාව", "මීමැස්සෝ", "නාරිලතා", "ආදරවන්තයෝ", "බයිසිකල් හොරා" යන චිත්‍රපටවලට ගී ගැයීමේ අවස්ථාව වික්ටර්ට ලබා දුන්නා. ගායිකා නන්දා මාලිනියට වුණත් එහෙමයි. (එහෙත් මේ දෙදෙනා ම කේමදාසයන්ට නිසි ලෙස ප්‍රණාම දැක්වූයේ ද යන්න ප්‍රශ්නයක්)

වික්ටර්ට නිසඟයෙන් ම පිහිටා තිබුණු ගායනය ද අතිශය මිහිරියි. කිසි ම සංගීත ගුරු කුලයකට යටත් නොවී සිටියකු වශයෙන් ඔහුට විවෘත වූත් සුඛනම්‍යවූත් ගී හඬක් පිහිටියා. ජෝතිපාල, සී. ටී., මිල්ටන් මෙන් නොව වික්ටර්ගේ ගීත අන් අයට ගායනා කිරීම පහසුවුණේ නැහැ. සම්මානනීය භාරතීය ගායක මොහොම්මද් රාෆි ලංකාවට පැමිණි අවස්ථාවක ඔහු කියා ඇත්තේ, "වික්ටර්ගේ ගීත මට ගායනා කරන්න බැහැ. ඒක ඔහුටම ආවේණික වූ හඬක්. ඔහුට ම අනන්‍ය වූ හඬක්" යන්න.

වික්ටර් සරල හා සරල ශාස්ත්‍රීය ගී රැසක් ගායනා කර තිබෙනවා. ඔහු ම නිර්මිත තනුවලදී ඔහු සංගීත නාද රටාවන්ගෙන් අපූර්ව සෞන්දර්යක් මවන්නට සමත්ව සිටිනවා. "තනිතරුවේ", "සිහිල් සුළං රැල්ලේ" වැනි ගීත මීට නිදර්ශන. "හෝපලු වනපෙත", "අම්හිරි වේදෝ ", "චන්දනඩු රාවය", "සොඳුරිය ඔබගේ වුවන මලක් නම්" වික්ටර් ගැයූ සරල ශාස්ත්‍රීය ගී කිහිපයක්.

වික්ටර් වෙනත් ගායක ගායිකාවන්ට පරාර්ථකාමී බවින් තොරව මිහිරි ගී තනු නිර්මාණය කර තිබෙනවා. "පියාණනේ මා", "ඔබෙන් තොර ලෝකයක් ", "කවුද ආවේ කවුද ආවේ", "වැලිබත් ඉවුවා" වැනි ගී තනු අබේවර්ධන බාලසූරියට ද "කුමරියක පා සළඹ සැලුණා", "මොනර පැටික්කි", "බමරිඳු බමරිඳු" වැනි ගී තනු ආචාර්ය අමරදේවයන්ට ද "මට මවු පදවිය", "දෙපෝදගසක් භුවන් අහරේදී", වැනි ගී තනු නන්දා මාලිනිට ද "පිනිබර යාමේ", "සඳකඩ පහණක", "සිනාසෙනු මැන", "බානෙන් බැඳ", "කුඩා ගමේ මද්දහනේ " වැනි ගී තනු සුනිල් එදිරිසිංහට ද "මා නෙත් කැදැල්ලේ ", "සුන්දරත්වයෙන් පිරි ", "ආවා ආදරෙන්", "ආදරයේ මිහිර රැඳී" වැනි ගී තනු මිල්ටන් මල්ලවආරච්චිට ද නිර්මාණය කර තිබෙනවා. වික්ටර් මෙසේ ගී තනු සැකසූ ගායක ගායිකාවන් සංඛ්‍යාව සියයකට ආසන්න යි.

"ස" ප්‍රසංගය (1974) ලංකාවේ ප්‍රථම ඒක පුද්ගල සංගීත ප්‍රසංගය යි. වික්ටර්ගේ අප්‍රමාණ ජනප්‍රියත්වය මැනගත හැකි මාපකයක් ලෙස මේ ප්‍රසංගය හඳුන්වන්නට පුළුවන්. "ස" ප්‍රසංගය ගම් නගරවල සංවිධානය කර ඉන් ලද ලාභයෙන් ඉඩම් කැබැල්ලක්, කඩ කාමරයක්, නිවසක් තනා ගත් උදවිය රට පුරා ම සිටිනවා.

"ස" ප්‍රසංගය වරක් (1976) යාපනය විශ්වවිද්‍යාලයේ වීරසිංහම් ශාලාවේදී පැවැත්වුණා. එය ඉතා ම සාර්ථක ප්‍රසංග වාරයක් වුණා. මේ ප්‍රසංගය වෙනුවෙන් ඩේලිනිවුස් පත්‍රයේ පළවූ විශේෂ අතිරේකයට ලිපියක් සම්පාදනය කළ මහාචාර්ය කේ. කෛලාසපති මෙසේ කියා තිබෙනවා.

" ..... මෙවැනි කටයුතු ඔස්සේ රටේ විවිධ පෙදෙස්වල කලාව ප්‍රචලිත කරන්නටත් අන්‍යෝන්‍ය අවබෝධය තහවුරු කරන්නටත් අපේ සංස්කෘතික උරුමය අගය කරන්නටත් අවස්ථාවක් උදාවෙයි. පටු සීමාවන්ගෙන් වියුක්ත කලාව ජාතික හා සමාජයීය ඒකීයත්වය පිළිබිඹු කරන මාධ්‍යය වන්නේ ය."

මෙයින් එක් කාරණාවක් සාක්ෂාත් වෙනවා. එනම්, වික්ටර්ගේ ගී ඕනෑම ජාතියකට, ඕනෑම සංස්කෘතියකට අයත් ප්‍රජා රසිකත්වය කෙරෙහි ප්‍රබල සාධනීය බලපෑමක් කරන්නේ ය යන්න.

නිසැක වශයෙන් ම හැත්තෑව දශකයේ තාරුණ්‍යයේ ගී හඬ වික්ටර්ගේ. ඔහු තරම් ප්‍රේමයේ චමත්කාරය ගීයට නැඟූ ගායකයකු තවමත් නැති තරම්. "අපි ඈතට ඈතට පා නගලා", "ප්‍රේම පාරාදීසේ", "මම තරහා නැහැ", "ඔබේ දෙතොල් පෙති ", "තනි තරුවේ", "නුඹේ නමින් මා දුක්වී " වැනි ගීත ඊට නිදර්ශන. බතික් සරම හා කමිසය, දිගු වරලස එදා වික්ටර්ගේ තාරුණ්‍යයේ සංකේත වුණා.

සැමවිට ම අර්ථපූර්ණ ගී පදමාලා ඇසුරෙන් ගී ගායනා කිරීම වික්ටර්ගේ විශේෂත්වයක්. ඒ වගේ ම ඔහු තෝරා ගන්නා තේමාව ද විවිධාකාර යි. මවු ගුණ ගී (ආදරයේ උල්පත වූ) බෞද්ධ ගී ගත්තත් (බුදු හාමුදුරුවෝ) දේශාභිමානි ගී (රුවන් නිදන හෙළ බිමයි) ඒ සියල්ල පරිසමාප්ත නිර්මාණ.

වික්ටර් එක් සංගීත සම්ප්‍රදායකට පමණක් ගැති වූ සංගීතඥයෙක් නොවේ. ඔහු ව්‍යවහාරික සංගීතඥයකු ලෙස විවිධ සංගීත ප්‍රකාර භාවිතා කළා. ඔහු ඇතැමුන් මෙන් ඉතා ම පටුවිදියට බටහිර සංගීතය ප්‍රතික්ෂේප කළේ නැහැ.

ප්‍රසංග වාරවලදීත් චිත්‍රපට පසුබිම් සංගීතයේදීත් ඒ ඒ අවධිවල සිටි ඉහළ ම මට්ටමේ වාදකයන් යොදාගන්නට වික්ටර් උත්සුක වුණා. එම්. කේ. රොක්සාමි, එඩ්ගා පෙරේරා, තිස්ස සිරි පෙරේරා, ඩී. ඩී. ගුණසේන වයලින් වාදනයට ද බර්ටි රණසිංහ, සෝමපාල රත්නායක චෙලෝ වාදනයට ද වයි. එම්. සුමනසිරි, පියදාස අතුකෝරල සිතාර් වාදනයට ද ඩයමන්ඩ් පෙරේරා, උපේන්ද්‍ර ප්‍රනාන්දු ගිටාර් වාදනයට ද එම්. ඩබ්ලිව්. පීරිස් බටනළා වාදනයට ද ඒලියන් ද සොයිසා සර්පිනා වාදනයට ද ජෝසන් මානික්කවාසගර් ඩබල් බේස් වාදනයට ද විජේරත්න රණතුංග, ජේම්පාල ගාල්ලගේ, විමල් ජේ. සාගර තාල තරංග වාදනයට ද සේන වීරසේකර ග්ලොකන්ස්පියල් වාදනයට ද එම්. කේ. රොක්සාමි, ස්ටැන්ලි පීරිස් සැක්සෆෝන් වාදනයට ද යොදා ගත්තේ ඒ අනුව.

වික්ටර් ඉතා ම ප්‍රතිපත්තිගරුක අඳීන ගායකයකු වීම ද වැදගත්. ඔහු සෙසු ප්‍රබුද්ධ ගායක ගායිකාවන් මෙන් සන්ෆ්ලවර් රැල්ලට හසු වුණේ නැහැ. එක්තරා ගීත රචකයකුගේ පදමාලා ගායනා නොකරන්නට ඔහු ගත් තීරණය මත ඔහු සැමදා නොසැලී සිටියා. එම ගීත රචකයා මෙරටේ ජනප්‍රිය ම ගීත රචකයා වීම වික්ටර්ට වැදගත් සාධකයක් වුණේ නැහැ.



# ඩිජිටල්කරණය වන රිදී තිරය

**පී. පී. මාලා මල්කාන්ති**

**දේශීය** සිනමාවේ හැත්තෑ විය සපුරන මේ වසරේ රජයේ ප්‍රධාන අපේක්ෂාවක් වන්නේ මෙරට සියලු ම සිනමාශාලා 2K තාක්ෂණය යටතේ ඩිජිටල්කරණය කිරීම. 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනතට අනුව පවතින මිලිමීටර් 35 සිනමාව ඩිජිටල් ත්‍රිමාන ප්‍රක්ෂේපණ ක්‍රමයට දියුණු කිරීම යි එහි අරමුණ.

ඒ අනුව මේ වන විටත් ශ්‍රී ලංකාවේ 168ක් වූ සිනමාශාලා අතරින් 40ක් ඩිජිටල්කරණය කර අවසන්. ඉතිරි ප්‍රමාණය මේ වසර නිම වන විට ඩිජිටල්කරණය කිරීමට යි අපේක්ෂා කරන්නේ.

සිනමා ඩිජිටල්කරණය සම්බන්ධයෙන් ලොව අනෙකුත් රටවලට සාපේක්ෂව බලන විට අප තවමත් සිටින්නේ පසුපසින් බව යි මෙරට බොහෝ සිනමාවේදීන්ගේ මතය. සිනමා අධ්‍යක්ෂවරුන්ගේ සංසදය ඇතුළු සිනමා සංවිධාන වසර ගණනක සිට මේ සඳහා උනන්දුවක් දැක්වුව ද එයට රජයේ අවධානය යොමු නොවූ බව යි ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ පෙන්වා දෙන්නේ. මේ නිසා 2016 වසරේ මැද භාගයේ පමණ රජය විසින් විශේෂඥ කමිටුවක් පත් කර ඇත්තේ සිනමා ඩිජිටල්කරණය හා බෙදාහැරීමේ අසමතුලිතතාව අවම කිරීම සඳහා. එම කමිටුව විසින් මේ සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ හා නිර්දේශ වාර්තාවක් මේ වන විට අග්‍රාමාත්‍යවරයාට බාර දී ඇති බව යි එහි කමිටු සාමාජික ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ සඳහන් කරන්නේ.

මේ පිළිබඳ වැඩිදුරටත් අදහස් දක්වන ඔහු: "ශ්‍රී ලංකාවේ සිනමාවේ පැවැත්මට ඩිජිටල්කරණය කිරීම හැර අන් මගක් නැහැ. ඩිජිටල්කරණය නොවන්නට එම සිනමාශාලාවේ මරණය සිදු වෙනවා. දැනමටත් බොහෝ නිෂ්පාදකවරු ඩිජිටල්කරණය නොකළ සිනමා ශාලාවලට තම පිටපත් බාර දෙන්නේ නැහැ. දැනටමත් අප ප්‍රමාද යි. එහෙත් මේ ආකාරයෙන් හෝ අවධානය යොමුවීම වැදගත්."

ලෝකයේ බොහෝ රටවල ඩිජිටල්කරණය සම්බන්ධයෙන් රජය දක්වන උනන්දුව ඉතා ඉහළ යි. චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ සඳහන් කරන්නේ සිනමාශාලා ඩිජිටල්කරණය නොකළහොත් ඒවා රජයට පවරා ගන්නා බවට ප්‍රංශ රජය ප්‍රකාශ කර ඇති බව. එසේ ම ඉන්දියාවේ ඩිජිටල් යන්ත්‍ර හිමියන් සිනමාශාලාවලට යන්ත්‍ර ලබා දෙමින් දායකත්වය සිදු කළ නිසා ම සිනමාශාලා ඩිජිටල්කරණයට ලැබුණේ පහසුවක්. මේ නිසා එවැනි ප්‍රවේශයක් රටකට අවශ්‍ය යි. කෙසේ වෙතත් මෙරට සිනමාශාලා ඩිජිටල්කරණය සම්බන්ධයෙන් තවමත් ජාතික චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය

වී නැහැ. මේ සම්බන්ධ කෙටුම්පත පමණයි තිබෙන්නේ. එහෙත් එය මෙරට සිනමාශාලා ඩිජිටල්කරණ කටයුතුවලට බාධාවක් කර නොගන්නා බවත් චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ පවසනවා.

මේ සම්බන්ධයෙන් පත් කළ කමිටුව ඉදිරිපත් කළ නිර්දේශ අතර ඩිජිටල්කරණ කටයුතුවලදී සිනමාශාලා හිමියන් මුහුණපාන ප්‍රායෝගික ගැටලුවට යෝජනා කළ විසඳුම ඉතා වැදගත්. ඒ, ඩිජිටල්කරණයට ලක් කරන සිනමාශාලාවල ප්‍රවේශ පත්‍රයේ මිල වැඩිකර එම අධිභාරය ඩිජිටල්කරණ කටයුතු සඳහා යොදා ගැනීමට සිනමාශාලාවලට ලබාදීම. එසේ ම සිනමා ශාලා ඩිජිටල්කරණය සඳහා ආනයනය කරන භාණ්ඩ බදුවලින් නිදහස් කිරීම හා ඒ සඳහා සහනදායී පොලී ක්‍රමයක් යටතේ ණයක් ලබාදීමත් මූලික යෝජනාවක්.

මේ අතර ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් සරසවි චිත්‍රාගාරය ද ඩිජිටල්කරණය කිරීමේ පළමු අදියර නිමා කර ඇති අතර එය ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව නවීකරණය කිරීමේ කටයුතු සිදු වන්නේ කඩිනමින්. සරසවි චිත්‍රාගාරයේ අංශ ප්‍රධාන විමල් රණවක පවසන්නේ 2007 වසරේදී ඩිජිටල්කරණයේ මූලික කටයුතු ලෙස ශබ්ද පටිගත කිරීමේ සහ සංස්කරණය කිරීමේ පහසුකම් පුළුල් කළ බව. ජාත්‍යන්තර මට්ටමින් දියුණු බහුමාන ශබ්ද (7.1 Surround Sound Mixing) පහසුකම් ලංකාවේ නොමැති නිසා එය ලබා ගැනීමට යා යුත්තේ ඉන්දියාවට. මේ නිසා ඩිජිටල්කරණයේ දෙවැනි අදියර ලෙස චිත්‍රපට පශ්චාත් නිෂ්පාදන කාර්මික පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව නවීකරණය කිරීමට අපේක්ෂා කරන බවත් විමල් රණවක පවසනවා.

සරසවි චිත්‍රාගාරය නවීකරණය වන්නේ ප්‍රධාන අංශ තුනක් ඔස්සේ. ඒ, සිනමා අධ්‍යාපනය ඉහළ නැංවීම, චිත්‍රපට නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කාර්මික පහසුකම් වැඩි දියුණු කිරීම සහ චිත්‍රපට සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය කිරීම. මේ සඳහා පසුගිය අයවැයෙන් රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදන වෙන් කර තිබෙනවා. එහිදී සිනමා පාසලක් (National Film Academy) සඳහා රුපියල් මිලියන 50ක් සහ චිත්‍රපට සංරක්ෂණය හා ප්‍රතිෂ්ඨාපනය (Film Archive & Resolution Unit) සඳහා රුපියල් මිලියන 50ක් ලෙස යි ප්‍රතිපාදන වෙන් වන්නේ. සරසවි චිත්‍රාගාරයේ මේ කටයුතු සිදු වන්නේ ජාතික කෞතුකාගාරයත් සමඟ සම්බන්ධ වීමෙන්.

මේ වන විට සරසවි චිත්‍රාගාරයේ සිදු වන නවීකරණ කටයුතු පිළිබඳ පැහැදිලි කරන එහි අංශ ප්‍රධාන විමල් රණවක: "සරසවි චිත්‍රාගාරයේ විජය කුමාරණතුංග මැදිරිය නවීකරණය වෙමින් තිබෙන්නේ චිත්‍රපට පශ්චාත් නිෂ්පාදන පහසුකම් එනම්, දැනට ඇති ශබ්ද පටිගත කිරීමේ පහසුකම් ජාත්‍යන්තර මට්ටමේ බහුමාන ශබ්ද පටිගත කිරීම දක්වා දියුණු කිරීමට පියවර ගැනීමෙන්. මේ වසරේ ජූලි මාසය වන විට එය අවසන් කළ හැකි යි. සංස්කරණ අංශය තුළ වර්ණ නිවැරැදි කිරීම ජාත්‍යන්තර මට්ටමට දියුණු කිරීමට අපේක්ෂා කරනවා. ඒ සමඟ ම ඉහළ විභේදන සහිත චිත්‍රපට මාධ්‍ය (4K & above Resolution) සංස්කරණය කළ හැකි අයුරින් උපකරණ සවි කර සංස්කරණ අංශයත් නවීකරණය කිරීමේ වැඩපිළිවෙළක් ද සකස් කර තිබෙනවා. දේශීය සිනමාවට අවශ්‍ය කාර්මික පහසුකම් ලබා දීමේදී චිත්‍රපට


සරසවි චිත්‍රාගාරයේ ඇති ඇනලොග් සංස්කරණ උපකරණ


නව ඩිජිටල් සංස්කරණ මැදිරිය

නිෂ්පාදනය සහ චිත්‍රපට පසු නිෂ්පාදනය තුළ Sound Recording, Sound Mixing, Sound Designing, Sound Editing, Colour Correction & DCP Tranfering ජාත්‍යන්තර මට්ටමට දියුණු කිරීමත් සිදු වෙනවා."

චිත්‍රපට කර්මාන්තයේ දියුණුවට වැදගත් වන මේ පියවර මේ වසර නිම වන විට අවසන් කිරීමට යි රජය අපේක්ෂා කරන්නේ. එහිදී ජාතික චිත්‍රපට සංස්ථාවේ සභාපති නීතිඥ දීපාල් චන්ද්‍රරත්න මේ සඳහා ලබා දෙන සෘජු මැදිහත්වීමත් විමල් රණවක අගය කළ කරුණක්.

එසේ ම මේ සම්බන්ධයෙන් පැන නැඟිය හැකි වන ප්‍රධානතම අභියෝගය වන දිනෙන් දින සිදුවන ඩිජිටල් තාක්ෂණයේ වෙනස්වීම් ජය ගැනීමට පටිගත කිරීමේ මැදිරිය ජාත්‍යන්තර මට්ටමින් සිදු කෙරෙන DOLBY ATMOS අලුත් ම ශබ්ද පටිගත කිරීමේ ක්‍රමයට ඉදිරියේදී නවීකරණය කිරීමටත් සූදානම්.

කෙසේ වෙතත් සිනමාශාලා ඩිජිටල්කරණය කළ පමණින් ම දේශීය සිනමාවේ උන්නතිය සිදු නොවන බව පෙන්වා දෙන චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රසන්න විතානගේ අවධාරණය කරන්නේ ඒ සමඟ ම චිත්‍රපට කර්මාන්තයේ ව්‍යුහීය වෙනස්කම් ද සිදු විය යුතු බව. එහිදී කමිටුවේ නිර්දේශ මඟින් ද යෝජනා කර ඇති පරිදි ජාතික චිත්‍රපට සංස්ථාව ජාතික චිත්‍රපට සංවර්ධන කොමිසමක් බවට පත් කිරීමට යෝජනා කර තිබෙනවා. එමඟින් අපේක්ෂා කරන්නේ සියලු සිනමා ශිල්පීන්ට ජාති භේදයකින් තොර ව, එනම් සිංහල, දෙමළ, ඉංග්‍රීසි වශයෙන් වර්ගීකරණය නොකර දේශීය සිනමාකරුවන් ලෙස ඔවුන් සවිබල ගැන්වීම. එසේ ම සිනමාශාලා හිමියන් ස්වාධීන කිරීමට යෝජනා කරන්නේ චිත්‍රපට ප්‍රදර්ශනය කිරීමේ අයිතිය ඔවුන්ට ද ලබා දීමට. චිත්‍රපට බෙදාහැරීමේ ඒකාධිකාරය ඉවත් කොට නිෂ්පාදකයා ශක්තිමත් කළ යුතු බවත් කමිටුව යෝජනා කරනවා.

මේ අයුරින් සිනමාශාලා ඩිජිටල්කරණය සහ දේශීය සිනමා කර්මාන්තයේ දියුණුව කෙරෙහි රජයේ අවධානය යොමු වීම දේශීය සිනමාව ජාත්‍යන්තර තලයට ඔසවා තැබීමට හේතුවන බව නම් නිසැක යි.

# T20 කැන්ගරුවන් පැරද වූ සිංහයෝ







ආනන්ද ජයසිංහ

නොබෝදා ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ ඕස්ට්‍රේලියානු සංචාරය ආරම්භ කළේ දකුණු අප්‍රිකානු සංචාරයේදී ලැබූ පරාජයන්වල අමිහිරි අත්දැකීම් මකාදැමීමේ ප්‍රධාන අරමුණ ඇති බවට කිසිම සැකයක් නැහැ. මුලින්ම තරගාවලිය ආරම්භ වුණේ (17දා) විස්සයි 20 ක්‍රිකට් තරගාවලියෙන්. තරග තුනකින් සමන්විත වූ විස්සයි 20 තරගාවලියේ මුල් තරග දෙකම ජයග්‍රහණය කරමින් විස්සයි 20 තරගාවලිය ජයග්‍රහණය කිරීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් වුණා.

ශ්‍රී ලංකා කණ්ඩායමේ නිත්‍ය නායක ඇන්ජලෝ මැතිව්ස්ගේ ආබාධිත තත්ත්වය නිසා ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා ලෙස කටයුතු කිරීමට භාර වුණේ උපුල් තරංගට. නවක ක්‍රීඩකයන් රැසකගෙන් සමන්විත වූ ශ්‍රී ලංකා කණ්ඩායමට කලකට පසු එක් වූ වේගපන්දු යවන ලසිත් මාලිංග නිසා කණ්ඩායම ශක්තිමත් වුණා.

පසුගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේ පැවැති ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියේදී තරගයකට සහභාගිවෙමින් සිටියදී පාදයේ ආබාධයක් නිසා කණ්ඩායමෙන් ඉවත් වූ ලසිත් මාලිංගට ඊවර විස්සයි - 20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේදී ද ක්‍රීඩා කිරීමට නොහැකි වුණා. වසරකට ආසන්න කාලයක් ජාත්‍යන්තර ක්‍රීඩා පිටියෙන් ඉවත් වී සිටි මාලිංග ශ්‍රී ලංකා කණ්ඩායමට එක්වීම විශාල ශක්තියක් වුණා. මේ තරගාවලියේ පළමුවැනි තරගය පැවැත්වුණේ (17දා) මෙල්බර්න් පිටියේදී. කාසියේ වාසිය දිනූ ශ්‍රී ලංකා නායක උපුල් තරංග පළමුවෙන් පන්දුවට පහරදීමට ඕස්ට්‍රේලියානු කණ්ඩායමට ආරාධනා කළා. ඒ අනුව, නියමිත පන්දුවාර 20 අවසානයේදී කඩුලු 6ක් දැවී ලකුණු 168ක් රැස්කර ගැනීමට ඕස්ට්‍රේලියානු කණ්ඩායම සමත් වුණා. ඕස්ට්‍රේලියානු කණ්ඩායම වෙනුවෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් රැස් කළේ ආරොන් පින්ච්. ඒ, ලකුණු 43ක්. ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් ලසිත් මාලිංග කඩුලු 2ක් දවා ගැනීමට සමත් වුණා.

ජයග්‍රාහී ඉලක්කය වූ ලකුණු 169 නියමිත පන්දුවාර 20 තුළදී කඩුලු 5ක් දැවී ලබාගැනීමට ශ්‍රී ලංකා කණ්ඩායම සමත් වුණා. මෙහිදී ලකුණු 168ක ඉලක්කය හඹායාමට පිටියට පිවිසි ශ්‍රී ලංකා කණ්ඩායමේ පළමු වැනි කඩුල්ල ලෙස උපුල් තරංග ලකුණු නොලබාම දැවී ගියා. ඉන්පසු ආරම්භක පිතිකරු නිරෝෂන් දික්වැල්ලට එක් වූ ඩිල්ෂාන් මුණවීර වේගවත් පිතිහරඹයක නිරත වෙමින් ලකුණු 74ක සබඳතාවක් ගොඩනැගුවා. මෙහිදී ඩිල්ෂාන් මුණවීර 44ක් ද, නිරෝෂන් දික්වැල්ල ලකුණු 30ක් ද තම කණ්ඩායමට එකතු කළා. ජයග්‍රහණය වෙත ශ්‍රී ලංකා කණ්ඩායම රැගෙන ගිය අසේල ගුණරත්න තම ක්‍රිකට් දිවියේ විස්සයි - 20 තරගයකදී මංගල අර්ධ ශතකය වාර්තා කළේ ලකුණු 52ක් රැස්කරමින්.

දෙවැනි විස්සයි - 20 තරගය පැවැත්වුණේ ගීලෝන්හිදී. මේ තරගයේදී ද නැවත වරක් කාසියේ වාසිය දිනාගත් ශ්‍රී ලංකා නායක උපුල් තරංග ප්‍රථමයෙන් පන්දුවට පහරදීමට ඕස්ට්‍රේලියානු කණ්ඩායමට ආරාධනා කළ අතර ඔවුන් සිය පන්දුවාර 20 තුළදී සියලු දෙනා දැවී ලබාගත් ලකුණු ප්‍රමාණය 173ක්. එහිදී ඕස්ට්‍රේලියානු කණ්ඩායම වෙනුවෙන් ආරම්භක පිතිකරු මයිකල් ක්ලින්ගර් (43) හා මොරින්ස් හෙන්රික්ස් (නොදැවී 56) පිත්තෙන් දස්කම් දැක්වීමත් ශ්‍රී ලංකාව වෙනුවෙන් දක්ෂ පන්දු යැවීමක නිරත වූ නුවන් කුලසේකර ලකුණු 31කට කඩුලු 04ක් දවා ගැනීමත් විශේෂත්වයක්.

ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ ලකුණු 173ක ඉලක්කය හඹා යාමට පිටියට පිවිසි ශ්‍රී ලංකා කණ්ඩායමේ මුල් පෙළ පිතිකරුවන් අඩු සංඛ්‍යාවකට දැවී යද්දී අසේල ගුණරත්න හා චාමර කපුගෙදර එක්ව ශ්‍රී ලංකා කණ්ඩායම ගොඩනැඟීම මෙහිදී දක්නට ලැබුණු සුවිශේෂත්වයක්. එහිදී චාමර කපුගෙදර ලකුණු 33කින් ශ්‍රී ලංකා කණ්ඩායමට දායකත්වය සැපයූ අතර ජයග්‍රහණයේ සිහින දකිමින් සිටි ඕස්ට්‍රේලියානුවන් අභිමුව අවසන් පන්දුවාර 3 තුළදී ශ්‍රී ලංකාවේ ජයග්‍රහණයට එල්ල වූයේ ලකුණු 48ක අභියෝගයක්. ඔවුන්ගේ එම සිහිනය බොඳ වූයේ ඒ වන විට කඩුල්ලේ රැඳී සිටි නුවන් කුලසේකර හා අසේල



ගුණරත්න එක්ව 18 වැනි පන්දු වාරයේදී ලකුණු 12ක් තම කණ්ඩායමට රැස් කිරීමෙන්.

මේ තරගයේදී විශේෂයෙන් ම 19 වැනි පන්දුවාරය යැවූ ඕස්ට්‍රේලියානු කණ්ඩායමේ මොයිසස් හෙන්ඩ්‍රික්ස්ට එරෙහිව අසේල ගුණරත්න ලකුණු 22ක් (0, 6, 6, 6, 4, 0) ලබාගැනීම ක්‍රීඩා ලෝලීන්ගේ මතකයේ රැඳෙනවාට කිසිඳු සැකයක් නැහැ. අවසන් පන්දු වාරයේදී ජයග්‍රහණයට ලබාගත යුතුව තිබුණේ ලකුණු 14ක ඉලක්කයක්. එම පන්දු වාරයේ ප්‍රථම පන්දුවෙන්ම නුවන් කුලසේකර දැවී ගිය අතර පිටියට පිවිසියේ ලසිත් මාලිංගයි. අසේල ගුණරත්නට එක් වූ මාලිංග අවශ්‍ය ඉලක්කයට පැමිණියේ අවසාන පන්දුවට ලකුණු 2ක අභියෝගයක් හිමිකර ගනිමින්. එවිට අවසන් පන්දුවට මුහුණ දුන් අසේල අවසන් පන්දුවට හතරේ පහරක් එල්ල කරමින් ජයග්‍රහණය වාර්තා කළේ තරගය නරඹමින් සිටි සියලු ක්‍රීඩා ලෝලීන් අමන්දානන්දයට පත්කරමින්.

අසේල ගුණරත්න විස්සයි 20 තරග කීමේ තම හොඳම ඉනිම ක්‍රීඩා කරමින් නොදැවී ලකුණු 84ක් රැස්කිරීමට මේ තරගයේ දී සමත් වූ අතර ඔහු මේ ලකුණු සංඛ්‍යාව රැස් කළේ පන්දු 46කදී අලංකාර හයේ පහර 5කින් හා හතරේ පහර 06ක් ඇතුළත්ව. ඒ අනුව මේ තරග දෙකේදීම තරගයේ වීරයා සම්මානය හිමිකර ගැනීමට ඔහු සමත්වුණා.

# ප්‍රමුඛ පෙළට නව ආරක්

**එම්. පී. හේමන්ත**

**දේශීය** ක්‍රිකට් පිටියේ ජ්‍යෙෂ්ඨයන් හා නවකයන්ගේ ක්‍රීඩා දස්කම් උරගා බලන අන්තර් සමාජ ක්‍රිකට් තරග මාලාවේ එක්දින තරගාවලිය හා විස්සයි 20 තරගාවලිය නව ආරකින් හා වෘත්තීය මට්ටමකින් පැවැත්වීමට ක්‍රිකට් ආයතනය කටයුතු කර තිබෙනවා. මෙහි සමාරම්භක උළෙල නොබෝදා (14දා), ක්‍රිකට් සභාපති තිලංග සුමතිපාල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණේ කොළඹ ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගණයේදී.

දිවයින පුරා සිටින කණ්ඩායම් 23ක්, කාණ්ඩ 4ක් යටතේ මේ තරගාවලියේදී තරග වැදීමට නියමිතයි. සමස්ත තරග 64කින් සමන්විත මේ තරගාවලියේදී ක්‍රීඩා සමාජවලින් ක්‍රීඩකයන් 460කට ආසන්න ප්‍රමාණයක් ක්‍රීඩා කිරීමට අපේක්ෂිතයි. පෙබ. 18 වැනිදායින් ආරම්භ වන තරගාවලිය මාර්තු 12 වැනිදා දක්වා පැවැත්වෙන අතර මූලික වටයේ තරග 03 වැනිදායින් අවසන් වෙනවා. අර්ධ අවසන් පූර්ව වටයේ තරග මාර්තු මස 5 වැනි දා ආරම්භ වීමට නියමිත යි. අවසන් පූර්ව තරග 8 වැනි දා පැවැත්වෙන අතර මාර්තු 12 වැනිදා අවසන් මහා තරගය පැවැත්වීමට කටයුතු යොදා තිබෙනවා.

මේ එක්දින හා විස්සයි 20 තරගාවලියේදී විශිෂ්ටතම ක්‍රීඩකයන්ට ත්‍යාග වශයෙන් රෙනෝල්ඩ් ක්විඩ් වර්ගයේ මෝටර් රථ හා වසරේ දක්ෂතම ක්‍රීඩා සමාජයට නිෂාන් වෑන් රථයක් ප්‍රදානය කිරීමට ක්‍රිකට් ආයතනය කටයුතු කර තිබෙනවා.

මේ සමාරම්භක උත්සවයේදී අදහස් දැක් වූ ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපති තිලංග සුමතිපාල : "සෑම ක්‍රීඩකයකුට ම සම අවස්ථා ලබාදීම ක්‍රිකට් ආයතනයේ වගකීමක්. එමඟින් වැඩි ක්‍රීඩකයන් ප්‍රමාණයක් විවිධ තරග රටාවලට තෝරාගත හැකියි. ඔවුන් වෘත්තීය මට්ටමට රැගෙන යා හැකි අතර ප්‍රමුඛ පෙළ තරගාවලිය මඟින් දේශීය ක්‍රිකට් ඉහළ තලයකට රැගෙන යා හැකියි. එමඟින් තාක්ෂණයෙන් ඉහළ ක්‍රීඩකයන් බිහිකර ගැනීමට අපට හැකි වෙනවා."



# ශ්‍රී ලංකාවට හැමූ සකුරා මල් සුවඳ

# ඔෂින්

සුමිත් මායාදුන්නේ

**ජපානයේ ටෙලිවිෂන් ඉතිහාසයේ ජනප්‍රියත්වයේ හිනිපෙත්තට ගිය වැඩසටහන වූයේ ඔෂින් ටෙලිනාට්‍යය යි. ඔෂින් කොතරම් ජන හදවතට සමීප වූවා ද කිවහොත් ජපන් වාග් කෝෂයට ඔෂින් යන නාමය එක් වුණා. ඔෂින් බෝනික්කන්, ඔෂින් දැන්වීම්, ඔෂින් ගීත, මේ අතරින් ප්‍රධාන යි. ජපානයට පැමිණෙන විදේශිකයන් ඔෂින් ගැන කතා කිරීමට අමතක කළේ නැහැ.**



**ජපානයේ** දුප්පත් පුංචි කෙල්ල ඔෂින්ගේ දුක්බර මෙන් ම ධෛර්යවන්ත ජීවිත කතාව රූපවාහිනී තිරය පුරා දිග හැරෙද්දී එය නැරඹීමට ඇබ්බැහි වුණේ ජපානයේ ප්‍රේක්ෂකයන් පමණක් නොවේ. මීට විසි වසරකට පෙර ජාතික රූපවාහිනියෙන් ඔෂින් විකාශය වෙද්දී ශ්‍රී ලංකාවේ ප්‍රේක්ෂකයන් ඔෂින් වැළඳගත්තේ ඉමහත් ආදරයෙන්. පුංචි ඔෂින් වයසට වඩා මුහුණදෙන ජීවන ගැටලු හමුවේ අපේ ප්‍රේක්ෂකයන් එය නැරඹුවේ ඉමහත් සංවේදී ව කඳුළු සලමින්. ඔෂින් නරඹා කඳුළු සලමින් නින්දට ගිය අපේ ප්‍රේක්ෂකයන්, විසි වසරක් ගත වුවත් ඔෂින් ගැන මතකය හදවතේ සඟවාගෙන නොබෝදා ශ්‍රී ලංකාවට පැමිණි දැන් මැදිවියේ සිටින ඒ ඔෂින් ව පිළිගත්තේ ඉමහත් භක්තාදරයෙන්. එදා දස හැවිරිදි වියේ පසුවෙමින් සිටි ඔෂින් ලෙස රඟ පෑ අද හතළිස් පස්වැනි වියේ පසුවන ජපන් ජාතික අයකෝ කබයාෂිට ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් මෙතරම් ආදරේ කරනවා දැයි ඇය කිසි දිනෙක බලාපොරොත්තු වූයේ නැහැ. එහෙත් කටුනායක ගුවන් තොටුපොළින් පිටතට ආ මොහොතේ ප්‍රේක්ෂකයන් ඇය පිළිගත්තේ ඇය පුදුමයට පත් කරවමින්. වැඩිහිටියකු වුවත් ඔෂින් ජීවමාන ව දැක ගැනීමට ඔවුන් පෙළගැසී සිටියා.

ජපානයේ ටෙලිවිෂන් ඉතිහාසයේ ජනප්‍රියත්වයේ හිනිපෙත්තට ගිය වැඩසටහන වූයේ ඔෂින් ටෙලිනාට්‍යය යි. ඔෂින් කොතරම් ජන හදවතට සමීප වූවා ද කිවහොත් ජපන් වාග් කෝෂයට ඔෂින් යන නාමය එක් වුණා. ඔෂින් බෝනික්කන්, ඔෂින් දැන්වීම්, ඔෂින් ගීත, මේ අතරින් ප්‍රධාන යි. ජපානයට පැමිණෙන විදේශිකයන් ඔෂින් ගැන කතා කිරීමට අමතක කළේ නැහැ. ඔෂින් ටෙලිනාට්‍යය රටවල් 70ක පමණ උපසිරැසි සහිත ව හා හඬකැවීමෙන් විකාශය වී තිබෙනවා. ලොව පුරා මේ පුංචි ඔෂින්ගේ ජනප්‍රියතාව රැව් දුන්නා ද යන්න ඉන් පැහැදිලි යි. සිංහල භාෂාවෙන් හඬ කැවුණු ඔෂින් පුංචි තිරයට හඬකවා නිර්මාණය කිරීමට මුල් වුණේ ටයිටස් තොටවත්ත සූරීන්.

එදා ඒ පුංචි ඔෂින් වූ අයකෝ කබයාෂි **(Ayako Kabayashi)** ශ්‍රී ලංකාවට පැමිණියේ **Japan Export Premier - Sri Lanka 2017** සංස්කෘතික හා ව්‍යාපාරික ප්‍රදර්ශනය වෙනුවෙන්. කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති එම ප්‍රදර්ශනයේදී ඇය අපේ ප්‍රේක්ෂකයන් හමු වීම සුන්දර අවස්ථාවක් වුණා. මාධ්‍ය අමතන ඔෂින් වූ අයකෝ කබයාෂි: " මගේ මුහුණුවර ඔෂින් රඟපානවාට වඩා ගොඩක් දැන් වෙනස් වෙලා. ඒත් මගේ ප්‍රේක්ෂකයන් මට පවසා සිටියේ ඒ පුංචි ඔෂින්ගේ මුහුණුවර මාගෙන් දකින බවයි. ඔවුන් මම උණුසුම් ව හා ආදරයෙන් පිළිගත් ආකාරයෙන් ඔෂින් කොයිතරම් ජනප්‍රිය ද කියලා මට පැහැදිලි වුණා. ශ්‍රී ලංකාවට පැමිණීමට මට කළ ආරාධනය ගැන මම බෙහෙවින් සතුටු වෙනවා. ඔෂින් ගැන නිර්මාණය වුණු චිත්‍රපටය ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් සමඟ එකට හිඳිමින් නරඹා විනෝද වීමට ලැබීම මට ඉමහත් සතුටක් වගේ ම සදා මතකයේ රැඳෙන සිදුවීමක්".

මේ අවස්ථාව ශ්‍රී ලාංකිකයන්ට ලැබීම ජපානයත් ලංකාවත් අතර පවතින මිත්‍ර සහජීවනය පිළිබඳ කදිම ආදර්ශයක් වන බව ඔෂින් පවසා සිටියා. එපමණක් නොවේ. ඒ පුංචි ඔෂින් ශ්‍රී ලංකා චිත්‍රපටයකට රඟපෑමට එක් වී සිටීම තවත් සුන්දර අත්දැකීමක්. සුමිත්‍රා රාහුබද්ධ රචනා කළ 'කන්දක් සේ මා' නවකතාව ඇසුරින් නිර්මාණය වන චිත්‍රපටයකට ඇගේ දායකත්වය ලැබෙනවා. ඒ, එම චිත්‍රපටය ශ්‍රී ලංකාව හා ජපානය අතර ඒකාබද්ධ නිෂ්පාදනයක් වන බැවින්.

ශ්‍රී ලාංකික ප්‍රේක්ෂක හිතවතුන්ට ඔෂින් දුන් පණිවුඩය කුමක් ද? ඇය (අයකෝ කබයාෂි): " මම දැන් වැඩිහිටියකු වුවත් පුංචි ඔෂින්ට ලෙස මට ආදරය දැක්වීම මට හරිම පුදුමයි. පුංචි ඔෂින් ශ්‍රී ලංකාවත් ජපානයත් අතර පාලමක් වීම ගැන මට ඉතාම සතුටුයි".

# ජගත් පුවත් රටා

ෆොටෝ පාඨ - **ධර්මදාස ගමගේ**

**අමෙරිකාවේ,** කැලිෆෝනියා ප්‍රාන්තයේ, ඔරෝවිල් ජලාශය කොතරම් දැවැන්ත ද යත් එහි වේල්ලේ උස පමණක් අඩි 770ක්. පසුගිය දිනවල ඇදහැළුණු ධාරානිපාත වර්ෂාව නිසා මේ වේල්ල තර්ජනයට ලක් වුණේ ජලාශයේ ධාරිතාව ඉක්මවා යන තරමට ජලය පිරුණු නිසා. ඒ මදිවාට වැඩි ජලය මුදා හැරෙන පිටවානේ මහා වළක් හැරී යාම නිසා අවදානම තවත් ඉහළට යි නැංවුණේ.



වේල්ලෙන් පහළ ජීවත් වන පවුල් විශාල සංඛ්‍යාවක් ආරක්ෂක ස්ථාන කරා ඉවත් කිරීමට යි ඒ නිසා බලධාරීන්ට සිදු වුණේ. එසේ ඉවත් කැරුණු පිරිස ලක්ෂ 2කට අධික යි. අවදානම කොයි රටක කොතැනක සිටියත් ජීවිත සමඟ ම යා වූවක්.





**උතුරු** කොරියාව නිරන්තර උත්සාහයක යෙදී සිටින්නේ සිය මිසයිල හැකියාව ඉහළට ම නැංවීමට. ගිය පෙබරවාරි 12 වැනි දා එහිලා තවත් ජයග්‍රහණයක් අත් කර ගත්තේ මධ්‍ය දුර මිසයිලයක් සාර්ථක ව අත්හදා බැලීමෙන්.

එයට න්‍යෂ්ටික සිරසක් යෙදිය හැකි වීම සහ එයට ඝන ඉන්ධන සාර්ථක ව යොදා ගෙන තිබ්ම මිසයිල තාක්ෂණයේ දියුණුව පෙන්නුම් කරන බව යි, තාරකා භෞතික විද්‍යාව පිළිබඳ හාවර්ඩ් ස්මිත්සෝනියන් මධ්‍යස්ථානයේ ජොනතන් මැක්ඩොවල් සඳහන් කරන්නේ.

කි.මී. 9000ක් දුර යැවිය හැකි අන්තර්මහාද්වීපික බැලිස්ටික් මිසයිලයක් ද ළඟදී ම අත්හදා බලන බවට උතුරු කොරියාව කරන ප්‍රකාශය අමෙරිකාවට අනාගත තර්ජනයක්.

අමෙරිකාව, ජපානය හා දකුණු කොරියාව ඉල්ලා සිටියේ උතුරු කොරියාවේ දඩබ්බර ක්‍රියාව පිළිබඳ සාකච්ඡා කිරීමට එ.ජා. ආරක්ෂක මණ්ඩල රැස්වීමක් වහා ම කැඳවන ලෙස.





**ඊජිප්තු** ජාතික, 35 හැවිරිදි ඉමාන් අහමඩ් අබ්දුලාටි සැලකෙන්නේ ලෝකයේ බර වැඩි ම කාන්තාව හැටියට. ඇයගේ බර ප්‍රමාණය රාත්තල් 1100ක්. පසුගිය වසර 25 ඇතුළත කිසි දවසක නිවසින් බැහැරට ඒමට ඇයට හැකි වී නැහැ.

ඇයට මේ වන විට කිසියම් බලාපොරොත්තුවක් ඇති වී තිබෙන්නේ ඉන්දියාවේ, මුම්බායිහි සයිෆී රෝහලට ප්‍රතිකාර සහ ශල්‍යකර්ම ගණනාවක් සඳහා රැගෙන විත් තිබෙන නිසා.

එය ලෙහෙසි පහසු ගමනක් නො වුණේ ඇය රැගෙන එන්නට සිදු වුණේ බඩු ප්‍රවාහන ගුවන් යානයකට ක්‍රේන් යන්ත්‍රයක් මගින් ඔසොවා තැබීමෙන් නිසා. එමෙන් ම මුම්බායි ගුවන් තොටුපොළේදී සිදු වුණේ ද විශේෂයෙන් සකස් කළ භාණ්ඩ ප්‍රවාහන ට්‍රක් රථයකට ක්‍රේන් යන්ත්‍රයක් මගින් ම ගොඩබාන්නට.

විශේෂඥ වෛද්‍ය මුෆාසාල් ලක්දවාලා ඇතුළු වෛද්‍ය හා සෙසු කාර්ය මණ්ඩලයක් උත්සාහ දරන්නේ විස්කම් අත්හදාබැලීමක් සඳහා. ආහාර පාලන වැඩසටහනක් සහ ශල්‍යකර්ම ගණනාවක් ම ඊට ඇතුළත්. වෛද්‍ය ලක්දවාලා පවසන්නේ කෙසේ වෙතත් ඇයගේ ජීවිතය ඇත්තේ ඉතාමත් අවදානම් තත්ත්වයක බව.

කාන්තාවක් වන ඉන්දීය විදේශ ඇමැතිනි, සුෂ්මා ස්වරාජ් ලබා දී ඇත්තේ ඇයගේ ගමන සඳහා නොමඳ සහායක්.





**ඩොනල්ඩ්** ට්‍රම්ප් ජනාධිපති පදවියේ දිවුරුම් දුන් පසු ඔහු හමු වූ පළමු වැනි රාජ්‍ය ප්‍රධානියා වුණේ බ්‍රිතාන්‍ය අගමැතිනි තෙරේසා මේ. ඉතා සුහද හමුවක් වූ එයින් පසු අගමැතිනිය මාධ්‍ය හමුවේ කියා සිටියේ රුසියාවට එරෙහි ව පනවා ඇති සම්බාධක ඉවත් නො කරන බව.

කෙසේ වෙතත් ට්‍රම්ප් පසු ව කියා සිටියේ ජනාධිපති පුටින් සමග අද්භූත ආකාරයේ සබඳතා ඇති කර ගන්නා බව. සම්බාධක ඉවත් කරන්නේ දැ යි ඇසූ පැනයට ඔහුගේ පිළිතුර වුණේ "වෙන්නත් පුළුවන්, නො වෙන්නත් පුළුවන්" යන්න.

දෙසතිය
පුවත් සඟරාව
50/-
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්